# නියමුවා

ISSN 1391 - 1031
2016 අප්‍රේල්
22 වෙළුම 01 කලාපය

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

ආධාරය රු 30/=

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

"ලෝකය මුළුල්ලේම සියලුම රටවල සහ ජාතීන්ගේ නිර්ධන පංතිය සහ ඉන් අනතුරුව වැඩකරන ජනතාව, සන්ධානය සහ සමගිය සඳහා ස්වේච්ඡාවෙන්ම ප්‍රයත්නයක් දරන්නේනම් මිස, ධනපති ක්‍රමය පරදවා සම්පූර්ණ ජයග්‍රහණය අත්පත් කර ගැනීමට නොහැකි වනු ඇත."

**ලෙනින්**
**තෝරාගත් කෘති**
**වෙළුම 11**
**පිටුව 14**

**05** හිල් අමුඩෙන්...



මේ සියලු කරුණුවලින් පෙනී යන්නේ, ආණ්ඩුව රාජ්‍ය පාලනයේ තම නොහැකියාවත් තම අර්බුදයත්...

**08** 88 වසරක



ළමා අයිතිවාසිකම් ආරක්ෂා නොකරන සමාන වැඩට සමාන වැටුප් නොගෙවන, අධ්‍යාපන, සෞඛ්‍ය,...

**09** රනිල්ගේ අර්බුදය



මෙතෙක් කරගෙන ආ ආකාරයට වාණිජ වෙළෙඳපොළෙන් ණය ගැනීමටද අසීරු නම්...

**11** මොළය පාවිච්චි....



ධනවාදය තුළ බොහෝ විට මිනිසුගෙන් තර්කනය ඉවත් කෙරේ. කියන දේ පිළිගන්නා මිනිස් ප්‍රජාවක්ද,...

සංවාදය.......................... 03
තරුණ............................ 04
ආවර්ජනා........................ 06
කාන්තා........................... 10
කාලීන ........................... 12
වේදිකාව.......................... 13
විශේෂාංග........................ 14

# ජාත්‍යන්තර කම්කරු දිනය


# ඉහළින්ම සැමරීමට

# ජ.වි.පෙ. සූදානම්!

02 පිටුවට




යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!



# වැඩ බිම

## ETCA ගිවිසුමට එරෙහි වෘත්තීයවේදීහු හයිඩ් පිටියට



ඉන්දියාව සමග අත්සන් කිරීමට තීරණය වී ඇති ETCA ගිවිසුමට එරෙහිව පසුගියදා කොළඹ හයිඩ් පිටියේදී දැවැන්ත විරෝධතා රැලියක් පැවැත්විණි. ඒකාබද්ධ වෘත්තීයවේදීන්ගේ ව්‍යාපාරය මගින් සංවිධානය කෙරුණු මෙම විරෝධතා රැලිය සඳහා විවිධ වෘත්තීයවේදීන්ගේ සංවිධාන 70කට අධික ප්‍රමාණයක් නියෝජනය කරමින් විශාල පිරිසක් සහභාගී විය. ඉංජිනේරුවන්,වෛද්‍යවරුන්, නීතිඥන්, තොරතුරු තාක්ෂණවේදින්, ගෘහනිර්මාණ ශිල්පීන්, ප්‍රමාණ සමීක්ෂණ ශිල්පීන්, මානව සම්පත් වෘත්තිකයින්, ගණකාධිකාරීවරුන් ඇතුළු වෘත්තීය සංගම්, සංවිධාන මෙම ඒකාබද්ධ වෘත්තීයවේදීන්ගේ ව්‍යාපාරය හා සම්බන්ධ විය. මෙම විරෝධතා රැලියේදී අදහස් දැක්වූ ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ ලේකම් මහින්ද ජයසිංහ සහෝදරයා පැවසූයේ ETCA ගිවිසුම පරාජය කිරීමේ වගකීම වෘත්තීයවේදීන් හට පමණක් නොව සමස්ත ප්‍රගතිශීලි ජනතාවටම පැවරී ඇති බවත් පසුගිය කාලයේ අත්සන් කිරීමට උත්සාහ කළ CEPA ගිවිසුම පරාජය කළා සේම මෙම ETCA ගිවිසුමද පරාජය කරන තෙක් මෙම අරගලය හා ඒකාබද්ධ වී එයට ශක්තිය ලබාදෙන බවත්ය.

## දෛනික වැටුප රු. 1000 ක් කරනු වතු කම්කරුවෝ සටනට බසිති



වසරක් පමා කළ වතු කම්කරු සාමූහික ගිවිසුම වහා අත්සන් කරන ලෙසත් දෛනික වැටුප රු 1000ක් කරන ලෙසටත් බල කරමින් සියලු වතු කම්කරුවන් පෙළගස්වමින් ක්‍රියාමාර්ග අරඹා ඇති අතර ඒ අනුව පසුගියදා හැටන් නගරයේ උද්ඝෝෂණයක් පැවැත්විණි. සමස්ත ලංකා වතු කම්කරු සංගමය මගින් සංවිධානය කළ මෙම උද්ඝෝෂණය සඳහා ජාතික වෘත්තිය සමිති මධ්‍යස්ථානයේ සභාපති කේ.ඩී. ලාල්කාන්ත හා සමස්ත ලංකා වතු කම්කරු සංගමයේ උප සභාපති කිට්නන් සෙල්වරාජ් යන සහෝදරවරුද සහභාගි වූහ.

වර්තමාන ආණ්ඩුව බලයට පැමිණ වසරක් ඉක්ම ගොස් ඇති බවත් අගමැතිවරයා ප්‍රමුඛ ආණ්ඩුවට සම්බන්ධ වගකිවයුතු දේශපාලඥයන් විසින් පසුගිය මැතිවරණයේදී වතු කම්කරු වැටුප රු 1000කින් වැඩි කරන බවට පොරොන්දු වී මේ වන විට එය කඩ කර වතු කම්කරුවන් රවටා ඇති බවත් ජනාධිපතිවරයා, අගමැතිවරයා හෝ කම්කරු ඇමතිවරයා විසින් සාමූහික ගිවිසුම කඩිනම් කිරිම සඳහා හාම්පුතුන්ට බලකරන බවක් නොපෙනෙන බවත් ඔවුන් සියලු දෙනා එකතු වී වතු කම්කරුවන් රවටමින් සිටින බවත් පැවසූ ලාල් කාන්ත සහෝදරයා, ඉදිරියේදී මෙම වැටුප් අරගලය ජයග්‍රහණයකින් කෙළවර කර ගැනීම සඳහා වතු කම්කරුවන් ඇතුළු ක්ෂේත්‍රයේ සියලු වෘත්තිය සමිති ඒකාබද්ධ කරගත් අරගලයක් සඳහා වතු කම්කරුවන් පෙළගැසිය යුතු බවත් කියා සිටියේය.


## වෘත්තීය සමිති මර්දනය වහා නවත්වන්න වසන්ත සමරසිංහ අගමැතිට ලියයි



වර්තමාන ආණ්ඩුවේ කැබිනට් මණ්ඩල සාමාජිකයින් විසින් හොබවන අමාත්‍යාංශ යටතේ ඇති ආයතන ගණනාවක සේවකයින්ට මූලික අයිතිය පවා අහිමි කර ඇති බවත් එම ආයතනවල වෘත්තීය අයිතීන් පිළිගැනීම වෙනුවට සේවක මර්දනය දියත් කර ඇති බවත් එබැවින් මෙය වහා නැවැත්විය යුතු බවත් අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපති වසන්ත සමරසිංහ සහෝදරයා පවසයි. ලංකා හොස්පිටල්, ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලය (GOH), ලිට්රෝ ගෑස් වැනි ආයතන තුළ වෘත්තීය අයිතීන් ලබාදෙනු වෙනුවට සේවකයින් මර්දනය කිරීමට පියවර ගෙන තිබෙන බවත් මේ පිළිබඳව වහා සොයා බලා සාධාරණය ඉටු කිරීමට පියවර ගත යුතු බවත් අන්තර් සමාගම් සේවක සංගමය මගින් අගමැතිවරයා වෙත ලිපියක් නිකුත්කොට ඇත.

එම ලිපියේ වැඩිදුරටත් සඳහන් වන්නේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් රාජපක්ෂ පවුල් පාලනය ගෙදර යැවීමට කටයුතු කළ වැඩකරන ජනතාවගේ වෘත්තීය අයිතිවාසිකම් වර්තමාන ආණ්ඩුව උල්ලංඝනය කරමින් සිටීමට එරෙහිව වැඩකරන ජනතාවට පෙළගැසීමට සිදුවන බවද අසාධාරණයට පත්වූ සියලු සේවකයින්ට සාධාරණය ඉටු කර දීමට මැදිහත් විය යුතු බවත් රටේ වැඩකරන ජනතාවට හිමි ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් හා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ පිළිගත් සම්මුතීන් උල්ලංඝනය නොකර කටයුතු කළ යුතු බවය.

## පෞද්ගලික වෛද්‍ය විද්‍යාලවලට එරෙහිව පොදු මධ්‍යස්ථානයක්



මාලබේ SAITEM ආයතනයට අනුබද්ධව ආරම්භ කර ඇති පුද්ගලික වෛද්‍ය විද්‍යාලයට එරෙහි විරෝධයේ එක් ප්‍රතිඵලයක් ලෙස පෞද්ගලික වෛද්‍ය විද්‍යාල විරෝධී මධ්‍යස්ථානය බිහිකරමින් පසුගියදා එහි මාධ්‍ය හමුවක් පැවැත්විණි. එම මාධ්‍ය හමුව සඳහා වෛද්‍ය සංගම්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, වෘත්තීය සමිති නියෝජිතයන් ඇතුළ සෞඛ්‍ය සේවා නිලධාරීන් නියෝජනය කරමින් පැවැත්විණි. සමස්ත ලංකා වෛද්‍ය නිලධාරී සංගමයේ ලේකම් වෛද්‍ය ජයන්ත බණ්ඩාර, විශ්වවිද්‍යාල ආචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි, සමස්ත ලංකා හෙද සංගමයේ ලේකම් ගමිණී කුමාරසිංහ, විශ්වවිද්‍යාල ආචාර්ය විනී හෙට්ටිගොඩ, විශේෂඥ වෛද්‍ය අජිත් කුමාර, විශේෂඥ වෛද්‍ය මහිම ගුණසේකර, ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ ලේකම් සමන්ත කෝරළේආරච්චි, ජාතික විද්වත් වෘත්තික සංසදය වෙනුවෙන් තිලක් පට්ටියකුමාර, පෞද්ගලික වෛද්‍ය විද්‍යාල විරෝධී මධ්‍යස්ථානයේ සම කැඳවුම්කරු අසංග වික්‍රමසිංහ ඇතුළු සෞඛ්‍ය සේවාව නියෝජනය කරමින් වෘත්තීය සමිති නියෝජිතයෝ ගණනාවක් මේ සඳහා සහභාගි වූහ.

මෙහිදී සමස්ත ලංකා වෛද්‍ය නිලධාරී සංගමයේ ලේකම් වෛද්‍ය ජයන්ත බණ්ඩාර පැවසූයේ, මාලබේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයට එරෙහිව වෙන වෙනම අරගල කළ සියලු සංවිධාන ඒකාබද්ධ කරමින් පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය වසා දමන තෙක් අඛණ්ඩ ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කර තිබෙන බවත් ඒ අනුව ඉදිරියේදී ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කර තිබෙන බවත්ය.

# ඉතිරි

16 පිටුවෙන්

## පාලකයින්ගේ වැරදි...

පීඩාවකට පත් කරමින් ඉන්නවා.

ඇත්ත ණය ප්‍රමාණය දන්නෙ නෑ කියන රනිල් වික්‍රමසිංහගේ කථාව පට්ටපල් බොරුවක්. රනිල් වික්‍රමසිංහ පහුගිය කාලයේ හිටියේ අරලියගහ මන්දිරය ඇතුළෙ විතරද? රාජපක්ෂ ආණ්ඩුවේ ණය ගැනීම ගැන අපි ඕනෑතරම් කථාකරලා තියෙනවා. රාජපක්ෂ ආණ්ඩුව කාලේ භාණ්ඩාගාරය හා වෙනත් ආයතන මගින් ණය ලබාගත්තා. රාජපක්ෂලා පෙන්නුවේ භාණ්ඩාගාරය මගින් ලබාගත් ණය පමණයි. තෙල් සංස්ථාව, එයර්ලංකා, මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ගත් ණය වහලා තිබුණා. මේක අලුත් කථාවක් නෙමෙයි. රනිල්ගේ සූර සොයාගැනීමක් නෙමෙයි. මෙය බදු ගහපු එක වහගන්න ගොතන කථාවක් පමණයි.

ලෝක ආර්ථික අර්බුදය දැන් රනිල් වික්‍රමසිංහට අරුම පුදුම දෙයක් වුණාට ඒක ජවිපෙට පුදුමයක් නෙමෙයි. අපිට ඒ ගැන හොඳ අවබෝධයක් තිබෙනවා. 2008දී ඇ.එ.ජ. ඇතිවුණු ආර්ථික අවපාතය යුරෝපය දක්වා පැතිරෙනකොට අපි ඒ අනතුර ගැන කථා කළා. ඒ වෙලාවෙත් ගෝලීයකරණය වෙනුවෙන් පෙනීසිටි රනිල්ලා දැන් ලෝක ආර්ථික අර්බුදයක් ගැන කථාකරනවා. තමන්ගේ ආර්ථික ප්‍රතිපත්තියේ නොහැකියාව වහගන්න අද රනිල් වික්‍රමසිංහලා එක එක තාප්ප පිටුපස්සෙ හැංගෙන්න හදනවා." අනුර දිසානායක සහෝදරයා වැඩිදුරටත් පැවසීය.

## පොහොර සහනාධාරය...

කාලයේදී අලෙවි කරගැනීම වෙනුවෙන් ගොවියාට පාරට බැසීමට සිදු වී තිබෙන බවත් එය ගොවියා දුකට පත්වන කාලයක් බවට පත්වී තිබෙන බවත් පෙන්වා දුන්නේය.

"ඕනෑම රටක් තමන්ගේ රටේ කෘෂිකර්ම නිෂ්පාදනයට ධෛර්යය ලබාදෙනවා. විය යුත්තේ එයයි. සහන මිලකට පොහොර ලබා දෙනකොට ඒක නිෂ්පාදන සහනාධාරයක්. එතකොට නිෂ්පාදනයේ පිරිවැය අඩුවෙනවා. ඒ අඩුවීමේ වාසිය පාරිභෝගිකයාට ලැබෙනවා. ඒ අනුව බැලුවොත් එහි සහනය මුළු රටටම පැතිරෙනවා. මේක වී ගොවියන්ට විතරක් බලපාන ප්‍රශ්නයක් නෙවෙයි. වී, තේ, පොල්, රබර්, එළවළු ආදී සියලු ගොවීන්ට අදාළ කප්පාදුවක්. ආණ්ඩුව පොහොර සහනාධාරය කැපුවොත් හෙට එළවළු, පළතුරු, හාල් මිලදී ගන්න පාරිභෝගිකයන්ට ඒවා මිලදී ගන්න වෙන්නේ. ඉතාම ඉහළ මිල ගණන් යටතේ.

නිෂ්පාදන බිඳවැට්ටවීම සඳහා වන තමන්ගේ ඇත්ත අරමුණ සඟවමින් අද ආණ්ඩුව පොහොර සහනාධාරය කපන්න කාබනික පොහොර පිරුවටයක් විදියට පාවිච්චි කරන්න හදනවා. එහෙම නම් කාබනික පොහොර හදන්න වැඩපිළිවෙළක් නැතිව ආණ්ඩුව මෙච්චර කල් මොකද කළේ? මේක ගෙදර මල් හදන්න විකුණන කාබනික පොහොර පැකට් එක පිළිබඳ ප්‍රශ්නයක් නෙවෙයි. ගෙදර මල් පෝච්චියේ මිරිස් ගහක්, තක්කාලි පැලයක් හිටව ගන්න, බිම් මල්වලට පෝර දාන්න ග්‍රෑම් 500, කිලෝ එක විදියට කාබනික පොහොර ගන්න පුළුවන්. එහෙත් අක්කර ගණන් කුඹුරුවලට කාබනික පොහොර හදන්න වැඩපිළිවෙළක් ආණ්ඩුවට තියෙනවද?" අනුර සහෝදරයා ප්‍රශ්න කර සිටියේය.

මෙම මාධ්‍ය හමුව සඳහා සමස්ත ලංකා ගොවි ජන සම්මේලනයේ ජාතික සංවිධායක නාමල් කරුණාරත්න සහෝදරයාද එක්ව සිටියේය.

## 88 වසරක...

08 පිටුවෙන්

සබඳතාවන් ගොඩ නැගීමට අවශ්‍ය මූලික පියවර තබා තිබීමයි.

පාලමක් විනාශ කිරීම පහසු හා කෙටි කාලයකින් කළ හැකි දෙයකි. එහෙත් පාලමක් ගොඩ නැගීම දිගු කාලයක් ගතවන දුෂ්කර කාර්යයකි.

අසාර්ථක ප්‍රයත්නයක් හතරකට පසුව වුවද අප්‍රතිහත ධෛර්යයෙන් යුතුව 2013 සැප්. 02 දින ෆ්ලෝරිඩා සමුද්‍ර සන්ධිය තරණය කළ එක්සත් ජනපද පිහිනුම් ශූරිය ඩයනා නියැඩ් මා මේ මොහොතේ සිහිපත් කරමි. එකී වික්‍රමය වෙනුවෙන් අප ඇයට 2014 අගෝ. 30 වන දින විශේෂ ගෞරව පදක්කමක් පිරිනැමීමට කටයුතු කළෙමු.

මෙම වික්‍රමය අප දෙරටේ සබඳතා ගොඩනැගීම සම්බන්ධයෙන් දැවැන්ත පණිවුඩයක් ලබා දෙයි. ඉන් කියැවෙන්නේ ඇයට පුළුවන් නම් අපටද හැකි බවයි.

මා නැවත නැවතත් ජනාධිපති ඔබාමාට අප රටට පැමිණීම පිළබඳ ස්තූති වන්ත වන අතර අප දෙරටේ ජනතාවන්ගේ යහපත වෙනුවෙන් ඉදිරියේදී ද මෙම ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාමට කියුබානු ආණ්ඩුවට ඇති කැමැත්ත ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

ස්තූතියි!

## ජාත්‍යන්තර කම්කරු දිනය...

01 පිටුවෙන්

වසර 68ක ලාංකේය ධනේශ්වර පාලනයන්හි අසාර්ථකත්වය මනාව පෙන්වා දෙමින් මේ වන විට ලාංකේය ආර්ථිකය ඉතිහාසයේ ගැඹුරුතම අර්බුදයට ලක්ව තිබියෙදී සහ ගොවි, කම්කරු, ශිෂ්‍ය, තරුණ, කාන්තා ඇතුළු සියලු ජන බලවේග අතිශය පීඩාවට ලක්ව තිබියෙදී රටට නව සමාජ, ආර්ථික, දේශපාලන ගමනක් යෝජනා කරන ජනතා විමුක්ති පෙරමුණ, එළඹෙන මැයි 01වැනි දිනට යෙදෙන ජාත්‍යන්තර කම්කරු දින සැමරුම මහත් උත්කර්ෂවත් ලෙස පැවැත්වීමට කටයුතු යොදා තිබේ.

2016 වර්ෂය සඳහා වන ආණ්ඩුවේ අයවැය ඉදිරිපත් කර සම්මත කරගැනීමෙන් මාස 03ක් ඉකුත් වීමටත් පෙරාතුව එහි පුරෝකථනයන් සියල්ල අසාර්ථක වී ආර්ථික අර්බුදයක් පිළිබඳ පාපොච්චාරණයක් කිරීමට ආණ්ඩුවට සිදුවිය. එහෙත් එහිදී මෙම අර්බුදය ධනවාදයේ පොදු අර්බුදය බව සඟවා හුදු රාජපක්ෂ ආණ්ඩුවට පමණක් බැර කිරීමට මෛත්‍රී - රනිල් ආණ්ඩුව උත්සාහ කළේය. ආණ්ඩුව මහත් සේ අපේක්ෂා කළ විදෙස් ආයෝජන පිළිබඳ බලාපොරොත්තු ගෝලීය ධනවාදයේ අර්බුදය හමුවේ බිඳවැටෙමින් තිබේ. ආර්ථිකය ගොඩගැනීමේ හැකියාවක් ඇතැයි රනිල්ගේ ආණ්ඩුව සම්බන්ධයෙන් ඇතැමුන් අතර වූ විශ්වාසයද ආණ්ඩුවේ අසාර්ථක කළමනාකරණය හමුවේ වේගයෙන් බිඳ වැටෙමින් ඇත.

ආණ්ඩුව මේ අර්බුදය පියමන් කර ගැනීමට සූදනම් වන්නේ, එම අර්බුදයේ මුළු බර පීඩිත ජනතාවගේ කර මත තබමිනි. විශේෂයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අවශ්‍යතා ඉටුකිරීම වෙනුවෙන් විශ්‍රාම වැටුප්, රාජ්‍ය නිලධාරීන්ගේ වරප්‍රසාද, ගොවි ජනතාවගේ සහන, වෘත්තීය සමිති අයිතිවාසිකම්, නිදහස් අධ්‍යාපනය හා සෞඛ්‍යය කප්පාදු කරමින් යන ආණ්ඩුව ඒ හේතු නිසාම ඉන් පීඩාවට පත්වන ජන කොටස්වල බලවත් විරෝධයට ලක්වෙමින් සිටියි. මෙය වසර 68ක් පුරා මාරුවෙන් මාරුවටද මෙවර ඒකාබද්ධවද ධනපති පක්ෂ දෙකක් ආණ්ඩු බලයට පත්කර ගත් ජනතාවට තමන්ගේ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් නැවත සිතා බැලීමට කදිම අවස්ථාවක් නිර්මාණය කර දී තිබේ.

මේ තත්වය තුළ 2016 ජාත්‍යන්තර කම්කරු දිනය, පීඩාවට පත්වන සියලු ජනතා බලවේග ඒකරාශි කර ගනිමින් නව සමාජ ආර්ථික ගමනක් වෙනුවෙන් රට පෙළගැස්වීම අරමුණු කර ගත් දැවැන්ත රතු මැයි දින සමරුවක් බවට පත්කිරීමට ජනතා විමුක්ති පෙරමුණ කටයුතු යොදා තිබේ. මේ පිළිබඳව කරන ලද විමසුමකට පිළිතුරු දෙමින් ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා 'නියමුවා'ට ප්‍රකාශ කළේ, පසුගිය කාලයේ ජ.වි.පෙ. මැදිහත්වීමෙන් ග්‍රාමීය මට්ටමින් ආරම්භ කරන ලද ජ.වි.පෙ. දිරිය පුරවැසි සමිති සාමාජිකත්වයද සම්බන්ධ කරගනිමින් දැවැන්ත මැයි දින පෙළපාලියක් සහ රැලියක් කොළඹදී පැවැත්වීමට අදාළ සංවිධාන කටයුතු ජ.වි.පෙ. මේ වන විටත් අරඹා ඇති බවය. "තවත් අත්හදා බැලිය යුතු විකල්ප නැහැ. තෝරා ගැනීමට තිබෙන්නේ, රට යන විනාශකාරී ගමන සම්පූර්ණයෙන් වෙනස්, සමාජවාදී මාවතකට හැරවිය හැකි ජ.වි.පෙ. පමණයි. මේ ක්‍රමය තුළ පීඩාවට පත්වන සියලු ජනතාවන්ට අපි ජ.වි.පෙ. අභිමානවත් මැයි දින වේදිකාව අබියසට ආරාධනා කරනවා." විජිත හේරත් සහෝදරයා පැවසීය.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# ප්‍රජාතන්ත්‍රවාදයේ පුරසාරම හා යථාර්ථය

වත්මන් හවුල් පාලනය බලයට පත්වන විට ජනතාවට දුන් පොරොන්දු අතර ප්‍රධාන පොරොන්දුවක් වූයේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරන බවය. පැවති රාජපක්ෂ පාලනය ප්‍රජාතන්ත්‍රවාදය වළ දමමින් තිබූ තත්වය තුළ වත්මන් පාලකයෝ ප්‍රජාන්ත්‍රවාදයේ සටන් පාඨය තමන් බලයට ඒම වෙනුවෙන් යොදා ගත්හ; ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරන බවට පුරසරාම් දෙඩූහ. එහෙත් දැන් ඉතිහාසය පුරා සිදුවූ ලෙසම ආණ්ඩුවේ පුරසාරම හා යථාර්ථය අතර ප්‍රතිවිරෝධය මතුව තිබේ.

රටක ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික පදනම වන්නේ, (එය ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය වුවත්) මැතිවරණ නිසි ලෙස පැවැත්වීම හා මහජන කැමැත්ත සාධාරණව නිරූපනය වීමට ඉඩ දීමය. එහෙත් වත්මන් පාලනය එය නොසලකා තම පටු බල අරමුණු වෙනුවෙන් කටයුතු කිරීමට පටන් ගෙන තිබේ. ඊට එක් නිදසුනක් වන්නේ පළාත් පාලන මැතිවරණය දිගින් දිගට කල් දැමීමය.

පළාත් පාලන ආයතන යනු මහජනතාවට වඩාත්ම කිට්ටු, තම එදිනෙදා ජීවන ගැටලු හා සමීපව බැඳුණු මහජන නියෝජිත ආයතනය වේ. එහෙත් දැන් ඒවායේ මහජන නියෝජිතයින් නැත. ඒ වෙනුවට සිටින්නේ විශේෂ කොමසාරිස්වරුය. ඔවුහු ජනතාවට වගකියන මහජන ඡන්දයෙන් පත්වන අය නොවෙති. මෙම ආයතන සඳහා ඡන්දය පැවැත්වීමේ අදහසක්ද ආණ්ඩුවට නැති බව පෙනේ. වසරක් කල් දැමූ එය තවදුරටත් කල් දමමින් තිබේ. සැබැවින්ම පළාත් පාලන ඡන්දය කල් දමන්නේ, පාලන බලය සම්බන්ධ ප්‍රධාන පක්ෂ දෙක වන එ.ජා.ප.ය සහ ශ්‍රීල.නි.ප.ය මේ මොහොතේ ඡන්දයකට යාමට දක්වන බිය නිසාය. මේ පක්ෂ දෙක එකට ආණ්ඩු කරන නිසා පළාත් පාලන වැනි ඡන්දයකදී තම තමන්ගේ ඇත්ත ශක්තිය ඉන් පෙනෙනවාට දෙපාර්ශවයම කැමති නැත. මන්ද ජනතාවගේ ප්‍රතිචාර දෙපාර්ශ්වයටම හිතකර නොවන නිසා. ඊට අමතරව ශ්‍රීල.නි.ප.ය තුළ ඇති අභ්‍යන්තර ප්‍රතිවිරෝධද ඡන්ද කල්යාමට හේතුවී තිබේ.

ඡන්ද කල් දැමීම සඳහා එය සාධාරණය කර ගැනීම සඳහා ආණ්ඩුව පවසන්නේ, නව පළාත් පාලන ඡන්ද ක්‍රමයේ අඩුපාඩු ඇති බවත් කොට්ඨාස නිර්ණයේද අඩුපාඩු ඇති බවත් ඒවා නිවැරදි කොට ඡන්දය තැබීමට කිසියම් කාලයක් අවශ්‍ය බවත්ය. එහෙත් ආණ්ඩුවට පැරණි ක්‍රමයට ඡන්දය පැවැත්වීමට හැකිනම් ඉහත කරුණු බාධාවක් නොවේ. නමුත් ආණ්ඩුව, විශේෂයෙන්ම ජනාධිපතිවරයා පැරණි ක්‍රමයට ඡන්දය පැවැත්වීමට බියවී සිටී. ඒ, එම ක්‍රමය තුළ ශ්‍රීල.නි.ප.යේ වැඩි වාසිය මහින්ද පිලට ඇත්තේය යන සැකය නිසාය. මේ අතර ආණ්ඩුව අලුත් ව්‍යවස්ථාවක් හැදීමටද දැන් සූදානම් වේ. එහි ප්‍රධාන අරමුණු අතර, පවතින මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම ප්‍රමුඛ බව පෙනේ. පළාත් පාලන ඡන්දය සඳහා ඡන්ද ක්‍රමය වෙනස්කර ගත්තාක් මෙන් මහ මැතිවරණය සඳහාද කේවල ක්‍රමය ප්‍රධාන කොටගත් ඡන්ද ක්‍රමයක් හැදීමට ඔවුන් උත්සාහ කරන බව පෙනේ.

රටකට ඡන්ද ක්‍රමයක් අවශ්‍ය වන්නේ, මහජන නියෝජිත ආයතන තුළ ජනතාවගේ කැමැත්ත සාධාරණව නියෝජනය වීම සඳහාය. මහජන කැමැත්ත පාර්ලිමේන්තුව හෝ වෙනත් මහජන ආයතනයක් තුළ සාධාරණව පිළිබිඹු වීමේදී දැනට ලොව ඇති ඡන්ද ක්‍රම අතරින් වඩාත් සාධාරණ පිළිගත් ක්‍රමය වන්නේ සමානුපාතික ක්‍රමයයි. ලොව රටවල් ක්‍රමානුකූලව කේවල ක්‍රමය අතහැර සමානුපාතික ක්‍රමයට වෙනස් වෙමින් සිටී. එහෙත් ලංකාවේදී සමානුපාතික ක්‍රමය අතහැර යළි කේවල ක්‍රමයට පසුබැසීමට ජනාධිපතිවරයා ඇතුළු ආණ්ඩුව තීරණය කර තිබේ. ඒ, ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදය දීමට හෝ ඡන්දය තුළ සදාචාරය ඇතිකිරීමට නොව තම බල වුවමානාව සඳහාය.

1978දී ජයවර්ධන මහතා එතෙක් පැවති කේවල මැතිවරණ ක්‍රමය වෙනස්කර සමානුපාතික ක්‍රමය හඳුන්වා දුන්නේය. එය කළේද ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් නොව තම පක්ෂයට එම ක්‍රමය මගින් සදාකාලිකව බලයේ සිටිය හැකියැයි සිතාය. අරමුණ කුමක් වුවත් සමානුපාතික ක්‍රමය කේවල හෙවත් කොට්ඨාස ක්‍රමයට වඩා ඉදිරි පියවරකි. එහෙත් දැන් වර්තමාන පාලනය එම සමානුපාතික ක්‍රමය අතහැර යළි කේවල ක්‍රමයට පසුබැසීමට සූදානම්ය. එයද තම බල අරමුණු සඳහාය. තම දේශපාලන වාසි සඳහාය. "ශක්තිමත් ආණ්ඩුවක්" හදා ගැනීමට එය හොඳ යැයි ඔවුන් සිතන බව පෙනේ. ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරනවා වෙනුවට ආණ්ඩුව ශක්තිමත් කර ගැනීම සඳහා ප්‍රාතන්ත්‍රවාදය දුර්වල කිරීමට ඔවුන් සූදානම්ය. ඔවුන් අපේක්ෂා කරන 'ශක්තිමත් ආණ්ඩුව' යනු තනි බලයක් සහිත දරදඬු පාලනයකි. එය ප්‍රජාතන්ත්‍රවාදයට හානිකරය. එබැවින් නව ඡන්ද ක්‍රමය හැදීමේ අරමුණත් එහි භාවිතයත් ප්‍රජාතන්ත්‍ර විරෝධී වනු ඇත.

මෙහිදී දේශපාලනයේ පංති අරමුණු නොදකින, එය මතුපිටින් වියුක්ත ලෙස දකින, හුදු දේශපාලන සදාචාරය අපේක්ෂා කරන සිවිල් සංවිධාන කිහිපයක් හා ඇතැම් පුද්ගලයෝද නව ඡන්ද ක්‍රමයක් ඉල්ලති. ඒ මනාප ක්‍රමය හොඳ නැති බව කියමිනි. ඉන් දේශපාලන සදාචාරය විනාශ වන්නේ යැයි කියති. සැමවිටම මනාප ක්‍රමය අර්බුදයක් වූයේ සදාචාරයක් නැති ධනපති පක්ෂවලටය. ජ.වි.පෙ. මනාප ක්‍රමය තුළ සදාචාරවත් ලෙස ඡන්ද කරන ආකාරය පිළිබඳ ආදර්ශ දී ඇත. දැන් මනාප ක්‍රමය නිසා ඇති වන ගැටලුවට විසඳුම් ලෙස ඊටත් වඩා ගැටලු මතු කරන ප්‍රජාතන්ත්‍රවාදය අහෝසි කරන ඡන්ද ක්‍රමයකට යාමට උත්සාහ දැරීම මුග්ධකමකි.

යෝජිත නව ඡන්ද ක්‍රමය නිර්මාණය වූ පසු එය විසින් සමාජය තුළ මතු කරන ඉතාම විනාශකාරී අර්බුද පිළිබඳ ආණ්ඩුව මෙන්ම නව ඡන්ද ක්‍රමය වෙනුවෙන් පෙනී සිටින අයද සලකා බලා නැත. ඒ පිළිබඳව ඔවුන් අන්ධය. නව කොට්ඨාශ ක්‍රමය පැහැදිලිවම ප්‍රධාන පක්ෂ දෙක පමණක් ඉතිරිකර විවිධ අදහස් හා මතවාද ඇති පක්ෂ මහජන මන්ත්‍රී ආයතනවලින් පළවා හරිනු ඇත. මහජන නියෝජිත ආයතන තුළ විවිධ ජාතිකත්වයන්වල විවිධ මත දරන පක්ෂවල මතවලට ඒ ඒ අය සතු ජනතා බලයේ ප්‍රමාණයට නියෝජනය තිබිය යුතුය. සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය එයයි. එහෙත් විවිධ මත දරන, විකල්ප මත දරන පක්ෂ හා ජන කණ්ඩායම්වලට පාර්ලිමේන්තු නියෝජනය අහුරා ඔවුන් ඉන් පළවා හැර ප්‍රධාන ධනපති පක්ෂ දෙකේ ඒකාධිකාර දේශපාලනයකට පාර කපන්නේ නම් ඉන් ඇති වන ප්‍රතිවිපාකවලට මුහුණ දීමට සිදු වන්නේ සමස්ත රටටමය. රටකට මැතිවරණ ක්‍රමයක් අවශ්‍ය සියලු මතවාදයන්, අදහස් හා ජන කණ්ඩායම් ඔවුනොවුන්ගේ ප්‍රමාණයෙන් සාධාරණව පාර්ලිමේන්තුව තුළ නියෝජනය වීම සඳහාය. එහෙත් කිසියම් ඡන්ද ක්‍රමයක් එම තත්වය අහෝසි කොට ඔවුන්ගේ හඬ මහජන නියෝජිත ආයතන තුළින් පලවා හරින්නේ නම් ඉන්පසු මතුවිය හැක්කේ සමාජ පීඩාවන් වෙනත් ආකාරවලින් පුපුරා යාමකි. එය රටට හිතකර නැත. මහජන මතය සාධාරණව නියෝජනය වන ප්‍රජාතන්ත්‍රවාදී ඡන්ද ක්‍රමයක් අවශ්‍ය වන්නේ ඒ නිසාය. පාලකයන් විසින් පටු බල ලෝභය වෙනුවෙන් එය අහෝසි කිරීමට උත්සාහ දරන්නේ නම් ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් එම උත්සාහය වැළැක්විය යුතුය.

# සමාජවාදය මේ බිමේ යථාර්ථයක් කිරීම වෙනුවෙන් සටනක් තිබෙනවා



සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක
**එරංග ගුණසේකර සහෝදරයා**

***නියමුවා:- සමාජවාදී තරුණ සංගමය තමන්ගේ 03වැනි සමුළුව පැවැත්වූයේ ලාංකේය තරුණ පරම්පරාව අභියෝග රැසකට මුහුණපා සිටියෙදීයි. සමුළුවෙන් තෝරා පත්කර ගන්නා ලද නව ජාතික සංවිධායකවරයා ලෙස ඔබ මෙම තත්වය තේරුම් ගන්නේ කෙහොමද?***

***එරංග සහෝදරයා:-*** ලක්ෂ 75කට ආසන්න තරුණ තරුණියන් ප්‍රමාණයක් අපේ රටේ ජීවත් වෙනවා. ඔවුන්ගෙන් අතිවිශාල බහුතරයක් තමන්ගේ ජීවිතය සහ අනාගතය පිළිබඳ වන ප්‍රශ්නයකට මුහුණ දී සිටිනවා. රටකට "උත්තරයක්" වෙන්න ඕනා තරුණ පිරිස ඒ රටේ පාලකයන්ගේ සහ පාලන ක්‍රමයේ අසමත් බව විසින් "ප්‍රශ්නයක්" බවට පත් කරගෙන සිටිනවා. මේක ධනවාදය ක්‍රියාත්මක වන කොතැනත් පොදු අර්බුදයක්. ඒ නිසා අපේ රටේ තාරුණ්‍යය අද අභියෝග රැසකට මුහුණ දී සිටිනවා.

මූලිකවම ගත්තොත් අපේ රටේ තාරුණ්‍යයට ඔවුන්ගේ ජීවිතය ගොඩනගා ගැනීමේදී ඉතාමත්ම වැදගත් කාරණය තමයි අධ්‍යාපනය කියලා කියන්නේ. සාමාන්‍ය සමාජය තුළ වුවත් කිඳා බැසගෙන තිබෙන මතයක් තමයි "ඉගෙන ගත්තොත් අනාගතයක් තියෙනවා" කියන කාරණය. ඒ හැරුණු කොට දකුණු ආසියානු කලාපයෙන් උගත්ම තරුණ ප්‍රජාවක් සිටින්නේත් අපේ රටේයි. නමුත් අපේ රටේ වාර්ෂිකව අධ්‍යාපන ක්‍රියාවලියට එකතු වන 360,000කට ආසන්න පිරිසෙන් උසස් අධ්‍යාපන අවස්ථා හිමිවන්නේ බොහොම සුළු ප්‍රමාණයකටයි. ඒ කියන්නේ 24,000ක් තරම් පිරිසකටයි. මේ ප්‍රමාණය වාර්ෂිකව අධ්‍යාපන ක්‍රියාවලියට එක් වන්නන්ගෙන් 15න් පංගුවක් තරම් සුළු ප්‍රමාණයක්. නමුත් පැහැදිලිවම අපේ රටේ පාලකයන්ට මේ අධ්‍යාපන ගැටලුවලට උත්තර හොයන්න වුවමනාවක් ඇත්තෙ නැහැ. දශකයකට ආසන්න කාලයක් තිස්සේ තවමත් අලුතෙන් එකදු රාජ්‍ය සරසවියක් හෝ විවෘත කරන්න ඔවුන් පෙළඹිලා නැහැ.

රැකියා ප්‍රශ්නය ගත්තත් මීට දෙවැනි වන්නේ නැහැ. අද අපේ රටේ තරුණ විරැකියාව ලක්ෂ 15කට ආසන්නයි. ඒ වගේම කරන රැකියාවටත් බාධා අනන්තයි. පහුගිය කාලය තුළ අපි දැක්කා, අලුතෙන් රජයේ සේවයට යන කාට වුණත් හිමිව තිබූ විශ්‍රාම වැටුප් අයිතිය උදුරාගන්නට මෛත්‍රී-රනිල් ආණ්ඩුව කටයුතු කළ ආකාරය. දින 180න් රැකියා ස්ථිර කිරීම මගින් ජනතාවගේ රැකියා අයිතීන් තහවුරු කිරීමට ඇති ඉඩකඩ රකිනවා වෙනුවට, දින 360ක් දක්වා දීර්ඝ කරලා ඒ අයිතියත් පැහැර ගත්තා. ඒ විතරක් නෙවෙයි, එට්කා වගේ ගිවිසුම්වලට එළැඹිලා අපේ රටේ තරුණ තරුණියන්ගේ රැකියා අයිතිය අවදානමේ හෙළන්නත් පාලකයින් කටයුතු කරමින් සිටිනවා.

මීට අමතරව අද වෙනකොට අපේ රටේ තරුණ ජීවිත තියෙන්නේ කොතැනද කියලා කල්පනා කරලා බලන්න. තරුණ සියදිවි නසාගැනීම්වලින් ලෝකය පළමු ස්ථාන පහ අතර අපේ රටත් ඉන්නවා. ඒ වගේම විෂ මත්ද්‍රව්‍ය උවදුර විසින් තරුණ තරුණියන්ව ගිලගෙන තිබෙනවා. අසමානතාවය සහ විවාහයේ දී දැවැදි දීම වැනි කාරණා හරහා තරුණියන්ව පීඩාවට පත්කොට තිබෙනවා. ඒ වගේම "තරු හීන" හා භෞතිකව තමන් විතරක් ගොඩයන්න පොරකන හීන පසුපස ඔවුන්ව අතරමං කර තිබෙනවා.

සමාජවාදී තරුණ සංගමය විදියට අපි මේ අභියෝග තේරුම් ගනිමින් දිගින් දිගටම ඒවාට මැදිහත් වෙමින් ඉන්නවා. අපි 03 වන ජාතික තරුණ සමුළුව සහ එයින් පත් වී සිටින නව නායකත්ව මණ්ඩලය ලෙස ලාංකේය තාරුණ්‍යයට මේ අගාධයෙන් ගොඩ ඒම සඳහා අවශ්‍ය අත්වැල් සපයන්න නිරන්තරයෙන්ම බැඳී සිටිනවා. ඒ සඳහා ඔවුන්ට නිවැරදි මඟ කියන්නට මූලිකත්වය ගෙන ක්‍රියා කරනවා.

> ඉතිහාසයේ පටන්ම එකිනෙකාට වරද පටවා ගනිමින් නිල් කොළ ආණ්ඩු හැම එකක්ම පාහේ කළේ තාරුණ්‍යය මුළා කළ එකයි. අද වර්තමාන මෛත්‍රී - රනිල් හවුල් ආණ්ඩුව විසින් කරන්නේද එයමයි. පෙර පාලනයන් පරිද්දෙන්ම අද ඔවුන්ද ජනතාවගේ අයිතීන් උල්ලංඝනය කරමින් සිටිනවා. ජනතාවට පට් තද කරගන්න යැයි කියමින් ඩීල් දේශපාලනයක නියැලෙනවා.

***නියමුවා:- තරුණ පරම්පරාව ඔවුන්ගේ වැඩිහිටියන්ට වඩා දේශපාලනික වශයෙන් සංවේදී බවක් පෙන්නුම් කරනවා. විශේෂයෙන් සමාජජාල වෙබ් අඩවි තුළ ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය මීට නිදසුනක්. එහෙත් ඔවුන් බොහෝ දෙනා නිවැරදි දේශපාලන ස්ථාවරයන්හි සිටින බවක් ඉන් අදහස් වන්නේ නැහැ. මේ ගැන සඳහන් කළොත්.***

***එරංග සහෝදරයා:-*** පරම්පරාවෙන් පරම්පරාවට දැනුම අලුත් වෙනවා. සමාජය දෙස, ලෝකය දෙස නව ඇසකින් බලන මිනිසුන් නිර්මාණය වෙනවා. ඉතින් අපේ රටේ වුණත් වර්තමාන තාරුණ්‍යය ඔවුන්ගේ බොහෝ වැඩිටියන්ට වඩා වෙනස් විදිහට ලෝකය දෙස බලන්න හුරු වෙලා තිබෙනවා. පහුගිය කාලය තුළ අපි ඒ බව අත්වින්දා. කාගේත් අවධානයට යොමු වුණු පරිසර ප්‍රශ්නවලදී, විද්‍යා සහ සේයා වැනි දැරියන්ගේ ඝාතන සිදුවීම්වලදී ඇඹිලිපිටිය තරුණයාගේ සිද්ධියේදි වගේම කුලියාපිටිය දරුවාගේ සිද්ධියේදීත් ඔවුන් බොහෝවිට ඉතා ප්‍රගතිශීලීව මැදිහත් වුණා. විශේෂයෙන්ම කුලියාපිටිය දරුවාගේ සිද්ධිය වෙලාවෙදි අපි ඒ බව දැක්කා. ඒ වගේම කාලයක් තිස්සෙම මේ රටේ සම්පත් කොල්ලකමින් රාජ්‍ය බලය තම පවුලේ වස්තුවක් කර ගනිමින් ඉතා ප්‍රෝඩාකාරී දේශපාලනයක නියැළුණු රාජපක්ෂ පාලනය පරාජය කිරීමේ සටනේදීත් ඔවුන් පෙරමුණේම සිටියා. ඒ වගේම තමන් අතින් බලය ගිලිහී යන විට එය රැක ගැනීම වෙනුවෙන් ධනපති දේශපාලකයො ඉතා නිර්ලජ්ජිත උත්සාහයක යෙදෙනවා අපි දැක්කා. එකම රටක ජීවත් වන මිනිසුන්ගේ හදවත් නැවතත් ජාතිවාදී ගින්නෙන් අළුදූලි කරලා දාන්න එයින් දේශපාලන වාසි ගන්න බලාගෙන හිටපු ඔවුන්ට ඒක හිතපු තරම් ලේසි වුණේ නැහැ. මොකද ඒ මොහොතේදී අපේ රටේ තාරුණ්‍යයෙන් වැඩිකොටසක් මේ උත්සාහයට එරෙහිව පෙළ ගැසුණා. ඔවුන්

15 වැනි පිටුවට





**YES WE CAN**

## තාරුණ්‍යයේ ජීවිතය සහ අනාගතය උදෙසා

2015 ජනවාරි 08 වැනිදා යනු මෙරට දේශපාලන ඉතිහාසයේ සුවිශේෂී දිනයකි. එතෙක් ජනතාව පෙළමින්, රටේ සම්පත් කොල්ලකමින්, වංචාව, නාස්තිය හා දූෂණය රජයමින් ගෙන ගිය වසර දහයක රාජපක්ෂ පවුල් පාලනය නිමා කිරීම වෙනුවෙන් ජනතාව සිය ඡන්දය ප්‍රකාශ කරන ලද්දේ එදිනය. අනතුරුව එළැඹෙන ලද්දේ මහ මැතිවරණයයි. එහිදී ද ජයග්‍රහණය කරන ලද්දේ මහින්ද රාජපක්ෂ විරෝධයම වුවද එකී තීන්දුවෙන් අපේක්ෂිත ප්‍රතිඵල විඳීමට ජනතාවට හැකි වූයේ ද යන්න නම් ගැටළුවකි. මන්දයත් එක් පාලනයක් නිමා කරමින් එය ප්‍රතික්ෂේප කොට තවත් එවැනිම වූ පාලනයක් පිහිටුවා ගැනීමට ඔවුන් පෙළඹුණු නිසාවෙන්ය. කලකදී ඔවුහු නිල් පාටට රැවටුණාහ. කලකදී ඔවුහු කොළ පාටට රැවටුණාහ. දැන් නිල් කොළ හවුලට රැවටී ඇත්තේය.

රටක දේශපාලනයේ සංවේදීම කොටස වන්නේ තාරුණ්‍යයයි. රටක ජීවය වන තාරුණ්‍යයට ඉන් සිදුකෙරෙන බලපෑම අතිමහත්ය. ආණ්ඩුවක වගකීම වන්නේ එකී ජීවනාලිය වූ තාරුණ්‍යය සුරැකීමයි. නමුත් පෙර පාලනයන් විලසටම මෛත්‍රී - රනිල්ගේ නිල් කොළ ආණ්ඩුවද ගමන් කරන්නේ ඊට ඉඳුරාම වෙනස් වූ මගකය. තාරුණ්‍යයේ අයිතිවාසිකම් උදුරා ගනිමින්, සහන කප්පාදු කරමින් යන ගමනේ වෙනසක් නැත. අප කවුරුත් පාහේ දන්නා පරිදි මේ ආණ්ඩුව දැනටමත් තාරුණ්‍යයේ අයිතියක්ව තිබූ විශ්‍රාම වැටුපක් සහිතව රජයේ රැකියාවකට ඇතුළු වීමේ සහ දින 180න් රැකියාවේ ස්ථිර වීමේ අයිතිය උදුරා ගැනීමට කටයුතු කර ඇත. එසේම එට්කා ගිවිසුම හරහාද සිදුවන්නේ අපේ රටේ තාරුණ්‍යයේ රැකියා අයිතිය විශාල ලෙස අභියෝගයට ලක් කිරීමකි. ඒ ඔස්සේ එක් අතෙකින් රටේ ආර්ථිකය ඉන්දියාවට බිලි දෙන්නා සේම රටේ අනාගතය වන තාරුණ්‍යයේ අනාගතයද අනතුරේ හෙළනු ඇත.

මෙවන් පසුබිමක් යටතේ ආණ්ඩුව තම නොහැකියාව වසා ගැනීම සඳහා ජනතාවට විහිළු සපයමින් සිටී. යූ.එන්.පී. ආණ්ඩුවක් පත්වන්නේ නම් ගන්නට පුළුවන් කීවේ කාර්ය. බොහෝ තරුණ තරුණියන්ට කාර් ගන්නවා තබා මාසය අවසානයේ දී තම ආදරවන්තයා හෝ ආදරවන්තිය සමඟ චිත්‍රපටයක් නැරඹීමට යාමටවත් අමතර මුදලක් ඉතිරි කරගන්නටද ඉතා අපහසුය. ඒ සියල්ල එසේ වද්දී "තරුණ අපට ඇයි බාධා? " යනුවෙන් ලියූ බෝඩ් ලෑලි උස්සාගෙන යන්නේද යූ.එන්.පීයටම ජීවිතය ගෙවී ගිය වැඩිහිටියන්ය. තමන්ගේ දරුවන්ගේ ජීවිතවල සතුට උදුරා ගන්නා ලද මේ පාලකයන්ගේ රූකඩ බවට පත්වෙමින් මෙසේ රට හමුවේ විහිළුවක් බවට පත් වන ඔවුන් පිළිබඳව අපට නම් ඇත්තේ අනුකම්පාවකි. නමුත් තම පාක්ෂික ජනතාවද එසේ රවටමින්, විහිළුවක් බවට පත් කරන මේ පාලනයට අප එරෙහි විය යුතුමය. තම අධ්‍යාපන අයිතීන් ඉල්ලා සිටිමින් පාරට බට සිසුන්ට පොලිසිය ලවා පහර දෙන ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍රවාදය සහ යහපාලනයේ සීලවන්ත බව ඇඳි වස්ත්‍රයන් උනාදමමින් පළා ගියේය. එකම දිනයකදී කොළඹ නගරය තුළ පැවති විරෝධතා ව්‍යාපාර දෙකකි. ඉන් එකක් පළමුව ප්‍රකාශ කළ යූ.එන්.පී. පාක්ෂිකයින් සහභාගී වූවකි. එය පැවැත්වීම සඳහා යොදාගෙන තිබුණේ කොළඹ හයිඩ් පිටියය. නමුත් සිය ආණ්ඩු බලය නිසාවෙන්ම නීතිය නොසලකා හරිමින් ඔවුහු නීතිමය අවසරයකින් තොරව ලිප්ටන් වටරවුම වටා එක් වූහ. මාර්ගය අවහිර කරමින් බොරු සංදර්ශන මවමින් රටේ ජනතාව මුලා කිරීමට උත්සාහ කළේය. "තරුණ අපට ඇයි බාධා? " යනුවෙන් ලියූ බෝඩ් ලෑලි උස්සා ගත් වයසක උදවිය සිටියේ ද එහිමය. අනෙක් විරෝධතා පෙළපාලිය පැවැත්වූයේ ලාංකීය ශිෂ්‍ය ව්‍යාපාරයයි. තම අධ්‍යාපන අයිතීන් ඉල්ලා පාරට බැසීමට ඔවුන්ට සිදු වී ඇත. විශ්ව විද්‍යාල ශිෂ්‍යයා යනු මෙරට තාරුණ්‍යයේ සාරයයි. තමන්ට හිමිවිය යුතු සැබෑ අයිතීන් ඉල්ලා මහපාරට බැස අවිකට්ටේ උද්ඝෝෂණය කළ ඔවුන්ට උරුම වූයේ පොලීසියේ ගුටි බැටය.

අයිතීන් කප්පාදු කරනවා සේම තව තවත් රටේ සම්පත් නාස්ති කරමින්, කොල්ලකමින් හා රාජපක්ෂ පාලන සමයේ සිටි හොරු රකිමින් මේ නිල් කොළ හවුලෙන්ද රට විනාශය දක්වා දක්කන්නේය. එසේම රාජපක්ෂවරු ඡන්ද එකපෙළට තියූවේ ඔවුන්ගේ වාසියටය. අද මෛතී සහ රනිල් ඡන්දය කල් තබන්නේද තම තමන්ගේ දේශපාලන වාසි තකාය. ඉඳින් මේ කිසිවෙකුටත් අපේ රටේ ජනතාව පිළිබඳව හෝ රටේ ජීවය වන තාරුණ්‍යය පිලිබඳව හෝ අබමල් රොනක තරම්වත් දැක්මක් නොමැති බව සක්සුදක් සේ පැහැදිලිය. ජනතාවට පටි තදකරගන්න යැයි කීම හෝ බොරු සංදර්ශන පවත්වා රටත් ජනතාවත් අයාලේ යවනවා වෙනුවට ආණ්ඩුව තම ජනවරම පිළිබඳව කල්පනා කර බලන්නේ නම් ඉතා අගනේය. රාජපක්ෂ පාලනය විවේචනය කරමින් ජනතාවට පොරොන්දු සහ බලාපොරොත්තු දහසක් දෙමින් බලයට ආ මෙම ආණ්ඩුවට ජනවරම අමතක කර දමන්නට හෝ ඊට පිටුපාන්නට හෝ කිසිඳු අයිතියක් නැත්තේය. ජනවරමට පිටුපාන පාලකයින්ට බොහෝ කාලයක් එසේ කිරීමට අවකාශය නොලැබෙන්නේය. ඔවුන්ව පත්කළ ජනතාවම අවසන ඔවුන්ව පළවා හැරීමටද පෙරමුණ ගන්නේය. විශේෂයෙන්ම අපේ රටේ තාරුණ්‍යය ලෙස අපට පැවරී ඇති කාර්යයභාරය සුළුපටු නොවේය. එක් අතෙකින් තාරුණ්‍යයට අද දිනාගත යුතු සටනක් ඇත. ඒ තම අයිතීන් දිනා ගැනීම වෙනුවෙන් කළ යුතු සටනකි. අතීතයේ පටන්ම පැවති පාලනයන් විසින් අපට අහිමි කළ හා කරන අපේ අයිතීන් වෙනුවෙන් අප සටන් කළ යුතුමය. අරගලයෙන් තොර ජයග්‍රහණයක් නොමැති බව අප අසා ඇත්තෙමු. එසේම තාරුණ්‍යයේ ජීවිතය සහ අනාගතය උදෙසා අප විසින් සමාජවාදය ගොඩනැගිය යුතුමය. ඒ සඳහා අප දැනුමින් ද අත්දැකීමෙන් ද නිවැරදි නායකත්වයෙන් ද පන්නරය ලැබිය යුතුමය.

# ජාතික තරුණ ප්‍රඥප්තිය සිවිල් සංවිධාන අතරට

3වන ජාතික සමුළුවේදී එළිදැක්වූ ජාතික තරුණ ප්‍රඥප්තිය සිවිල් සංවිධාන අතරට පිළිගන්වන ලදී. මෙහිදී HIV/AIDS සඳහා වූ ඒකාබද්ධ වැඩසටහනේ (UNAIDS) ශ්‍රී ලංකා ප්‍රධානි වෛද්‍ය දයානාත් රණතුංග මහතාටත්, සුරක්ෂිත ශ්‍රී ලංකාවක් සඳහා පුරවැසි සංවිධානයටත් (MDDR) පිළිගන්වනු ලැබූණි. මෙහිදි ජාතික තරුණ ප්‍රඥප්තිය ඔවුන්ගේ විශේෂ ඇගයීමකට ලක්විය. මේ සඳහා සමාජවාදී තරුණ සංගමයේ නව ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා හා නව ජාතික කමිටුවේ සාමාජික සහෝදර, සහෝදරියෝ සහභාගි වූහ.





## ජාතික තරුණ ප්‍රඥප්තිය මඟින් තරුණ පරපුරට ආලෝකයක්




තරුණයා යනු ලංකාවේ මෙන්ම ලොව පුරාත් පීඩනයට හා නොසැලකිල්ලට ලක්ව ඇති ප්‍රධානතම සමාජ ස්ථරය බව ඉතා පැහැදිලිය. ස්වාධීනකම, ඍජු බව, තමා දරන මතය වෙනුවෙන් හඬා යාම හා නව අදහස් දැරීම යනු තරුණ විය තුල මතු වන පොදු ගුණාංගයන්ය. එමෙන්ම සාම්ප්‍රදායික පවුල හා සමාජය තුල අභියෝගයට ලක්වීම විසින් පොදුවේ තරුණ ප්‍රජාව තුළ පෞරුෂය බිඳවැටීම හා අපේක්ෂා භංගත්වය නිසා දක්ෂතාවලින් පිරිපුන් නවීන තරුණයෙක් බිහිවීමට එය ඍණාත්මක බලපෑමක් සිදුකරයි.

එමෙන්ම බිඳවැටෙන ධනවාදය තුළ ඔවුන්ගේ අපේක්ෂාවන් හා ජීවන පැවැත්ම බොඳවී යාම තුළ එම සමාජ ක්‍රමයට එරෙහිව කැරලි ගසා නැගී සිටීමේ ගුණය ලොව පුරා ප්‍රදර්ශනය කරමින් සුවහසක් පීඩිත ජනයාට යහපත් ලොවක් පිළිබඳ අපේක්ෂාවන් දල්වන්නේද තරුණ පරපුරයි.

මේ සියලු කරුණුවලින් අපට පෙනී යන්නේ තරුණ ප්‍රජාව යනු විශේෂ අවධානයක් යොමු කරමින් රටක අනාගත මානව හා සමාජ සංවර්ධනය වෙනුවෙන් යොදාගත යුතු හා එසේ කිරීමට හැකියාවක් පවතින බලවේග යක් බවයි.

සමාජවාදී තරුණ සංගමය විසින් තම තුන් වන ජාතික සමුළුවේදී ජාතික තරුණ ප්‍රඥප්තියක් ඉදිරිපත් කරන්නේ ඉහත දැක්වූ සමාජ ඓතිහාසික අවශ්‍යතාවය ඉටුකිරීමක් වශයෙනි. ලාංකේය තරුණ ප්‍රජාව වෙනුවෙන් කටයුතු කරන බවට ප්‍රකාශ කරන තරුණ කටයුතු අමාත්‍යංශය හෝ ජාතික තරුණ සේවා සභාව මඟින් හෝ තරුණ ප්‍රඥප්තියක් ක්‍රියාවට නොනගන මෙවන් මොහොතක එය සාධනීය පියවරකි. එමෙන්ම ලාංකීය තාරුණ්‍යයට සිය යෞවනත්වය වෙනුවෙන් ලද බලාපොරොත්තු සහගත ජීවය සපයන්නකි.

මෙම ප්‍රඥප්තිය තුළ ලාංකේය තරුණයා යනු කවරෙක්ද? යන්න පැහැදිලි කර ඇත්තේ මෙසේය.

ඒ "වයස අවුරුදු 15ත් 39ත් අතර වන රට තුළ හෝ රටින් පිටත වෙසෙන ශ්‍රී ලාංකිකයෝය" යනුවෙනි. එය ලංකාවේ දෙකෝටි දසලක්ෂයක් වන ජනගහනයෙන් 37% කි. එනම් ලක්ෂ 75කට ආසන්න පිරිසකි. ඉන් ලක්ෂ 30කට ආසන්න පිරිසක් විරැකියාවෙන් හා ඌන සේවා නියුක්තියෙන් පසු වේ.

ප්‍රඥප්තිය තුළ අන්තර්ගතව ඇති ප්‍රතිපත්තිමය ස්ථාවරයන් හා ක්‍රියාමාර්ග මත පිහිටා කටයුතු කිරීම සඳහා

* ආණ්ඩුව
* සමාජය
* පවුල
* පුද්ගලයා යන පාර්ශව බැඳී සිටී.

මෙහි අරමුණු ඉටු කිරීම ආණ්ඩුව මත පමණක් තීන්දු නොවේ. එහිදී සමස්ත සමාජයම සහ තරුණයා ජීවත් වන කුඩා කුටුම්භය වන පවුල නැමැති ඒකකයත් එලෙසින්ම පුද්ගලයාත් අත්‍යාවශ්‍යයෙන්ම සුවිශේෂී වැදගත්කමක් උසුලයි.

තරුණ ප්‍රජාව මුහුණ දෙන සකලවිධ ප්‍රශ්න විසඳීම වෙනුවෙන්, 360° Solution, ( 360° විසඳුමක් ) යන්න ප්‍රඥප්තිය තුළින් ඉදිරිපත් කිරීම හරහා ඕනෑම ගැටලුවක් විසඳීම වෙනුවෙන් අවතීර්ණ විය යුතු විද්‍යාත්මක ප්‍රවේශය කුමක්ද යන්න අපට අවබෝධ කර දෙයි.

එසේම නවීන තරුණයෙක් වීමට කැමැති ඕනෑම යෞවනයෙක්, එසේ වීමට නම්

* සම අයිතිය පිළිගන්න
* පරිසරයට ආදරය කරන
* මව්බිමට ආදරය කරන
* කාන්තා හිංසනයට එරෙහි
* විෂමත් විරෝධී

මානව ගුණාංගයන් තමා සතුකර ගන්නා ලද තරුණයෙකු විය යුතු බව වත්මන් තරුණ පරපුරට යෝජනා කරයි. අප නවීන විය යුත්තේ පෙනුමෙන් පමණක් නොව ඇතුළාන්තයෙන්ම බවත් ඉන් අවධාරණය කරයි.

සමාජවාදී තරුණ සංගමය විසින් රටට ඉදිරිපත් කළ තරුණ ප්‍රඥප්තිය තුළ අන්තර්ගතව ඇති සුවිශේෂීතම යෝජනාව වන්නේ, Youth App, (යූත් ඇප්) යන්නයි.

වත්මන් යෞවනයේ සමීපතම උපකරණය වී ඇති ජංගම දුරකථනය තුලින් ක්‍රියාත්මක කරවීමට යෝජනා කරන, Youth App, එක හරහා තරුණ ප්‍රජාව මුහුණ දෙන බොහෝ ගැටලු විසඳාගැනීම සඳහා උපකාරී වන ළඟම මිතුරෙක් බවට එය පත්කර ගත හැක. එහි ඇතුළත් "විශේෂාංග" මඟින් තරුණ තරුණියන්ට අවශ්‍ය තොරතුරු, උපදෙස්, උපදේශකයින් සම්බන්ධ කරවීම, දැනුම ලබාගැනීම, තමාට පවතින මානසික ගැටලුවකට විසඳුමක් ලබා ගැනීම, රැකියා අවස්ථා පිළිබඳ දැනුවත් වීම වැනි බොහෝ සේවා ලබා ගැනීමේ හැකියාවක් පවතී.

මෙලෙස තරුණ පරපුරට අතිශය වැදගත් ප්‍රතිපත්ති, ස්ථාවරයන් හා ක්‍රියාමාර්ග ඇතුළත් සමාජවාදී තරුණ සංගමයේ ජාතික තරුණ ප්‍රඥප්තිය හෙට දින ලාංකීය තාරුණ්‍යයට ආලෝකය සපයන ලියවිල්ලක් බවට පත්කර ගැනීම අත්‍යාවශ්‍යය වූවකි.

## පිපෙයි තව රතු එරබදු



වෙනදාට සොඳුරු වූ වසන්තය
අඳුරු විය එක් වසරෙක.....
අතුපතර ගී ගයන කොවුල් රෑන්
ගයයි දුක් ගායනා
ඇසෙන රතිඤ්ඤා හඬ වෙනුවට
හතර වටින් වෙඩි හඬයි
මහමග මරා දැමුණු
දහසක් විරු සොයුරන්ගේ
ගලාගිය රුධිරයෙන්
රත්පැහැ වේවි එරබදු මල්......
ඒත්........
මේ හැමදේම වෙනස් වුණත්
එක දෙයක් එහෙමමයි
පිපුණු රතු එරබදු
පොකුරු පරව යද්දී
ඊළඟ උදෑසන
පිපෙයි තව තවත්
රතු එරබදු.....!

(නිපුණා)

# හිල් අමුඩෙන් විළි වසා ගන්නා ආණ්ඩුව



තම පාලනයට වසරක් පිරීමටත් පෙර වත්මන් හවුල් ආණ්ඩුව සුවිශාල ආර්ථික හා දේශපාලන අර්බුදයකට මුහුණ දී සිටී. පසුගිය ඉතිහාසයක් පුරා ධනපති ක්‍රමයේ අර්බුදයට විසඳුම් සෙවීමට නොහැකි වූ සියලු ආණ්ඩු මුහුණ දුන් අර්බුදයට වත්මන් ආණ්ඩුවද මුහුණ දී සිටී. බලය ගැනීම සඳහා සමාජ අර්බුදය තම සටන් පාඨ බවට පත්කර ගත්තද ඒවාට ඔවුන් සතුව විසඳුම් නොමැති බව මේ මගින් යළි යළිත් පෙන්වා දී තිබේ.

මෙම අර්බුදයේදීද මීට පෙර පාලනයන්ගේ මෙන්ම වත්මන් ආණ්ඩුවේ ක්‍රියාමාර්ග වී ඇත්තේ, අර්බුදයේ බර ජනතාව මත පැටවීමත් වැරදි ක්‍රියාමාර්ග අනුගමනය කිරීමත් ජනතාව රැවටීමට කටයුතු කිරීමත් අර්බුදයේ තම වගකීමෙන් මිදීම සඳහා විවිධ කරුණු පිටුපස සැඟවීමට උත්සාහ කිරීමත්ය. තමන් මුහුණ දී සිටින අර්බුදයෙන් සැඟවීමටත් තම ජනතා විරෝධී ක්‍රියාමාර්ග සාධාරණීකරණය කර ගැනීමටත් මේ දිනවල ආණ්ඩුව ගන්නා උත්සාහය සම කළ හැක්කේ හිල් අමුඩයකින් විළි වසා ගැනීමට දරන උත්සාහයක් ලෙසටය.

එ.ජා.ප.ය පසුගිය කාලය පුරා රට තුළ ඇතිකළ මිත්‍යා මතයක් වූයේ, ඔවුන්ට රටේ ආර්ථිකය ගොඩගත හැකි බවත් ආර්ථික කළමනාකරණය පිළිබඳ ඔවුන් විශේෂඥයින් බවත්ය. මෙම මුසාව සමහරු විශ්වාස කළහ. එහෙත් දැන් ඊට යටින් ආණ්ඩුවේ සැබෑ නිරුවත පෙනෙන්නට පටන්ගෙන තිබේ. 2016 වසර සඳහා 2015 නොවැම්බරයේ මුදල් ඇමතිවරයා ඉදිරිපත් කළ අයවැයත් ඊට දින කිහිපයකට පෙර අගමැතිවරයා ඉදිරිපත් කළ ආර්ථික සැලැස්මත් දැන් සුණුවිසුණු වී තිබේ.

වසරක් සඳහා සකස් කළ යුතු අයවැය ලේඛනය මාස 03කින් අහෝසි වූ අතර අලුතින් බදුබර පටවමින් වැට් බද්ද 15% දක්වා වැඩිකිරීමටත් ණය සොයමින් ලොව පුරා යාමටත් ආණ්ඩුවට සිදුවිය. එහෙත් පාර්ලිමේන්තුව ඇමතූ අගමැතිවරයා අර්බුදයට හේතුව රාජපක්ෂ පාලනය විශාල වශයෙන් ණය ගැනීම හා සමහර ණය සැඟවීම බව පවසා 'රාජපක්ෂවරුන්ගේ ණයවලට' මුවාවී තම නොහැකියාව වසා ගැනීමට කටයුතු කළේය. රාජපක්ෂවරු ණය ගත් බවද රට විනාශ කළ බවද ඇත්තය. එහෙත් හවුල් පාලනය බලයට ආවේ ඒ බව දැනගෙනය. රට හදන බව කියමිනි. දැන් ඔවුහු 'රාජපක්ෂ ණය' අස්සේ සැඟවී තම බැරිකම වසා ගැනීමට උත්සාහ දරති.

ආණ්ඩුව මුහුණ දී සිටින ආර්ථික අර්බුදයට විසඳුම් ලෙස ඔවුන් ගන්නා ක්‍රියාමාර්ග වී ඇත්තේ, ජනතාව මත බර පැටවීම (බදු ගැසීම), සහන කැපීම හා ණය ගැනීමය. සහන කැපීමේදී ගොවි ජනතාවගේ පොහොර සහනාධාරය කපා දමනු ලැබීය. ඒ සමඟම විශාල ගොවිජන විරෝධයකට මුහුණ දීමට ආණ්ඩුවට සිදුවිය. ගොවි සහන කැපීම සාධාරණය කරමින් ආණ්ඩුව වහාම සැඟවීමට ආවරණයක් සොයා ගත්තේය. ඒ, "කාබනික පොහොර" නම් කඩතුරාවය. ආණ්ඩුව පොහොර සහනාධාරය කපන විට කාබනික පොහොර කථා කීවේ නැත. එවිට කීවේ පොහොර වෙනුවට පොහොර ගැනීමට මුදල් දෙන බවය. ඒ මුදල් දෙන බව කිව්වේ කාබනික පොහොර ගැනීමට නොව රසායනික පොහොර ගැනීමටය. එහෙත් ආණ්ඩුවේ ක්‍රියාමාර්ගයට දැවැන්ත විරෝධයක් එල්ල වූ විට පොහොර සහනාධාරය කප්පාදු කිරීම සාධාරණය කිරීමට ආණ්ඩුව වහාම "කාබනික පොහොර" තුළ සැඟවුණේය. ඊට කෘෂිකර්මාන්තයේ ඇත්ත ගැටලු නොදන්නා අයද දායක වූහ.

රසායනික පොහොර වස සහිත බවත් කාබනික පොහොර හොඳ බවත් ඇත්තය. එහෙත් රසායනික පොහොරවල මෙන් කාබනික පොහොර ඉක්මන් ප්‍රතිඵල ලබා දෙන්නේ නැත. ඒ නිසාම රසායනික පොහොර වෙනුවට කාබනික පොහොර යොදන්නේ නම් පළමුව කළ යුතුව තිබුණේ රසායනික පොහොර කප්පාදුව නොව කාබනික පොහොර නිෂ්පාදනය අරඹා එය වෙළඳපොළට එවා ගොවියන්ට ලබාදී ඉන්පසු ක්‍රමානුකූලව රසායනික පොහොර අඩු කිරීමය. ආණ්ඩුව කළේ එය නොවේ. ආණ්ඩුවට අවශ්‍ය වූයේ වස විස නැති කෑම දීමට හෝ කාබනික පොහොර ලබාදීමට නොව ගොවීන්ට ලබාදෙන පොහොර සහනාධාරයේ බර අඩු කර ගැනීමය. ඒ සඳහා ගත් ක්‍රියාමාර්ගයට විරෝධය එල්ල වන විට ආණ්ඩුව සැඟවීමට තැනක් සොයා ගත්තේය. ඒ, කාබනික පොහොරය. එහෙත් එයද හිල් අමුඩයෙන් විළි වැසීමක්ම විය.

ආණ්ඩුවේ බදු වැඩිකිරීමත් සමඟ පසුගියදා තිරිඟු පිටි කිලෝව රු. 7.20කින් ඉහළ ගිය අතර ඒ මත පදනම්ව

> මේ සියලු කරුණුවලින් පෙනී යන්නේ, ආණ්ඩුව රාජ්‍ය පාලනයේ තම නොහැකියාවත් තම අර්බුදයත් වසා ගැනීමට සහ තමන් ගන්නා ජනතා විරෝධී ක්‍රියාමාර්ග සාධාරණීකරණය කර ගැනීමට කුමක් හෝ 'හේතුවක්' සොයා ඒ තුළ සැඟවීමට උත්සාහ දරන බවය.

පසුව බේකරි හිමියෝ පාන් ගෙඩියේ මිල රු. 4.00කින් වැඩිකළහ. එහෙත් ඒ සමඟම මතුවිය හැකි විරෝධයෙන් සැඟවීමට මුදල් ඇමතිවරයා ආවරණයක් සෙයා ගත්තේය. ඒ, පිටි මිල වැඩි කළේ සහල් නිෂ්පාදනයට දිරි දීම සඳහාය යන බොරුවය. ආණ්ඩුවේ උපායමාර්ගය වී තිබෙන්නේම සහල් නිෂ්පාදනයට දිරි දීම නොව කෘෂිකර්මාන්තයෙන් වී වගාව ඉවත් කිරීම හෝ සීමා කිරීමය. පොහොර සහනාධාරය කපා දමන්නේත් ඉඩම් පිටරැටියන්ට ලබා දීමට යන්නේත් ඒ සඳහා නීති හදන්නේත් එම අරමුණිනි. කෘෂිකර්ම ඇමති දුමින්ද දිසානායක මහතා මෑතදී පවසා තිබුණේ වී වගාකළ ඉඩම් හෙක්ටයාර ලක්ෂ ගණනක් ඉදිරියේදී බඩඉරිඟු, සෝයා වැනි වාණිජ බෝගවලට යොදවන බවය. ආණ්ඩුවේ ඇත්ත අරමුණ එයය. එම ප්‍රකාශය හා මුදල් ඇමතිගේ ප්‍රකාශය පරස්පරය. එසේ වන්නේ, මුදල් ඇමති පිටි මිල හා පාන් මිල වැඩිකිරීම සාධාරණීකරණය කිරීමට හේතුවක් සෙවූ නිසාය. මිල වැඩිකිරීමට එරෙහිව නැගෙන ජනතා විරෝධයට මුහුණ නොදී සැඟවීමට ස්ථානයක් සෙවූ නිසාය. මුදල් ඇමතිවරයා සැඟවීමට සොයාගත් 'හේතුව' දුර්වල එකකි. ඉන් තම නොහැකියාවේ විළි වසා ගැනීමට ආණ්ඩුවට නොහැක.

ආර්ථිය තුළ පමණක් නොව දේශපාලනය තුළද ආණ්ඩුව මේ සෙල්ලම පටන්ගෙන තිබේ. ප්‍රජතන්ත්‍රවාදය ගැන පුරසාරම් දෙඩූ ආණ්ඩුව දැන් පළාත් පාලන මැතිවරණය දිගටම කල් දමමින් සිටී. ඒ, වෙන කිසිවක් නිසා නොව තම බල අර්බුදයන්ගේ දෘෂ්ටියෙන් බැලූ විට ඡන්ද අවාසි නිසාය. තම තමන්ට ලැබෙන වාසි, පාඩු මත ඡන්ද ක්‍රම සකස් කිරීමත් ඡන්ද කල් දැමීමත් ප්‍රජාතන්ත්‍ර විරෝධීය. පළාත් පාලන ඡන්ද කල් යන්නේ ඇයි? අලුත් ඡන්ද ක්‍රමයටම එය පැවැත්වීමට ජනාධිපතිවරයාට අවශ්‍ය වී තිබේ. කොට්ඨාශ ක්‍රමය ප්‍රධාන කොට පළාත් පාලන ඡන්ද සඳහා සකස් කළ නව ඡන්ද ක්‍රමය වැරදි රැසක් ඇති ක්‍රමයකි. ඒවා නිවැරදි නොකොට ඡන්දය තැබිය නොහැක. ඒ සඳහා කාලයක් ගත වේ. කොට්ඨාස නීර්ණයද වැරදිය. ඒවාද යළි සකස් කළ යුතුය. එතෙක් ඡන්ද නැතිව ජනතාව බලා සිටිය යුතුය. ඒ, පැරණි ක්‍රමයට ඡන්ද තැබීමට ආණ්ඩුව මහා බියක් දක්වන නිසාය. අනෙක් අතට නව ඡන්ද ක්‍රමය සාධාරණ ක්‍රමයක්ද නොවේ.

පළාත් පාලන ඡන්දයට සම්මත කළා මෙන්ම මහ මැතිවරණය සඳහාද කේවල මැතිවරණ කොට්ඨාස මත පදනම් වූ නව ඡන්ද ක්‍රමයක් හැදීමට දැන් උත්සාහ දරමින් සිටී. ඒ ඇයි? රට ගැන සිතා නොව තම තමන්ගේ දේශපාලන අර්බුදවලදී වාසිදායක ක්‍රමය එය යයි සිතන නිසාය. මැතිවරණවලදී වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය වන්නේ සමානුපාතික ක්‍රමයය. ලෝකයේ බොහෝ රටවල් කේවල ක්‍රමය අතහැර සමානුපාතික ක්‍රමයට යමින් සිටී. එහෙත් ලංකාවේ ආණ්ඩු තම වාසිය සඳහාම එක් අවස්ථාවක කේවල ක්‍රමය අතහැර සමානුපාතික ක්‍රමය හෝ තම වාසිය සඳහාම එය අතහැර කේවල ක්‍රමයට පසුබැසීමට උත්සාහ දරමින් සිටී. තමන් කැමති පක්ෂයක් තෝරා ගැනීමට මෙන්ම එම පක්ෂයෙන් තමන් කැමති අපේක්ෂකයෙක්ද තෝරා ගෙන ඡන්දය දීමේ අයිතිය ඡන්දදායකයාට ලැබෙන්නේ සමානුපාතික ඡන්ද ක්‍රමය තුළය. කොට්ඨාස ක්‍රමයේදී තෝරාගත හැක්කේ පක්ෂය පමණි. පක්ෂය ඉදිරිපත් කරන අපේක්ෂකයා කවුරු වුවත් ඔහුට ඡන්දය දිය යුතු වේ. ඒ අනුව වඩා ප්‍රජාතන්ත්‍රවාදී වන්නේ සමානුපාතික ක්‍රමයයි. එහෙත් එම ක්‍රමය පාලක පංතියට දැන් අවාසිය. ඒ, ඔවුන් දුර්වල නිසාය. එබැවින් තමන්ට අවාසි ක්‍රමය වෙනස්කර වාසි ක්‍රමයකට යා යුතුය. ධනපති පක්ෂ දෙක හැර අනෙක් පක්ෂ පාර්ලිමේන්තුවෙන් ඉවත් කළ යුතුය. ඒ සඳහා අලුත් ක්‍රමයක් ඔවුනට වුවමනාය. මේ සකස් කිරීමට අර අඳින්නේ එයය.

එහෙත් එම ප්‍රජාතන්ත්‍ර විරෝධී උත්සාහයෙන් අති ප්‍රතිගාමී බව සැඟවීමට ඔවුන් ආවරණයක් සොයා ගෙන තිබේ. ඒ, "මනාප ක්‍රමයේ වැරැද්දය" මනාප ක්‍රමයේ වැරැද්ද සැබැවින්ම ක්‍රමයේ වැරැද්දට වඩා තරඟ වදින පක්ෂවල හා පුද්ගලයන්ගේ වරදක් වේ. මන්ද මනාප ක්‍රමය ප්‍රශ්නයක්

15 වැනි පිටුවට



''ගම්බද පෙදෙස්වල නියෝජිත සෝවියට් සභා පිහිටුවීම, ප්‍රථමයෙන්ම, කුලී ශ්‍රමකරුවන්ගේ සහ අර්ධ-නිර්ධනයින්ගේ සෝවියට් සභා පිහිටුවීම හැකි තරම් ඉක්මනින් ආරම්භ කිරීම පිණිස කොමියුනිස්ට් පක්ෂ ඒවාට හැකි සෑම ධෛර්යයක්ම යොදා කටයුතු කළ යුතුය.''

**ලෙනින්**
**තෝරාගත් කෘති**
**වෙළුම 11 පිටු 27-28**

# එට්කාට එරෙහිව

එ.ජා.ප. ආණ්ඩුව විසින් කඩිනම් මහවැලි ව්‍යාපාරය ආරම්භ කරමින් පැවසුවේ මේ හරහා විශාල ගොවි බිම් අස්වැද්දිය හැකි බවත් එම ව්‍යාපෘතිය මගින් නිපදවෙන ජල විදුලිය ඉන්දියාවටද ලබාදිය හැකි බවත්ය. අද වන විට එම ව්‍යාපාරය ආරම්භ කර දශක තුනකට අධික කාලයක් ගත වී ඇති තත්වයක් තුළ අපට දක්නට ලැබිය හැකිව ඇත්තේ, එම මහවැලි ජනපදයන්හි අසරණ වී ඇති ගොවි පවුල් සහ ඉන්දියාවට තබා මෙරටේ සම්පූර්ණ විදුලි අවශ්‍යතාවයවත් සැපිරිය නොහැකි පාලනයකි.

ඒ, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු මහවැලි ව්‍යාපාරය ආරම්භ කිරීමේදී රට හමුවේ තැබූ සිහිනයයි. අද දවසේද එ.ජා.ප.ය එවැනි සිහිනයක ජනතාව අතරමන් කිරීමට සැරසෙමින් සිටී. ඒ, එට්කා සිහිනයයි. එදාට වඩා අද දවසේ වෙනස වී ඇත්තේ, මෙම සිහින පිටුපස එ.ජා.ප.ය සමග ශ්‍රීල.නි.ප.යද එකට සිටගෙන සිටීමයි.

මෙම සිහිනය ඉතිහාසයේදී මෙන්ම ජනතාව ඉදිරිපිට තැබූ පුස්සක් බවත් මෙම ගිවිසුම මගින් ඉන්දියාවේ ආර්ථික සහ දේශපාලන වුවමනාව ක්‍රියාත්මක වීම අනිවාර්යක් බවත් ජ.වි.පෙ. ප්‍රකාශ කර සිටී. මෙම ගිවිසුම මගින් රටට වන හානිය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා ජ.වි.පෙ. ක්‍රියා මාර්ග රැසක් ආරම්භ කර තිබේ.

මෙහි එක් ක්‍රියා මාර්ගයක් ලෙස මෙම ඉන්දු- ශ්‍රීලංකා ආර්ථික හා තාක්ෂණ සහයෝගිතා ගිවිසුම (ETCA) හරහා රටට සිදුවන හානිය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා දිවයින පුරා අත් පත්‍රිකා බෙදා හැරීමේ ව්‍යාපාරයක් පසුගිය මාර්තු 09 වෙනිදා ජ.වි.පෙ. විසින් ආරම්භ කරන ලදී. කොළඹ කොටුව දුම්රියපොළ ඉදිරිපිටින් මෙම අත්පත්‍රිකා බෙදා හැරීම ආරම්භ කරනු ලැබූ අතර මෙම අවස්ථාව සඳහා ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා, ප්‍රචාරක ලේකම් විජිත හේරත්, ජාතික වෘත්තිය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල් කාන්ත යන සහෝදරවරුද, ජ.වි.පෙ. මධ්‍යම කමිටු සාමාජිකා සමන්මලී ගුණසිංහ සහෝදරියද සහභාගි වූහ.



# ජාත්‍යන්තර සහයෝගීතාවය




ධනවාදයේ බිහිවීමෙන් පසු නිදහස් තරගය තුළ එය අර්බුදයට ගිය පසු ඒ සඳහා සොයා ගත් විසඳුම වූයේ ඒකාධිකාරී ධනවාදයයි. ඒ අනුව 19වැනි සියවස අග භාගයේදී ධනවාදය අධිරාජ්‍යවාදය දක්වා වර්ධනය විය. මෙහි මූලික ලක්ෂණයන් වූයේ, ලෝකයම සිය අණසකට යටත් කර ගත් දැවැන්ත ඒකාධිකාරී සමාගම් බිහිවීමත් භාණ්ඩ අපනයනය වෙනුවට ප්‍රාග්ධනය අපනයන කිරීම ඇරඹීම හා යටත්විජිත පවත්වා ගනිමින් ඒවා සූරාකෑමත්ය. ඒ අනුව අධිරාජ්‍යවාදී අවධියේදි යටත් කර ගත් භූමි භාගයන් නැවත නැවත බෙදා ගැනීමට අධිරාජ්‍යවාදී රටවල් විසින් කටයුතු කරන ලදී. දෙවන ලෝක මහා යුද්ධය ඇති වන්නේද එම රටවල් නැවත් වතාවක් තම වුවමනාවන් අනුව බෙදාගැනීමට යෑමේ ප්‍රතිඵලයක් ලෙසය. අද දවසේද සිරියාව වැනි රටවල සිවිල් යුද්ධ මගින් ක්‍රියාත්මක වනු ලබන්නේද එම අධිරාජ්‍යවාදී රටවල වුවමනාවය.

අධිරාජ්‍යවාදීන්ගේ වුවමනාවන් වෙනුවෙන් සිදුකරන මෙවන් යුද්ධවලට එරෙහිව ලෝකය පුරා වාමාංශික, ප්‍රගතිශීලී ව්‍යාපාර විරෝධතාවල නිරතව සිටී. පසුගිය මාර්තු 12වැනිදා ඉතාලියේ ප්‍රධාන නගරයන්හිද මෙවැනි උද්ඝෝෂණ මාලාවක් දියත් ඉතාලියේ යුධ විරෝධී ප්‍රගතිශීලී ව්‍යාපාරය විසින් සංවිධානය කර තිබුණි.

ඉතාලි ආණ්ඩුව වැඩකරන ජනතාවගේ සමාජ සුභ සාධන කප්පාදු කරමින් අධිරාජ්‍යවාදී යුද්ධයන් සඳහා යුරෝ මිලියන ගණන් ජනතා මුදල් වියදම් කිරීමට එරෙහිව මෙය ක්‍රියාත්මක විය. රෝමයේ පැවති මෙම උද්ඝෝෂණයට ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමින් එහි ඉතාලි කමිටුවේ නියෝජිතයෝ එක්ව සිටියහ. ජ.වි.පෙ. ජාත්‍යන්තරවාදී සහයෝගීතාවය දැක්වූ අවස්ථාවක් ලෙස මෙය හැඳින්විය හැක.

# සල්ලි එපා... පොහොර දියව්

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කෘෂිකර්ම ඇමති දුමින්ද දිසානායක වී වගා කරන භූමි ප්‍රමාණය අඩු කළ යුතු බව පවසද්දී එක්සත් ජාතික පක්ෂයේ වෙළඳ ඇමති රවී කරුණානායක පාන් පිටි මිල ඉහළ දමා පිටි පරිභෝජනය අඩු කර සහල් පරිභෝජනය වැඩි කළ යුතු බව පවසයි. වෙළඳ ඇමති සහල් පරිභෝජනය වැඩි කරන්නට යද්දී කෘෂිකර්ම ඇමති එය අඩු කිරීමට සැරසේ. උපන්ගෙයි අවුලකි. යහපාලන ආණ්ඩුවේ එකිනෙකා කට මැත දොඩවද්දී පොහොර සහනාධාරය ලබා ගැනීම සඳහා ගොවියෝ පාරට බැස සිටිති.

වී වගාව අහෝසි වී ආහාර භෝග පිටරටින් ආනයනය කර කුස පුරවා ගන්නට සිදුවන රටක තත්වය කෙසේ වේද? අධිරාජ්‍යවාදීන්ගේ වුවමනාව වී ඇත්තේද එයයි. තට්ටු මාරු ක්‍රමයට බලයට පත් වූ ශ්‍රීල.නි.ප., එ.ජා.ප. සෑම ආණ්ඩුවකම සැඟ වුණු න්‍යාය පත්‍රයේ එක් කාරණාවක් වූයේ මෙරටින් වී වගාව තුරන් කිරීමය.

මෙවන් සංදර්භයක් තුළ වත්මන් "යහපාලන ආණ්ඩුව"ද පොහොර සහනාධාරය අහෝසි කිරීමත් වීවලට සහතික මිලක් ලබා නොදීමත් අරුමයක් නොවේ. මන්ද පැරණි ආණ්ඩු මෙන්ම මෙයද ගරා වැටෙන ධනපති ක්‍රමය රැක ගැනීමට අධිරාජ්‍යවාදී න්‍යාය පත්‍රයන් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කර වීමට කටයුතු කරන්නන් වීමය.

තත්වයන් මෙසේ පෙළගැසේද්දී සමස්ත ලංකා ගොවිජන සම්මේලනය කප්පාදු කළ පොහොර සහනාධාරය ලබා ගැනීමටද, වී විලට සහතික මිලක් ලබා ගැනීම වෙනුවෙන්ද අරගලයකට පිවිස සිටී. ගොවිජනයාගේ අයිතිවාසිකම් දිනා ගැනීම වෙනුවෙන් ගම්දනව් කරා යමින් ගොවි ජනයා සංවිධානය කිරීමට ගොවිජන සම්මේලනය කටයුතු කරමින් සිටී.

යහපාලන ආණ්ඩුව පොහොර සහනාධාරය කප්පාදුකර ඒ වෙනුවට මුදල් ලබා දීමට කටයුතු කිරීමට එරෙහිව උද්ඝෝෂණ මාලාවක් සමස්ත ලංකා ගොවිජන සම්මේලනය විසින් දිවයින පුරා ප්‍රධාන නගරයන්හි සහ ගොවි බිම් ආශ්‍රිත පවත්වන ලදී.

පසුගිය මාර්තු 08වැනිදාද සමස්ත ලංකා ගොවිජන සම්මේලනය සහ තවත් ගොවි සංවිධාන එක්ව දඹුල්ල නගරයේ විරෝධතා පාගමනක් පවත්වා ආර්ථික මධ්‍යසථානය ඉදිරිපිට උද්ඝෝෂණයක් පවත්වන ලදී. සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ සභාපති නාමල් කරුණාරත්න, ලේකම් ටී.බී. සරත් සහෝදරයා ඇතුළුව ප්‍රාදේශීය ගොවි නායකයෝ රැසක් මෙම අවස්ථාවට සහභාගි වී සිටියහ.



# අප්‍රේල් මතක සුවඳ

හරියටම අප්‍රේල් පස්වෙනිදා මධ්‍යම රාත්‍රියට ආසන්නව තිබියදී ධනපති පංති පාලනයට එරෙහිව ලාංකේය පීඩිත පංතියෙන් එල්ල වූ දරුණුතම විරෝධය පුපුරා ගියේය. අන්ද මන්ද වූ ධනපති පාලනය බියෙන් ඇලලී ගියේ අරගලයේ දිග පළල කොතෙක් දැයි සිතා ගැනීමට ඔවුනට නොහැකි වූ නිසාවෙනි. දිවයිනේ හතර දිග්භාගයම සිසාරා විසිරී එල්ල වූ ප්‍රහාරයකින් 1971 අප්‍රේල් අරගලය සමාරම්භ විය. ලාංකේය ඉතිහාසයේ ධනපති පාලනයට එරෙහිව පීඩිත පංතිය විසින් එල්ල කරන ලද ප්‍රථම ප්‍රහාරය ඉතිහාසයේ සනිටුහන් කළේය.

ඒ තුළ අන්තර්ගත වූ පරම සත්‍යයන් හා පරමාදර්ශයන් බොහෝය. මිනිස් සමාජය තුළ සමාජ සංවර්ධනයට දැවැන්ත නායකත්වයක් සැපයූ යුග පුරුෂයෝ ලොව කලින් කල පහළ වූහ. ඒ, බොහෝ අවස්ථාවල අප දැක ඇත්තේ තනි තනි පුද්ගලයින් ලෙස තම තමන්ගේ ශ්‍රේෂ්ඨත්වය සමාජ ගත කරන ආකාරයයි. ලාංකේය ඉතිහාසය තුළද එබඳු යුග පුරුෂයෝ අපට හමුවෙති. ඒත් ඒ තනි තනි පුද්ගලයින් වශයෙනි. 70 දශකයෙහි මුල් භාගයේ ලාංකේය භූ තලය මත අපට හමුවන්නේ, එබඳු සුවිශේෂී චරිත එකක් දෙකක් නොව දස දහස් ගණනකි. ඔවුන්ගේ ඕනෑම කටුකත්වයකට ඔරොත්තු දෙන ශක්තිමත් දේහයන් තුළ අප දුටුවේ ආත්ම විශ්වාසය චිත්ත ධෛර්ය නොසැලෙන අධිෂ්ඨානය වැනි විප්ලවීය ගුණයයි.



"යුද්ධයේදී ආයුධ වැදගත් සාධකයක් වේ. එහෙත් තීරණාත්මක සාධකය නොවේ; තීරණාත්මක වන්නේ, ද්‍රව්‍ය නොව මිනිස්සුය. ශක්තියේ තරගය යුද්ධමය හා ආර්ථික බලයේ තරගයක් පමණක් නොවේ. මිනිස් බලයේ සහ චිත්ත ශක්තියේ තරගයක්ද වේ."

**මාඕ සේතුං**
**උදාත පාඨ**
**160 පිටුව**

මෙහි විශේෂත්වය වන්නේ, ජ.වි.පෙ. ආරම්භ කොට වසර 06ක් සපිරෙන්නටත් කලින් ධනවාදී පාලනයට එරෙහිව තීරණාත්මක ලෙස සටන් වැදීමට පීඩිත පංතිය සංවිධානය කළ හැකි වීමයි. 1965 ආරම්භ කළ පක්ෂය වසර 06ක් ගතවීමටත් පෙර දසදහස් ගණන් පීඩිත තරුණ ශිෂ්‍ය බලවේගයක් එකම එක යෝධ මිටකට සංවිධානය කිරීම යනු හිතාගන්නටවත් නොහැකි තරම් අරුමපුදුම කාර්යයක් විය. ජ.වි.පෙ. බිහිවීම හුදු හිතුවක්කාරී ක්‍රියාවක ප්‍රතිඵලයක් නොවන බවට හොඳම නිදර්ශනය පීඩිත තරුණ ශිෂ්‍ය බලවේග යක් එතරම් කෙටි කාලයක් තුළ දැවැන්ත සංවිධානයක් බවට ගොනු කර ගැනීමට තිබූ හැකියාවයි. 71 අරගලයේ ක්‍රියාකාරීන් නොමග ගිය පිරිසක් බවට ඒත්තු ගැන්වීමට ධනවාදී පාලනය උත්සාහ ගත් නමුත් එය එසේ නොවන බවත් ඔවුන් හොඳම හොඳ විප්ලවවාදී ජීව ගුණයෙන් පරිපූර්ණ වූ පිරිසක් බවත්, තම මව්බිමත් එහි ජීවත් වන පීඩිත ජනතාවත් වෙනුවෙන් තමන් සතු වටිනාම වස්තුව වූ තම ජීවිතය පරිත්‍යාග කොට ඉහළම ආදර්ශයක් ලබාදුන් පිරිසක් බවත් ඔප්පු වී හමාරය. එවන් පිරිසක් ගොඩනගා ගැනීමට සමත් වූ දේශපාලන ව්‍යාපාරය සැබෑ ලෙසම විප්ලවවාදී ව්‍යාපාරයක් බව අමුතුවෙන් කිව යුතු නොවේ. අප්‍රේල් අරගලයට වසර 45ක් සපිරෙන මේ මොහොතේ යළිත් වතාවක් අප්‍රේල් විරුවන් සමරනු ලබන්නේ අන් කවර හේතුවක් නිසාවත් නොව ඔවුන්ට ඉතිහාසය තුළ හිමිවිය යුතු විප්ලවීය ගරුත්වය හිමි කර දීමටය. එය කළ හැක්කේ, තම ජීවිත පරිත්‍යාග කරද්දී ඔවුන්ගේ සිත් සතන් තුළ පුරවාගෙන තිබූ ශ්‍රේෂ්ඨ අරමුණු පොළොව මත යථාර්ථයක් බවට පත්කිරීමෙන් පමණි; ඔවුන්ගේ අරමුණු හා අපේක්ෂාවන් මුදුන්පත් කිරීමෙන් පමණි.

අප්‍රේල් වීරවරයින් වීරවරියන් තම භාවිතයෙන් පෙන්වූ විප්ලවවාදී ගුණාංග අපමණය. ඒ අතරින් ඉතා වැදගත් ගුණාංගය වන්නේ, අරගලය පිළිබඳව කිසිදු දෙගිඩියාවකින් තොර අචල විශ්වාසයයි. 71 අරගලයට සම්බන්ධ වූ අයගෙන් ආරක්ෂක හමුදාවල සිටි අය හැරුණ විට සෙසු කිසිවෙක් විශේෂ ආයුධ පුහුණු ලැබූවෝ නොවූහ. එහෙත් හිස් පැරකුම් කිරි ටින් එකක් පුරවා තැනූ අත්බෝම්බයක් අතැතිව සන්නද්ධ හමුදා කණ්ඩායම් සහ පොලිස් බලකායන් ඉදිරියට ගොස් ප්‍රහාරයක් එල්ල කිරීමට තරම් ඔවුහු නිර්භීත වූහ. එසේ යෑමට ඔවුන්ගේ දෙපාවලට ශක්තිය ලැබුණේ විප්ලවවාදී ව්‍යාපාරය විසින් පුහුණු කොට ප්‍රගුණ කරන ලද මහා විනයකින් යුක්ත වීමයි. සමාජ විප්ලවයකට පණපොවන්නන් තුළ මනා හික්මීමක් සහ ඉහළම විනයක් තිබිය යුතුය. ඒ, විප්ලවවාදී ගුණය අප්‍රේල් වීරවරයින් සතුව නොඅඩුව තිබිණි. සමාජ ව්‍යාපාරයේ වත්මන් පරම්පරාව ඔවුන්ගෙන් උකහා ගත යුත්තේ ඒ විප්ලවවාදී විනයයි. අප ඔවුන්ට ගරු කරන්නේ නම්, සමාජ විප්ලවය සඳහා අත්‍යාවශ්‍ය සාධකයක් වන විප්ලවවාදී විනය ඔවුන්ගෙන් ඉගෙන ගත යුතුය. අද මුද්‍රණය කොට තාප්ප පුරා අලවන ලොකු අකුරු පෝස්ටර් මුල් වරට දිවයිනට හඳුන්වා දුන්නේ

> "ධනපති ආරක්ෂක හමුදා ඉදිරියේ තම විප්ලවවාදී ජීවගුණය වැහැරීමට ඔවුහු ඉඩ නොදුන්හ. තම පංති සගයින් කිසිවිටෙක පාවා නොදුන්නෝය. සමාජ සංවර්ධනයේ අභිවෘද්ධිය වෙනුවෙන් නොසැලී එඩිතරව ශ්‍රේෂ්ඨ විප්ලවවාදීන් ලෙස තම ජීවිත කුසුම පූජා කළෝය. සැබෑ විප්ලවවාදියෙකු තුළ මේ හැරෙන්නට තවත් අඩු කුමන ගුණාංගද?"

අප්‍රේල් වීරවරයින්ය. ඔවුන්ට පෝස්ටරයක් ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය වී නම් අතින් අඳින ලද අලංකාර දැවැන්ත පෝස්ටර් දවයිනේ හතරදිග්බාගයේම අස්සක් මුල්ලක් නැර අලවා දමා වෙලාවට වැඩ කිරීම සහ උපක්‍රමික වැඩ කලාව එක්වර පසක් කර පෙන්වීය. එය පාලකයින් තුෂ්නිම්භූත කරවූවක් විය. එහෙයින් සමාජ ව්‍යාපාරය තක්සේරු කරගැනීමට සතුරා අපොහොසත් විය.

විප්ලවවාදී සුපරික්ෂාකාරිතවය හා සහෝදරත්වය අප්‍රේල් වීරවරයින් විදහා දැක්වූ තවත් ගුණාංගයකි. ස්වයං විවේචනය හා විවේචනය ඔවුන් නොඅඩුව ප්‍රගුණ කර තිබූ හෙයින් තමන්ගෙන් සිදුවන අඩුපාඩු හා අතපසුවීම් සිදු නොවන්නටත් තම සටන් සගයින්ගේ අඩුපාඩු හා අතපසුවීම් විවෘතව පෙන්වා දී ඔවුන් නිවැරදි කර ගැනීමටත් ඔවුහු වගබලා ගත්හ. ඔවුන් තමන් තුළ පැවැති සුපරික්ෂාකාරිත්වය භාවිත කළේ ඇති තරම් අඩුපාඩු සොයා විවේචන ගෙනවිත් අන් සගයා අපහසුතාවයට පත්කිරීම සඳහා නොව ඔහු මුහුණ දෙන දුෂ්කරතා සහ ප්‍රශ්න හඳුනාගෙන තමන්ට හැකි අයුරින් තම සටන් සගයා එම තත්වයෙන් මුදා ගැනීම සඳහාය. එකම නවාතැනේ රැය ගෙවා පාන්දරම තමන්ට පැවරුණු කාර්ය වෙනුවෙන් පිටත් වෙන තම සටන් සගයා විමසා ඔහු අත මගවියදම් පවා නොතිබුණේ නම් තම වියදමට තිබූ දේ තම සගයාට දී පිටත් කර හැර ඉන් අනතුරුව තම වියදමට යමක් සොයා ගැනීමට එදා අප්‍රේල් සටන් සගයින් පුරුදුව සිටියේ තමාගේ කාර්යයත් අනෙකාගේ කාර්යයත් දෙකක් නොව එකක්ම වන බවත් දෙදෙනාගේම කාර්යයන් අවසානයේ සේවය කරන්නේ සමාජ විප්ලවය සඳහාම බවත් ඔවුන් මනාව පසක්කරගෙන සිටි නිසාවෙනි.

ඔවුහු විප්ලවය උදෙසා වැඩ කළෝය. වැඩි වැඩියෙන් වැඩ කළෝය. එහෙත් ඒ ඉවක් බවක් නැතිව වැඩ කිරීම නොවේ; ඉලක්කයක් සහිතව වැඩ කිරීමකි. කෙනෙකු විප්ලවවාදී ව්‍යාපාරය සොයාගෙන ඇගේ හැපෙන තුරු පංති සාකච්ඡා කොට දේශපාලන අවබෝධය ලබාදී සංවිධාන ගත කිරීමට ඔවුහු බලාගෙන සිටියහ. විප්ලවයට නායකත්වය දීමට හැකියාව ඇති ප්‍රබල චරිත සොයා ඉලක්ක සහගතව හඹා ගියෝය. ගම්බිම් වැඩබිම් සිසාරා පාසල්, විශ්වවිද්‍යාල සිසාරා හඹා ගොස් ඉලක්ක සහගතව එක්රැස් කරගත් ප්‍රබල සමාජ චරිත 71 අප්‍රේල් අරගලයේ පෙරමුණු බලවේගය විය. අදත් අප විසින් සොයා යා යුත්තේ සමාජය වෙනස් කිරීමේ සැබෑ වුවමනාවක් ඇති ඒ වෙනුවෙන් කැපවීමට සූදානම් එබඳු අයයි. අදත් අප හඹා යා යුතු වැඩ රටාව එයයි.

මෝස්තර සහ විලාසිතා එදත් අද මෙන් සමාජය පුරා අරක්ගෙන තිබුණි. තරුණ පරපුර ඒ තුළ වෙලී ගැලී පැටලී සිටියේය. මෝස්තර විලාසිතා පසුපස දුවන විට අයට මෝස්තර විලාසිතා මිස රටේ එදිනෙදා සිදුවන දේ හෝ රට මුහුණ දී ඇති අතුරු අන්තරා අදාළ නොවීය. ඔවුන්ගේ මනෝභාවය සැකසී ඇත්තේ, මෝස්තර හා විලාසිතාවන් මතමය. ධනවාදී පාලනයද මෙම තත්වය හොඳට අධ්‍යයනය කර ඇති එහෙයින් එකක් යල්පැන යෑමට පෙර තවත් එකක් වශයෙන් මෝස්තර විලාසිතා වෙළඳපොළට ගලා එමින් තිබේ. විශේෂයෙන්ම තරුණ පරපුර මේ පසුපස දුවන බැවින් මෙම තත්වය විප්ලවවාදී ව්‍යාපාරයකට අතිශයින්ම අහිතකර වෙයි. එහෙත් අප්‍රේල් විරුවෝ එකකට පසු එකක් වශයෙන් සමාජගත වන විලාසිතා සහ මෝස්තර වැළඳ නොගත්තෝය. ඔවුන් කොණ්ඩය හා රැවුල වැව්වේත් කැපුවේත් විටින් විට මාරුවන විලාසිතාවන්ට අනුව නොවේ; තමන්ට අනන්‍ය ක්‍රමවේදයකට අනුව පමණි. එක් එක් විලාසිතාවන්ට අනුව තමන් අඳින ඇඳුම මාරු කරන්නට ඔවුන්ට නොහැකිය. මන්ද ඔවුහු වෘත්තීය විප්ලවවාදීන් වූ හෙයින් ඔවුනට අඳින්නට ලැබුණේ කාගෙන් හෝ ලැබුණු ඇඳුමක් කැඩුමක් වන හෙයිනි.

අද මෙන් අධ්‍යාපන කව අධ්‍යාපන සම්මන්ත්‍රණ, වැඩමුළු එදා නොවීය. තිබුණේ ප්‍රාදේශීය මට්ටමින් පැවැත්වූ කඳවුරු පමණි. එහිදී මූලික අධ්‍යාපන මාතෘකා පුළුල්ව සාකච්ඡා කෙරෙුණු අතර න්‍යායික කරුණුද සාකච්ඡා කෙරුණි. ඒත් ඊටම සීමා නොවී විප්ලවවාදී සාහිත්‍ය පොත්පත්, මාක්ස් ලෙනින්වාදී න්‍යායික පොත් පත්, ඒබ්‍රහම් ටී. කොවූර්ගේ හේතුවාදී පොත්පත් මෙන්ම ආතර් සී ක්ලාර්ක්ගේ විද්‍යා පොත්පත් ආදිය ඉඩ ලද හැමවිටම පරිශීලනය කරනු ලැබිණි. එයින් ඔවුනගේ දැනුමට අභියෝග කළ හැකි කිසිවෙක් එදා නොසිටියහ. අප්‍රේල් වීරවරුන් වීරවරියන් ප්‍රගුණ කළ තවත් විප්ලවවාදී ගුණාංග බොහෝය. අප්‍රේල් සගයින් සෙසු සගයින්ට අසීමිතව ගරු කළහ. ඒ, තමා මෙන්ම ඔවුන්ද සමාජ විප්ලවය වෙනුවෙන් කැපකිරීම් කරන්නන් වූ නිසාය. මධ්‍යසාර, මත්ද්‍රව්‍ය හා දුම්පානය ඔවුහු පිළිකෙව් කළෝය. ඒ, වෙනත් කෙනෙකුගේ බලපෑමක් නිසා නොවේ. තමන් ජනතාවගෙන් යැපෙන්නන් වන හෙයින්ද ජනතාවගෙන් ලැබෙන සොච්චම් මුදලක් හෝ සමාජ විරෝධී දුරාචාර කටයුත්තකට වැය කිරීම අසාධාරණයක් වන හෙයින්ද යහපත් මනෝභාවයකින් යුක්තව සමාජ විප්ලවයට දායකත්වය ලබාදීම සඳහාද ඔවුහු ඒවා පිළිකෙව් කළහ. ධනපති ආරක්ෂක හමුදා ඉදිරියේ තම විප්ලවවාදී ජීවගුණය වැහැරීමට ඔවුහු ඉඩ නොදුන්හ. තම පංති සගයින් කිසිවිටෙක පාවා නොදුන්නෝය. සමාජ සංවර්ධනයේ අභිවෘද්ධිය වෙනුවෙන් නොසැලී එඩිතරව ශ්‍රේෂ්ඨ විප්ලවවාදීන් ලෙස තම ජීවිත කුසුම පූජා කළෝය. සැබෑ විප්ලවවාදියෙකු තුළ මේ හැරෙන්නට තවත් අඩු කුමන ගුණාංගද?

අප්‍රේල් සගයින්ගේ මේ අසීමිත විප්ලවවාදී ගුණාංග ආරක්ෂා කළ නොහැකි නිසා එදා ව්‍යාපාරය අතහැර ගිය, එයින් ඉවත් කළ, ඇතැම් විට ආරක්ෂා හමුදා හමුවේ නිවටව වැහැරුණු ඇතැමුහු අද විවිධ ධනපති ජනමාධ්‍ය මගින් 71 අරගලයේ තමන්ගේ දායකත්වය ඔසවා ගන්නටත් ඒ මගින් තමන්ට වටිනාකමක් උපයා ගැනීමටත් නිර්ලජ්ජිතව පෙළඹී සිටිති. අප්‍රේල් වීරවරුන්ගේ හා වීරවරියන්ගේ අනුපමේය විප්ලවීය ගුණාංගයන් තව තවත් ඉහළට එසවී අපට දැනෙන්නේ මේ තත්වය තුළය. ඔවුන් ගත් මග යමින් ඔවුන් පැතූ ලෝකය ගොඩනැගීම වෙනුවෙන් පෙළගැසෙන්නට අපට ආලෝකය විහිදුවන්නේ ඔවුන්ගේ ඒ උත්තුංග ගුණයන්ය; ආදර්ශයන්ය.

# 88 වසරක නිහැඬියාව බිඳී ඔබාමාගේ කියුබානු සංචාරය

ලොව පුරා ජනතාවගේ නොමඳ අවධානය දිනාගත් එක්සත් ජනපද ජනාධිපති බැරක් ඔබමාගේ ඓතිහාසික කියුබානු සංචාරය මාර්තු 22 දින අවසන් විය. එදින ඔහු කියුබානු සංචාරය අවසන් කරමින් ආර්ජන්ටිනාව බලා පිටත් විය.

වසර 88කට පසුව කියුබාවට පැමිණි ප්‍රථම එක්සත් ජනපද ජනාධිපතිවරයා ඔහුය. කියුබානු සමාජවාදී විප්ලවයේ ජයග්‍රහණයෙන් පසු එරටට පැමිණි ප්‍රථම ඇමෙරිකානු ජනාධිපතිවරයා බැරක් ඔබාමාය. දශක 05කට අධික කාලයක සිට පළුදු වී ඇති එක්සත් ජනපද - කියුබානු රාජ්‍යතාන්ත්‍රික සබඳතා යථා තත්වයට පත් කිරීම හා කියුබාව වෙත පනවා ඇති එක්සත් ජනපද ආර්ථික සම්බාධක ඉවත් කරලීම මෙම සංචාරයේ අරමුණ වීම තවත් විශේෂත්වයකි.

මෙම සංචාරය සඳහා ඔහුගේ බිරිඳ මිචෙල් ඔබමාද ඔහුගේ දූවරු දෙදෙනාද එක්සත් ජනපද කොංග්‍රස් සභිකයින් 40දෙනෙක්ද සහභාගි වූහ. මාර්තු 20වැනි දින කියුබාවට ළඟා වූ බැරක් ඔබාමා පැරණි හවානා නගරය නැරඹීමට ගිය අතර හවානා නුවර විප්ලවීය චතුරශ්‍රයේදී කියුබානු ජාතික වීරයා වන හොසේ මාටි පිළිරුවට උපහාර දැක්වීය. ඉන්පසු කියුබානු ජනාධිපති රාවුල් කැස්ත්‍රෝ සමග ද්වී පාර්ශ්වික සාකච්ඡාවක යෙදුණු ඔහු මාධ්‍ය හමුවකට මුහුණ දුන්නේය. මීට අමතරව කියුබානු - ඇමෙරිකානු ව්‍යාපාරික ප්‍රජාව ඇමතීමටද ඇලිසියා ඇලොන්නාසි රඟහලේදී කියුබානු ජනතාව ඇමතීමටද ඔහුට අවස්ථාව ලැබුණි.

සුපුරුදු පරිදි ඔබාමාගේ මෙම සංචාරය පිළිබඳ ලොව පුරා විවිධ අර්ථ කථන ඉදිරිපත් විය. විවිධ පාර්ශවයන් තම තමන්ට අවශ්‍ය පරිදි එය විග්‍රහ කරන්නට පටන් ගත්හ. මෙම සංචාරයේ අරමුණත්, එය කුමන තත්වයන් යටතේ සිදුවීද යන්නත් පිළිබඳ පැහැදිලි අදහසක් දෙරටේ නායකයන්ගේ සාකච්ඡාවලින් පසු සිදුකළ කියුබානු ජනාධිපති රාවුල් කස්ත්‍රෝගේ දේශනයෙන් ලබාගත හැකිය. පහතින් පළවන්නේ ඔහුගේ එම කථාවේ සිංහල පරිවර්තනයයි.

සුභ සන්ධ්‍යාවක්!

ජනාධිපති බැරක් ඔබාමා මහත්මයාණෙනි,

අවුරුදු 88 කට පසුව අප රටට පැමිණි ප්‍රථම එක්සත් ජනපද ජනාධිපතිවරයා ලෙස අපි ඔබ සාදරයෙන් පිළිගනිමු.

ඓතිහාසිකව, සංස්කෘතිකව හා සිතුම් පැතුම් අතින් එක්ව බැඳුණු ඇමරිකානු ජනතාව කෙරෙහි කිසිදිනෙක කිසිදු අමනාපයක් සිත්හි දරා නොගත් කියුබානු ජනතාව, අප දිවයිනේ ඔබගත කළ කෙටි කාලය තුළදී දැක් වූ ආගන්තුක සත්කාරය විශේෂයෙන් ඇගයීමට අපට අවශ්‍යයි.

ඔබගේ සංචාරය අප දෙරටේ ද්වී පාර්ශවික සබඳතා තව දුර වර්ධනයටත් අප දෙරටට පමණක් නොව කලාපීය වශයෙන්ද වැදගත් පියවරකි.

මෙය පැනමාවේදී හා නිව්යෝර්ක් නුවරදී අප පැවැත් වූ සාර්ථක හමුවීම් දෙකෙහි තවත් ඉදිරි පියවරකි.

අප දෙරට අතර රාජතාන්ත්‍රික සබඳතා යථාතත්වයට පත් කිරීම පිළිබඳ ප්‍රකාශයට පත් කර පසළොස් මසක් ඇතුළතදී එය ඉටු වී තිබේ.

අප දෙරට අතර තැපැල් සේවාව යළි ආරම්භ කළ අතර නිතිපතා ගුවන් සේවා පැවැත්වීමට අදාළ ගිවිසුමක්ද අත්පත් කරනු ලැබුවා. අප දෙරටෙහි කැමැත්ත ඇති ක්ෂේත්‍රවල සහයෝගීතාව අප පුළුල් කරගෙන තිබෙනවා. අප මුහුදු හා පරිසර ආරක්ෂක අවබෝධතා ගිවිසුමක් හා නාවුක ගමනාගමනයේදී ආරක්ෂාව පිළිබඳ ගිවිසුමක් අත්සන් කරනු ලැබුවා. අද දින අප කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරනු ලැබුවා. මීට අමතරව පිළිකා වැනි බෝ නොවන රෝගත් සිකා වැනි බෝවන රෝගත් වළකාලීමේදී හා ඒවාට ප්‍රතිකාර කිරීමේදී පුළුල් සහයෝගීතාවන් ගොඩනැගීමට දෙරටම එකඟතාවට පැමිණ සිටිනවා. එය අප දෙරටට පමණක් නොව කලාපයටම යහපත් වනු ඇත.



ආර්ථික සම්බාධක ඉවත් කිරීම උදෙසා එක්සත් ජනපද කොංග්‍රසය තවමත් අනුමැතිය දී නොමැති වුවද ජනාධිපති ඔබාමාගේ බලතල අනුව සම්බාධක ක්ෂේත්‍රයේ සිදු කරනු ලැබූ නව වෙනස්කම් විසින් කියුබානු සමාගම් හා ඇමරිකානු සමාගම් වෙළදාම් කිරීමේ හැකියාව පිළිබඳ සොයා බලමින් සිටියද එය තවමත් ප්‍රමාණවත් පරිදි සිදු නොකෙරේ. දැනට සන්නිවේදන ක්ෂේත්‍රයේ, ඖෂධ මිලදී ගනීම්, වෛද්‍ය උපකරණ සහ බලශක්ති උත්පාදන උපකරණ, පරිසර සංරක්ෂණ උපකරණ ක්ෂේත්‍රයේ වෙළදාම් කටයුතු පිළිබඳ සාකච්ඡා සිදු කෙරෙමින් පවතී. ආර්ථික සම්බාධක බවත් කළ පසු මෙය තවත් දුර යා හැකිය.

ජනාධිපති ඔබාමා හා ඔහුගේ ආණ්ඩුව ආර්ථික සම්බාධක ඉවත් කරන ලෙස දිගින් දිගටම කොංග්‍රස් මණ්ඩලයෙන් ඉල්ලා සිටී. මේ සම්බන්ධයෙන් මෑතකදී ගත් ක්‍රියා මාර්ග සාධනීය වුවද එය ප්‍රමාණවත් නැත. සම්බාධක අහෝසි කිරීම සඳහා තවදුරටත් ගත හැකි ක්‍රියාමාර්ග ගැන මෙවර හමුවේදී සාකච්ඡා කෙරුණි.

කියුබානු ජනතාවගේ සුබසාධනයට හා ආර්ථික සංවර්ධනයට ප්‍රධාන බාධාව වී ඇත්තේ සම්බාධකයි. එබැවින් දෙරට අතර සබඳතා යහපත් වීමට නම් සම්බාධක ඉවත් කිරීම අනිවාර්යය. එය කියුබාව හැර ගොස් ඇමරිකාවේ ජීවත්වන්නන්ට හා ඔවුන්ගේ පවුල්වල අයටත් වාසිදායක වනු ඇත.

සබඳතා සාමාන්‍ය අතට හැරීමට නම් එක්සත් ජනපදය විසින් නීති විරෝධීව අත්පත් කරගෙන සිටිනු ලබන ගුවන්තනාමෝ නාවුක කඳවුරද ආපසු කියුබාවට ලබා දිය යුතුය.

මේ ආකාරයෙන් අනෙක් ප්‍රතිපත්තීන්ද ක්‍රියාත්මක කළහොත් පමණි, කියුබානු හා එක්සත් ජනපද සබඳතා යථාතත්වයට පත් විය හැක්කේ. මේවාට හිලව් වශයෙන් ඉමහත් පරිත්‍යාගයෙන් ලබා ගත් ස්වාධීනත්වය හා තම ඉරණම තීරණය කිරීමට තමාට ඇති අයිතිය කියුබානු ජනතාවට අත්හැරීමට බල නොකළ යුතුයි.

එසේම කලාපීය සාමය හා ස්ථාවරභාවයට බලපෑ හැකි ජාත්‍යන්තර කරුණු සම්බන්ධයෙන්ද අප අදහස් හුවමාරු කර ගත්තා.

මා විශේෂයෙන් සැලසුම් කළද කාලය මදකම නිසා සඳහන් කිරීමට පමණක් සීමා වන මහාද්වීපයේ සාමකාමී පරිසරයට හානිකර, වෙනිසියුලාව අස්ථාවර කිරීමේ උත්සාහයද සලකා බැලිය යුතු කරුණකි. මේ ආකාරයටම අප කොලොම්බියාවේ සාම ප්‍රයත්නය ගැනත්, ගැටුම් අවසන් කිරීමට වන අපගේ උත්සාහය ගැනත් සාකච්ඡා කෙරුණි.

බොහෝ කරුණු සම්බන්ධයෙන් අප දෙරටේ දැක්ම වෙනස් නිසා අප දෙරට අතර ඇති ගැඹුරු වෙනස්කම් අතුරුදහන් නොවනු ඇත. විශේෂයෙන් දේශපාලන ක්‍රමය පිළිබඳ, ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම් ආරක්ෂා කිරීම පිළිබඳ, සමාජ සාධාරණත්වය පිළිබඳ, ජාත්‍යන්තර සබඳතා පිළිබඳ, ජාත්‍යන්තර සාමය හා ස්ථාවරත්වය පිළිබඳ අපගේ දැක්ම බොහෝ සේ වෙනස්ය.

අපි මනාව හිමිකම් ආරක්ෂා කරන්නෙමු. අපගේ විශ්වාසය අනුව සිවිල්, දේශපාලන, ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතීන් නොබෙදිය හැකි, එකිනෙක මත යැපෙන හා විශ්වීය ඒවා වේ. ළමා අයිතිවාසිකම් ආරක්ෂා නොකරන සමාන වැඩට සමාන වැටුප් නොගෙවන, අධ්‍යාපන, සෞඛ්‍ය, සමාජ ආරක්ෂණ, ආහාර සංවර්ධනය පිළිබඳ අයිතිය ආරක්ෂා නොකරන හා සහතික නොකරන ආණ්ඩුවක් මානව හිමිකම් සුරකින්නේ කෙසේ දැයි අපට තේරුම් ගත නොහැකිය.

මේ සම්බන්ධයෙන් අපට කීමට හා පෙන්වීමට බොහෝ දේ ඇත. ඒ නිසා ජනාධිපතිතුමනි, මා ඔබට නැවත නැවතත් තහවුරු කරනුයේ ආරම්භ කරන ලද අපගේ සංවාදය පවත්වාගෙන යාමට අපගේ කැමැත්තයි.

අපගේ සබඳතා යථා තත්වයට පත් කර ගැනීමට ගත් තීරණය ප්‍රකාශයට පත් කළ 2014 දෙසැ. 17වැනි දින මා මෙසේ කීවෙමි. අප අපගේ වෙනස්කම් සහිතව ශිෂ්ට සම්පන්න ආකාරයෙන් ජීවත් වීමේ කලාව උගත යුතු වෙමු.

එසේම 2015 ජූලි 15 වන දින මා අපගේ පාර්ලිමේන්තුවේදී මෙසේ ප්‍රකාශ කළෙමි. වෙනස් කළ යුතු සියලු දේ වෙනස් කිරීම කියුබානුවන්ගේ නිදහස් හා අනිවාර්ය වගකීමයි. වෙනස්කම් පවතිද්දීම ඒවා අභිභවමින් දෙරටම සහයෝගිත්වයෙන් එක්ව පැවතීමට හැකි බව, එකිනෙකාට වාසි ගෙනදෙමින් තහවුරු කරමින් සබඳතා යථා තත්වයට පත් කිරීම වෙත පිය මැනීම විප්ලවීය ආණ්ඩුවේ බලාපොරොත්තුවයි.

මම අද සහතික කොට කියනවා, අප අපගේ වෙනස්කම් පිළිගනිමින් හා ඒවාට ගරුකරමින් ඒවා අපගේ සම්බන්ධයේ කේන්ද්‍රය බවට පත් කර නොගනිමින්, නමුත් අප වෙන්කරන්නේ කුමකින්ද යන්න නොව අප එක් කරන්නේ කුමකින්ද යන්න පිළිබඳ අවධානය යොමු කරමින් අප දෙරටේ හා ජනතාවන්ගේ යහපත හා කැමැත්ත වැඩි දියුණු වන පරිදි ශිෂ්ට සම්පන්න ලෙස එක්ව ජීවත් වීමේ කලාව ප්‍රගුණ කළ යුතුයි.

අප ඉදිරියේ ඇත්තේ දිගු හා සංකීර්ණ මාවතක් බව අපි පිළිගනිමු. නමුත් වැදගත් දෙය වන්නේ කියුබාව හා එක්සත් ජනපදය අතර මින් පෙර නොවූ නව ආකාරයේ

02වැනි පිටුවට

## ජපාන හමුදා විදෙස් ආක්‍රමණවලට




ජපානයේ වත්මන් අගමැති ෂින්සෝ අබේගේ නව ආරක්ෂක නීතිවලට එරෙහිව ප්‍රබල විරෝධයක් මතුව තිබේ. 37,000කට අධික ජපන් ජාතිකයින් පිරිසක් පසුගිය මාර්තු 19වැනි දින ටෝකියෝ නුවරට රැස් වී ජපානයේ නව ආරක්ෂක නීති වහාම ඉවත් කර ගන්නා ලෙස බලකරමින් උද්ඝෝෂණයේ යෙදුණහ. අබේ පාලනය හඳුන්වා දුන් නව නීතිය ක්‍රියාත්මක වීමට නියමිතව තිබුනේ එදින සිටය.

ජපානයේ ඉහළම නීතිය වන ෆැසිෆිස්ට් ව්‍යවස්ථාවට අනුව ජපානයේ ස්වයං ආරක්ෂක හමුදාව එරටින් පිටත සිදුවන ගැටුම් සඳහා මැදිහත් කළ නොහැකිය. එපමණක්ද නොව වෙනත් පාර්ශවයන් සමඟ පොදු ආරක්ෂක පියවරයන් ගැනීමටද ස්වයං ආරක්ෂක හමුදාවට ඉන් ඉඩ ලබා නොදේ.

එහෙත් ෂින්සෝ අබේ පාලනය නව නීති සකසා ඇත්තේ ජපානයට බලපෑමක් නොවන, වෙනත් රටක සිදුවන්නා වූ සන්නද්ධ ගැටුම් සඳහා වුව ද ස්වයං ආරක්ෂක හමුදාව මැදිහත් කිරීමට ඉඩකඩ ලැබෙන පරිදිය. ජපානයේ ස්වයං ආරක්ෂක හමුදාව වෙනත් රටක සිදුවන ගැටුම් සඳහා මැදිහත් කිරීමට මේ අයුරින් ඉඩකඩ ලබා දෙන්නේ අවුරුදු 70කට පසුවය.

## සිරියාව ත්‍රස්ත බලය බිඳ ඉදිරියට




සිරියාවේ ISIS ත්‍රස්තවාදීන්ට දරුණු පරාජයක් ගෙන දෙමින් සිරියානු හමුදා විසින් මාර්තු 19වැනි දින සිරියාවේ ඉපැරණි නගරයක් වන පැල්මයිරා නගරය ත්‍රස්තවාදීන්ගෙන් මුදා ගැනීමට සමත් විය. මේ සඳහා සිරියානු හා රුසියානු ගුවන් හමුදා සහය සිරියානු හමුදාවන්ට ලබා ලැබිණි.

පැල්මයිරා නගරය ISIS ත්‍රස්තවාදීන් අතට පත් වුයේ පසුගිය වසරේ මැයි මාසයේ දීය.

මේ වන විටත් සිරියානු අර්බුදය විසඳිම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මැදිහත්වීමෙන් ජිනිවා නුවර දී සාම සාකච්ඡා පැවැත්වෙමින් තිබේ. මෙම සාම සාකච්ඡාවලට සිරියාවේ ආණ්ඩුව හොබවන බෂාර් අල් අසාද් පාලනයේ නියෝජිතයින් හා පොදු විපක්ෂයේ නියෝජිතයෝ සහභාගි වෙති. ISIS ත්‍රස්තවාදීන් හෝ Al Nusra ත්‍රස්තවාදී කණ්ඩායම් ඊට සහභාගී කරවා නොගැනේ.

සාම සාකච්ඡාවල සාර්ථකත්වය වෙනුවෙන් තම කැපවීම පෙන්වමින් රුසියාව සිය ගුවන් හමුදා ප්‍රහාර නවත්වා දැමීය. එහෙත් ත්‍රස්තවාදී සංවිධාන දෙකක් වන ISIS හා Al Nusra සංවිධානවලට එරෙහිව ප්‍රහාරවලට අවශ්‍ය ගුවන් සහය ලබාදීමට දිගටම සිදු කෙරේ.

පැල්මයිරා නගරය අත්පත් කර ගැනීමෙන් පසු මේ වන විට සිරියානු හමුදා ISIS ත්‍රස්තවාදීන්ගේ මූලස්ථානය වන හා සිය අගනගරය ලෙස ප්‍රකාශයට පත් කර ඇති අල් රක්බා නගරය අත්පත් කර ගැනීම උදෙසා ඉදිරියට යමින් සිටිති.

## කියුබාව 07වැනි සමුළුවට සූදානම් වෙමින්

කියුබානු කොමියුනිස්ට් පක්ෂයේ 07වැනි සමුළුව අප්‍රේල් මස 16වැනි දින සිට 19වැනි දින දක්වා පැවැත්වීමට නියමිතය. එහිදී 2015 වසරේදී හඳුන්වා දුන් නව සමාජ ආර්ථික සැලැස්මේ සාර්ථකත්වය පිළිබඳ වන ඇගැයුම් වාර්තාව ඇතුළු වැදගත් ලේඛන හයක් සාකච්ඡාවට ගැනීමට නියමිතව ඇත.

මෙම සමුළුව සඳහා සහභාගි වන නියෝජිතයින් බිම් මට්ටමේදී ප්‍රජාතන්ත්‍රවාදී ලෙස තෝරාපත් කර ගැනුණි. ඉන් 43%ක් කාන්තා නියෝජිතයෝ වෙති. සමුළුවට සහභාගීවන පක්ෂ සාමාජිකයින්ගෙන් 55දෙනෙකු වයස අවු 35ට අඩු අය වෙති.

# රනිල්ගේ අර්බුදය සහ රටේ ආර්ථික අර්බුදය



පසුගිය මාර්තු 08 වැනිදා පාර්ලිමේන්තුව හමුවේ විශේෂ ප්‍රකාශයක් කළ අග්‍රමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා රටේ ආර්ථිකය උගුලක පැටලී ඇති බවත් නමුත් මරණාසන්න නොමැති බවත් පැවසීය. එම නිසා මෙම වසර අසීරුවෙන් ගෙවා ගත යුතු බවත්, ඒ සඳහා ජනතාව පටි තදකර ගත යුතු බවත් අවධාරණය කරන ලදී. පටි තද කර ගැනීමට අකමැති ජනතාවට තිත්ත බෙහෙත් පෙවිය යුතු යැයි අගමැති රනිල් වික්‍රමසිංහ විසින් අවධාරණය කරන ලදී. අගමැතිවරයාගේ මුළු කතාවම ආර්ථික විග්‍රහයකට වඩා ආර්ථික අඳෝනාවක් ලෙස තේරුම් ගැනීම, තත්වය හොඳින් වටහා ගැනීමට පහසු කරවයි.

රනිල් මෛත්‍රී හවුල් පාලනයට පෙර පැවති රාජපක්ෂ පවුල් පාලනය ගැන විග්‍රහයක් කරමින් රනිල් වික්‍රමසිංහ මහතා පාර්ලිමේන්තුවට ප්‍රකාශ කළේ, රටේ සියලු සාරය පවුලක් වටා ගොනුකොට වරප්‍රසාද, ප්‍රතිලාභ සහ ආදායම ජනතාවගෙන් 01%කට පමණක් සීමාවන ක්‍රමවේදයක රට පාලනය කළ නිසාත් ණය ගෙවීමට තවත් ණය ගැනීමත් ඒ සියල්ලටම පොලී ගෙවීමත් නිසා රටේ බහුතර ජනතාව පීඩා විඳි බවයි. රටේ අනාගතය අඳුරු වී එක පවුලක් රජ වූ බව ඔහුගේ පැහැදිලි කිරීම විය.

එසේම ඔහු ණය ගැනද පැවති තත්වය 'මහා විශ්ලේෂණයක්' පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේය. ඔහුගේ ලේඛනයට අනුව 2015 අවසාන වන විට ගෙවිය යුතු මුළු රාජ්‍ය ණය රුපියල් බිලියන 8475කි. එය දළ දේශීය නිෂ්පාදනයෙන් 74.9%කි. එසේම 2016 වසර අවසානයේ (එම වසරට අදාළව) ගෙවිය යුතු වසරේ ණය සේවා ගෙවීම් රුපියල් බිලියන 1209කි. එයින් බිලියන 647ක් ණය ආපසු ගෙවීමටද රුපියල් බිලියන 562ක් ණය සඳහා වාර්ෂික පොලී ගෙවීමටද වේ.

අගමැතිවරයා මෙතෙක් රටේ කිසිවක් නොදත් හෙළිදරව්වක් පාර්ලිමේන්තුවට අනාවරණය කරන සෙයියාවෙන් ඊළඟට ගෙනහැර දැක්වූයේ, ජාතික පද්ධතියට මෙතෙක් ඇතුළත් කර නොමැති රාජ්‍ය ව්‍යවසායයන් විසින් ගෙවීමට ඇති ණය පිළිබඳවයි. ඔහුගේ 'සොයා ගැනීම' අනුව එම ප්‍රමාණය රුපියල් බිලියන 1042.9කි. රනිල් වික්‍රමසිංහ විශ්ලේෂණය අනුව එම ණය රැගෙන ඇත්තේ රාජපක්ෂ රෙජීමය පිම්බීම සඳහාය. ඔහුගේ විග්‍රහයට අනුව රාජපක්ෂ රෙජිමයේ හිතුවක්කාරී තීරණ නිසා රට ණය උගුලක හිර වී ඇත. දැනට ගෙවිය යුතු මුළු ණය බර රුපියල් ට්‍රිලියන 9.5ක් පමණ වේ. (බිලියන 9500කි.) මේ සියල්ල ඇත්තය. ඇත්තම ඇත්ත නම් ණය බරෙහි ඉලක්කම මීටත් වඩා වැඩි වන බවය. නමුත් මේ කිසිදු තොරතුරක් රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේ විශ්ලේෂණ බුද්ධිය නිසා අලුතින් හඳුනාගත් දත්ත - තොරතුරු නොව පාර්ලිමේන්තුවේ අවස්ථා කිහිපයකදීම සාකච්ඡාවට ලක් වූ සාමාන්‍ය කරුණුය. අගමැතිවරයා විසින් සිදු කළේ, ආර්ථිකයේ සත්‍යම අර්බුදය ජනතාව හමුවේ ගෙන හැර දක්වා ඒ අර්බුදයට කෙටි කාලීන සහ දිගු කාලීන විසඳුම් සොයන සැලැස්මක් රට හමුවේ, ජනතාව හමුවේ තැබීමක් නොව, 'තමන්ගේ අර්බුදය' බේරා ගැනීමට රටේ අර්බුදය කියාපෑමය. අප සිදු කළ යුත්තේ, රනිල්ගේ අර්බුදය සහ රටේ අර්බුදය හරියට කිරා මැන බලා තේරුම් ගැනීමය. රටේ අර්බුදයේම කොටසක 'රනිල් අර්බුදයද' ඇති බව අපට පැහැදිලිය. නමුත් ඒ නිසා රනිල්ගේ අර්බුදය විසඳාගැනීමට රටේ අර්බුදය යොදා ගැනීමට ආණ්ඩුවට ඉඩදිය යුතු නොවේ. රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා පසුගියදා (මාර්තු 08) විශේෂ ප්‍රකාශයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරමින් අවසානයේ බලාපොරොත්තු වූයේ, රටේ අර්බුදයෙන් 'රනිල් අර්බුදයට' උත්තර සොයා ගැනීමට උත්සාහ කිරීමකි.

> ඒ අනුව කාරණය නිශ්චිතය. මෙතෙක් කරගෙන ආ ආකාරයට වාණිජ වෙළෙඳපොළෙන් ණය ගැනීමටද අසීරු නම් සෙවීමට ඇති එකම පිළිතුර ජනතාවට බර පැටවීම සහ බර සැහැල්ලුවට ජනතාවට දී තිබූ සහන ඉවත් කිරීමය. අද සිදු කරමින් සිටින්නේ එම කටයුතුය.

රටේ අර්බුදය ගැඹුරින් විග්‍රහ කරගත යුතු කරුණකි. නමුත් 'රනිල් අර්බුදය' සරලවම තේරුම්ගත හැකිය. රනිල් වික්‍රමසිංහ මහතාට තනි 2/3ක බලයක් සහිත ආණ්ඩු බලයක් මේ වත්මන් පාර්ලිමේන්තුව තුළ නොමැත. ඔහුට ඇත්තේ අටවාගත් තාවකාලික බලයකි. ඔහු හමුවේ ඇති ප්‍රබලම අභියෝගය මෙම බලය ස්ථාවර කර ගැනීමය. ඒ සඳහා ආණ්ඩුවේම කොටස්කාර පාර්ශ්වයක් වන ශ්‍රීලනිපය ඔහුට අභියෝගයකි. එක් පැත්තකින් ආණ්ඩුවේ පාර්ශ්වකරුවන් ලෙස ඔවුන් පෙනී සිටියත් ඔවුන් උත්සාහ කරන්නේ ආණ්ඩුව තුළින්ම රනිල් අභිබවමින් ඉදිරියට ඒමටය. අනෙක් අතට එදා වේල අහිමි වූ යාචකයාගේ මට්ටමට ඇද වැටුණු රාජපක්ෂ කල්ලියේ ක්‍රියාමාර්ගයන්ය. ඒවාද රනිල්ට මේ මොහොතේ තාවකාලික හෝ අර්බුදයන්ය. ඊළඟට ජවිපෙ ඇතුළු සැබෑ විපක්ෂයේ බලවේග සහ ආණ්ඩුව පිහිටුවීමට දායක වූ ප්‍රගතිශීලී බලවේග ආණ්ඩුවේ ක්‍රියාමාර්ග අනුමත නොකරමින් සිදු කරන බලපෑමය. මේ සියල්ලටම වඩා ජනතාවට දුන් "මාස 60 - අලුත් රටක්" සිහින කන්දය. පවතින ණය බර රාජපක්ෂලා ගත්තද ඉතිහාසයේ වික්‍රමසිංහලා හවුල් හා තනිව පාලනය කළ එ.ජා.ප. පාලනයක් ගත්තද ඒවා ගෙවිය යුතුමය. දැනට පවතින ණය බර රුපියල් බිලියන 9500ක් බව නොදැන රනිල් වික්‍රමසිංහලා ඇතුළු හවුල් පාලනය රට බාර ගත්තා නොවේය. අද පාර්ලිමේන්තුවේ රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා වමාරන සියලු අර්බුද ඔවුහු හොඳින් දැන දැනම ජනතාවට මේ බොරු සිහින පොරොන්දු මැතිවරණ වේදිකා තුළ මවා පෙන්වූහ. දැන් රනිල්ගේ අර්බුදය වී ඇත්තේ, ඉතිරි බල අරගලයන් ජයග්‍රහණය කරගෙන තමන්ගේ තනි බලයක් ගොඩනගා ගන්නා තුරු මෙම ආර්ථිකයේ ඇත්ත අර්බුද නිහඬව සිට ඔහුට සහය පළ නොකිරීමයි. විවෘත ආර්ථිකය සෝබනය මවන තරමටම අර්බුදයද ඇති කරන්නේය. ඒ නිසා 67 වසරක ඇත්ත ආර්ථික අර්බුදය යළි යළිත් කලින් කලට පුපුරා නැගෙන්නා සේම යළිත් මතුව ඇත්තේ, මෛත්‍රී - රනිල් හවුල් පාලනයද අභියෝගයට ලක් කරමිනි. එම නිසා වික්‍රමසිංහ අගමැතිවරයා පාර්ලිමේන්තුවේදී සිදු කළේ රටේ අර්බුදයේ කරුණු දක්වමින් මෙතෙක් 8%ක් හා 11%ක් වශයෙන් පැවැති වැට් බද්ද 15%ක් දක්වා තනි අගයකට වැඩි කර ගැනීමය. ආණ්ඩුවේ ණය බර මුදා හැරීමට ක්‍රියා කරන්නේ, ණය ගැනීමට තීරණය කළ පාලකයින් හරහා නොව අහිංසක ජනතාවගේ කර මතට බදු බර පැටවීමෙනි. අවසානයේ ආර්ථිකයේ අර්බුදයටත් රනිල් දේශපාලන අර්බුදයන්ටත් වන්දි ගෙවීමට සිදුව ඇත්තේ ණය ගැනීමට වචනයකින්වත් දායක නොවුණු අහිංසක ජනතාවටය.

## රටේ අර්බුදය

රටේ අර්බුදයේ සංක්ෂිප්ත අදහසක් රනිල් වික්‍රමසිංහගේ ප්‍රකාශයෙන් මෙලෙස උපුටා ගත හැක. "රාජ්‍ය ණය පද්ධතියෙන් සඟවා තිබූ ණය මුදල්- රාජ්‍ය ණය පද්ධතියට එකතුවීම නිසා ඇතිවුණු අර්බුදය ණය ගෙවීම ප්‍රතිව්‍යුහගත කිරීම තුළින් හෝ සමනය කර ගැනීමේ අවස්ථාවද ගෝලීය ආර්ථික අවපාතය නිසා අහිමි වී ගොස් තිබෙනවා. පසුගිය කාලයේ නොවෙනස්ව අනුගමනය කළ ක්‍රමය වුණේ වෙළෙඳපොළෙන් මුදල් සොයා ගැනීමයි. නමුත් අද වනවිට ලෝක වෙළෙඳපොළෙන් මුදල් ලබා ගැනීම අසීරු සහ වියදම් අධික ක්‍රමයක් බවට පත්ව තිබෙනවා...මෙම ගෝලීය ආර්ථික අවදානම ආසන්න වශයෙන් ඉදිරි වසරක පමණ කාලයක් පැවතීමට ඉඩ තිබෙනවා."

ඒ අනුව කාරණය නිශ්චිතය. මෙතෙක් කරගෙන ආ ආකාරයට වාණිජ වෙළෙඳපොළෙන් ණය ගැනීමටද අසීරු නම් සෙවීමට ඇති එකම පිළිතුර ජනතාවට බර පැටවීම සහ බර සැහැල්ලුවට ජනතාවට දී තිබූ සහන ඉවත් කිරීමය. අද සිදු කරමින් සිටින්නේ එම කටයුතුය.

## ආර්ථික වර්ධනය, අපනයන සහ ණය

ආර්ථික අර්බුදයෙන් රට ස්ථිර ලෙස ගැලවීමක් ලැබීමට නම් අපගේ ආර්ථිකයේ සැබෑ වර්ධනයක් ඇති විය යුතුය. බොහෝ අවස්ථාවල ඇමතිවරු ලංකාවේ ආර්ථිකයේ වර්ධනය චීනයට සම කිරීමට නැතිනම් ආසියාවේ වේගවත්ම රට යැයි කීමට කට මැදගෙන සිටිති. එසේම ජන හා සංඛ්‍යාලේඛන නිලධාරීහුද ඇමතිවරයාගේ

15වැනි පිටුවට



"කොමියුනිස්ට් පක්ෂ තමන්ගේම රටවල පමණක් නොව, යටත්විජිත රටවලද, විශේෂයෙන්ම, යටත්විජිත ජනතාව යටපත් කර තැබීම සඳහා සූරාකන ජාතිය යොදා තිබෙන හමුදා අතරද විප්ලවවාදී වැඩ කිරීමේ වැදගත්කම ගැන මම අවධාරණය කරනු කැමැත්තෙමි."

**ලෙනින්**
**තෝරාගත් කෘති**
**වෙළුම 11**
**පිටුව 55**

# ආණ්ඩු වග නොවීම හා ජනතාව විඳවීම

අප ජීවත්වන සමාජයේ බොහෝ දෙනා ලිංගිකත්-වය, වයස් පරතරය කුමක් වුවද කුමන හෝ ප්‍රශ්නයන්ට මුහුණ දෙමින් ජීවත් වේ. එහෙත් අප මුහුණ දෙන ප්‍රශ්න වල සැබෑ හේතුව සොයා යනවා වෙනුවට බොහෝ දෙනා පුරුදුව ඇත්තේ 'ජීවිතේ හැටි ඔහොම තමා' යනුවෙන් පවසා හිත හදා ගැනීමය. මෙසේ හිත හදාගත් වාර කොතෙක් නම් ප්‍රමාණයක් ඔබේ ජීවිතයේත් ඇත්ද?

පසුගිය කාලයේ රටේ පුරවැසියන් ලෙස මුහුණ දීමට සිදුවූ, රටේ කතා බහට ලක් වූ ප්‍රශ්න කිහිපයකදීම එයින් වඩාත් පීඩාවට ලක් වූයේ කාන්තාවන්ය. එනිසා හිත හදා ගැනීමෙන් පමණක් ප්‍රශ්නවලට විසඳුම් ලබාගත නොහැකි බව අප තේරුම් ගත යුතුය. වසර කිහිපයකට වරක් ආණ්ඩුවක් පත්කර ගන්නේද සමාජයක් ලෙස අප මුහුණ දෙන ප්‍රශ්නවලට විසඳුම් ලබා ගැනීමටය. එහෙත් අප පත්කර ගත් ආණ්ඩු අප මුහුණ දෙන ප්‍රශ්න වල සැබෑ වගඋත්තරකරුවා ලෙස කටයුතු කර ඇත්තේ කෙසේද? යන්න පිළිබඳව දැන්වත් අප අවධානය යොමු කළ යුතුය.

පසුගිය කාලයේ හිටි හැටියේ කිහිපවතාවකදීම රටේ සෑම තැනකම විදුලිය විසන්ධි විය. එසේ විදුලිය විසන්ධි වීම සම්බන්ධව නොයෙකුත් කට කතාද පැතිරිණි. ආණ්ඩුවේ පාර්ශ්වයේ සමහර මැති ඇමතීන් ජනතාවට ඒත්තු ගන්වන්නට උත්සාහ කළේ එය කඩාකප්පල්කාරී ක්‍රියාවක් ලෙසය. ඇතැමුන් පැවසුවේ යන්ත්‍රෝපකරණ නිසි පරිදි නඩත්තු නොකිරීම නිසා ඇති වූ අර්බුදයක් ලෙසය. ඇතැමෙක් පැවසුවේ විදුලි බල මණ්ඩලය පෞද්ගලීකරණ කිරීමේ උපායක් ලෙස එසේ සිදු කර ඇති බවය. කෙසේ වුවත් වත්මන් ආණ්ඩුවේ පාලකයන්, විදුලිය විසන්ධි වීමට සම්බන්ධ හේතු කාරණා රටට පැහැදිලි කර නැවත එසේ නොවන්නට ගන්නා පියවරයන් මොනවා දැයි යන්න තවමත් පැහැදිලි කර නොමැත. මේ වනවිට ප්‍රශ්නය විදුලි බල මණ්ඩලයට පවරා පාලකයන් වගකීමෙන් නිදහස් වී ඇත.



එසේම ජල හිඟයද කලින් කලට අප රටේ ජනතාව මුහුණ දෙන ප්‍රශ්නයකි. නියං තත්වයක් තුළ ජනතාවට පානීය ජලය ලබා ගැනීමේ අපහසුතාවය ඉතා දිගු කලක පටන් පවතින අර්බුදකාරී තත්වයකි. එයට නිසි විසඳුම් ලබා දීමට පැවතුණු කිසිඳු ආණ්ඩුවකට සැලසුම් සහගත වැඩපිළිවෙළක් නොතිබුණි. බලයට පත් ආණ්ඩු එවැනි ප්‍රශ්නවලදී සිටියේ ස්වාභාවික ආපදා තත්වයන් ජනතාව ඉවසා දරා ගත යුතු සහ ඒවා වැළැක්වීමට නොහැකිය යන මතයේ මිස එයට විසඳුම් ලබා දීමට දීර්ඝකාලීන වැඩපිළිවෙළක් සකස් කිරීමේ සුභවාදී පැත්තේ නොවේ.

තවද රැකියා නියුතු කාන්තාවන්ගෙන් විශාල පිරිසක් සේවයේ නියුතු වන්නේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේය. මෙවර පොහොර සහනාධාරය කපා දැමීමට ආණ්ඩුව යොදාගෙන ඇති උපක්‍රමය වන්නේ රසායනික පොහොර භාවිතය නවතා කාබනික පොහොරවලට ජනතාව හුරුකරවිය යුතුය යන සංකල්පය. එම සංකල්පයට කිසිවකු එරෙහි නොවූවත් එකවර රසායනික පොහොර නවතා කාබනික පොහොර භාවිතා කිරීමට යැයි කියූ පමණින් එසේ කළ නොහැකි බව කුඩා ළමයෙකුට වුව වැටහේ. එවැනි දේ වලින් කළ හැකි වන්නේ කෘෂි නිෂ්පාදනය බිඳවැට්ටවීම පමණි. පොහොර සහනාධාරය කපා දමන විට, කෘෂි නිෂ්පාදනයන්ට සහතික මිලක් ලබා නොදෙන විට, එය තම පවුලේ ආර්ථිකයට සම්බන්ධ ප්‍රශ්නයක් බැවින් එහි වැඩි පීඩනයක් දැරීමට සිදුවන්නේ කාන්තාවන්ටය.

අලුත් අවුරුදු උත්සවය එළැඹීමට ඇත්තේ තව දින කිහිපයකි. බඩු මිල දැරිය නොහැකි ලෙස ඉහළ යාම තුළ පවුලේ අවශ්‍යතා ඉටුකර ගැනීමට නොහැකිව ලතවෙන කාන්තාවන් කොතරම් ප්‍රමාණයක් සිටිනවාද? තම පවුලේ දූ දරුවන්ට අලුත් ඇඳුමක්, රසකැවිල්ලක් හදා දීමට නොහැකිව ලතවෙන, තම නිෂ්පාදනයන්ට සහතික මිලක් නොමැති තත්වයක් තුළ දෙක පහට තම අස්වැන්න විකුණාගත් සොච්චම් මුදලින් ණය මුදලවත් පියවා ගැනීමට නොහැකිව ලතවෙන කාන්තාවන් කොතරම් ප්‍රමාණයක් සිටිනවා ඇත්ද? මෑත කාලයේ පාන්පිටි මිල හා පාන් පිටි ආශ්‍රිත නිෂ්පාදනයන්ගේ මිල ඉහළ දැමීම නාගරිකව ජීවත්වන කාන්තාවන්ට තදින් බලපා ඇත.

මෙසේ විදුලිය කපා දැමීම, ජල අවශ්‍යතා සපුරා නොදීම, බඩු මිල ඉහළ දැමීම, පොහොර සහනාධාර කපා දැමීම යන සියලු කාරණා තුළ වඩාත් වැඩි පීඩාවකට ලක්වන්නේ කාන්තාවන්ය. ඒ, පවුල් ඒකකය තුළ සියලු දේ කළමණාකරණය සිදුවන්නේ කාන්තාවන් අතින් වන බැවිනි. එනිසා ඉතිහාසයේ අත්දැකීම් තුළින් අප ඉගෙනගත යුතුව ඇත. ප්‍රශ්න වලට මුහුණ දීමේදී අප නැවත නැවතත් එවැනි ප්‍රශ්නවලටම මුහුණ දෙමින් සිටිනවා වෙනුවට සැබෑ විසඳුම් ලබා ගන්නේ කෙසේද යන්න ගැන සිතා බැලිය යුතුව ඇත. ඒ සඳහා කාන්තාවන්, රටේ ප්‍රශ්න සැබෑ ලෙසම විසඳිය හැකි, ඒ සඳහා වැඩපිළිවෙළක් සහිත දේශපාලන නායකත්වයක් සමඟ පෙළ ගැසීමෙන් තොරව විසඳුමක් නොමැති බව වටහා ගත යුතුය.



## මිලියන 1/2ක කියුබන් දරුවන්ට පෝලියෝ එන්නත ලබාදීමේ ජාතික ව්‍යාපාරයක්!

මාර්තු 28 සිට අප්‍රේල් 03 දක්වා වයස අවුරුදු 3ට අඩු දරුවන් සඳහා පෝලියෝ එන්නත ලබාදීමේ 55 වන ජාතික ව්‍යාපාරයේ දෙවන අදියර ආරම්භ කර ඇත.

ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන් මහජන සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ වෛද්‍ය මාලන් වල්කාසෙල් පවසන්නේ වයස අවුරුදු 68ට අඩු සියලුම ජනතාව පෝලියෝ රෝගයෙන් සුරක්ෂිත කර ඇති බවයි.

1962 පෙබරවාරි 26 දින සිට අද දක්වා කියුබාවේ මිලියන 85ක පෝලියෝ එන්නත් ප්‍රමාණයක් ලබාදී ඇති අතර ලතින් අමෙරිකානු රටවල් අතරින් කියුබාව පෝලියෝ රෝගය මුලිනුපුටා දැමූ පළමු රටද වේ.




## තුර්කියේ කාන්තා විරෝධතාවට රබර් උණ්ඩ...

ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීම වෙනුවෙන් මාර්තු 06 වන දින තුර්කියේ ඉස්තාන්බුල් නගරයට එක්රැස් වූ කාන්තාවන්ට එරට පොලීසිය විසින් පහර දී ඇති බව වාර්තා වේ.

කාන්තා දිනය වෙනුවෙන් විරෝධතාවක් පැවැත්වීමට ඉස්තාන්බුල් නගරයට කාන්තාවන් සිය ගණනක් එක්රැස් වූ අතර රබර් උණ්ඩ යොදා ගනිමින් කැරලි මර්දන පොලීසිය ඔවුන් විසුරුවා හැරීමට කටයුතු කර ඇත. එසේ විසුරුවා හැරීමට කටයුතු කළේ එම නගරයේ ආරක්ෂක හේතු මත මේ වසර තුළ රැළි පැවැත්වීම තහනම් කර ඇති නිසා යැයි එරට බලධාරීන් පවසයි.

එම විරෝධතාවට සහභාගි වූ කාන්තාවන් පවසා සිටින්නේ, පොලීසියට හෝ ආණ්ඩුවට ඔවුන්ව නැවැත්විය නොහැකි බවත් ඔවුන් සියලු බාධක නොතකා දිගටම සටන් කරන බවත්ය.

තුර්කියේ කාන්තා හිංසනය ඉතා ඉහළ අගයක පවතින අතර එරට ශ්‍රම බලකාය තුළ කාන්තා දායකත්වය ඉතා පහළ අගයක පවතී.




ජනේරුවට සමුදී අපි දින ගණනින් බැලුවේ
දහක් පැතුම් ඉටුවන සුබ අවුරුද්දකි පැතුවේ
පරණ හීන අලුත් රැයක අලුත් වෙලා පෙනුණේ
අනේ අපට තවමත් නම් නෑ අවුරුදු ලැබුවේ


අස්වද්දන්ට ගත් ණයවල පොලී වලින්
නිදහස් වුනත් නෑ නිවනක් හිතේ බරින්
අලුත් හාල් බත අහිමිව ගියේ ඉතින්
අස්වනු කපා කමතට ගන්නටත් කලින්

ඉස්සර වගේ නෑ දැන් එරබඳු පිපුණේ
බක්මහ අකුණු හදවත් පතුලෙයි නැගුණේ
ඉස්සර කරන් නෑගම් යන්නට තොසිනේ
කප්පරකට සිහින හිත ඇතුළෙයි ඇදුනේ

කඩේ හාල්වලින් කැවුම් කිරිබත් ටික උයලා
ණයට ගත්ත සල්ලිවලින් අලුත් ඇඳුම් ඇඳලා
මාසෙට කන පඩිපත එක දවසට දිය කරලා
මෙදා සැරෙත් සුසුම් හෙළමු ගයනා විට කොවුලා


අවුරුද්දට විතරක් නොව සමහර දේ කෙරුවේ
හැමදාමත් අපේ රටට නොනගතයයි ලැබුවේ
අනුභවයට නැකත් ඇතත් කුසගින්නයි දැනුණේ
කවදාවත් නෑනේ අපට අලුත් සඳක් පෙනුණේ

බක්මහ ඇවිත් අරගෙන අවුරුදු සද්ද
කවදාක නම් මල්බර වේවිද බැද්ද
ඉටුවන තුරු සිහින නොඉඳ නොකරම සද්ද
එක්වෙමු අලුත් කරගන්නට අවුරුද්ද



දැනුම සමාජය හා චින්තනය 03

# මොළය පාවිච්චි කිරීම



දැනුම නැමැති ක්‍රියාවලිය මිනිස් මොළය පදනම් කර ගනිමින් සිදුවන බව පැහැදිලි සත්‍යයකි. දැනුම ලෙස මිනිස් මොළයේ පිළිබිඹු වන්නේ, ප්‍රකෘතිය හෙවත් සොබාදහම නිසා දැනුමේ විෂයමූල පදනම ප්‍රකෘතිය වේ. එහෙත් එම ප්‍රකෘතිය හා එහි නියාම අරමුණු සහගත ලෙස පරාවර්තනය කර ගැනීමේ හැකියාව හෙවත් හඳුනා ගැනීම, මතක තබා ගැනීම හා තර්කනයේ හැකියාව ඇත්තේ, මිනිස් මොළය තුළ පමණි. මිනිස් සිරුරේ ඇති විශේෂිතම ඉන්ද්‍රිය වන්නේ, මිනිස් මොළයයි.

## සිතන ද්‍රව්‍යය

මොළය යනු අද්භූත වස්තුවක් නොව ද්‍රව්‍යමය දෙයකි. එය ද්‍රව්‍යයේ සංවර්ධනයේ දියුණුතම අවස්ථාව වේ. ද්‍රව්‍යයේ, පරිණාමයේ හා වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස සත්ව පරිණාමයේ එක් අවස්ථාවක මිනිසා බිහි විය. මෙම ඉතාම දියුණු ඉන්ද්‍රිය මිනිසා තුළ පවතී. ඒ අනුව මිනිස් මොළය යනු සරල ද්‍රව්‍ය සිතන ද්‍රව්‍ය දක්වා සංවර්ධනය වීමකි. පොදුවේ ගත් විට මිනිස් මොළය ද්‍රව්‍යමය වස්තුවකි. මිනිස් මොළය සෑදී තිබෙන්නේ සෛලවලිනි. එම විශේෂ සෛල නිව්රෝන ලෙස හඳුන්වනු ලැබේ. සාමාන්‍ය මිනිස් මොළයක් රාත්තල් තුනක් (03) පමණ බර වන අතර, එය සෑදී ඇති නිව්රෝන ප්‍රමාණය, නවතම ගණන බැලීම්වලට අනුව බිලියන අසූ හයක් පමණ වේ. මොළයේ හැකියාව විශ්මයජනකය. මොළය තුළ සිදුවන රසායනික ක්‍රියා මගින් හඳුනාගැනීම, මතක තබා ගැනීම, ශරීරය පවත්වාගෙන යාම, සිතිවිලි ඇතිකර ගැනීම, හා තර්කනය ආදී සියල්ල සිදු වේ. ඒවා කිසියම් අත්භූත බලයක හෝ දෙවියන්ගේ ක්‍රියාවක් නොව මොළය නම් ඉන්ද්‍රියේ ක්‍රියාකාරිත්වය වේ. සාමාන්‍යයෙන් ස්නායු පද්ධතිය සම්බන්ධ කර ගනිමින් මොළය තොරතුරු සන්නිවේදනය කරන අතර, මොළයේ තොරතුරු සන්නිවේදන වේගය, පැයට සැතපුම් 260ක් පමණ යයි පැවසේ. දිනකට මොළය තුළ බිහිවන සිතිවිලි ප්‍රමාණය 50,000ක් පමණ වේ. එහි සිදුවන රසායනික ප්‍රතික්‍රියා ප්‍රමාණය තත්පරයට ලක්ෂයක් පමණ බව සොයාගෙන තිබේ. මොළයට මිනිස් සිරුරේ සිතන ඉන්ද්‍රිය බවට පත්වීමට හැකිවී තිබෙන්නේ එහි ඇති මෙම සුවිශේෂී ලක්ෂණ හා ක්‍රියාකාරිත්වය නිසාය.

## භාවිතය තුළින් දැනුම

මිනිසා හැම විටම භාවිතය තුළින් දැනුම ලබා ගන්නා අයෙකි. මිනිසාගේ දැනුම බිහිවන්නේ පාසල් හෝ අධ්‍යාපන ආයතන තුළ පමණක් නොවේ. ඔහු භාවිතය මගින්, අත්දැකීම් මගින් දැනුම ලබා ගනී. එම හැකියාව මිනිස් මොළය සතු වේ. ඈත අතීතයේ ප්‍රාථමික සාමූහික සමාජය පැවති අවධියේ පාසල් අධ්‍යාපනයක් නොතිබූ අතර, මිනිසා සිය නිෂ්පාදන ක්‍රියාවලියේ භාවිතාව මගින් දැනුම ලබා ගත් අතර, එම දැනුම පරපුරෙන් පරපුරට සම්ප්‍රේෂණය කළේය. මුලදී අංග චලනයෙන්ද පසුව භාෂාව මගින් වාචිකවද මෙම දැනුම බෙදා ගත් අතර, පසුව අංග සම්පූර්ණ භාෂාවක් නිර්මාණය වීමත් සමඟ, ලේඛන කලාව ඇරඹීමත් සමඟ, අධ්‍යාපන ආයතන ඇරඹීමත් සමඟ, දැනුම ලබා දීම හා ලබා ගැනීම, අධ්‍යාපන ක්‍රියාවලියක් බවට පත්විය. අධ්‍යාපන ආයතන මගින්, විධිමත් අධ්‍යාපන ක්‍රමයක් මගින්, දැනුම ලබා නොගත් අය පවා භාවිතය තුළ තමන් නියැලෙන ක්ෂේත්‍රයේ දැනුම ලබා ගන්නා බව අපි දනිමු. උදාහරණයක් ලෙස ගොවිතැන් කරන අය තම භාවිතය මගින් ලබා ඇති දැනුම සමහර විට පොතෙන් කෘෂිකර්මාන්තය ඉගෙන ගත් අයගේ දැනුම අභිබවා සිටී. ධීවර කාර්මිකයන්ද එසේය. ඉන් අදහස් කරන්නේ පොත පතෙන් ලබන විද්‍යාත්මක දැනුම වැඩක් නැති බව නොවේ. එය දැනුමේ වඩා දියුණු ක්‍රමයකි. එහෙත් මිනිසා තම භාවිතයෙන්ද ඉගෙන ගන්නා බවත් එය සිදු වන්නේත් මොළය හා පංචේන්ද්‍රියන්ගේ ක්‍රියාකාරිත්වයෙන් බවත් අවබෝධ කරගත යුතුය.

## තර්කයද? අනුභූතියද?

දැනුම සඳහා මිනිස් මොළය තුළ ප්‍රකෘතිය පරාවර්තනය විය යුතුය. ප්‍රකෘතිය මිනිස් මොළය තුළ පරාවර්තනය වන්නේ, පංචේන්ද්‍රියයන් මගිනි. අප ප්‍රකෘතිය සංජානනය කරන්නේ, පංචේන්ද්‍රියයන් මගිනි. එලෙස පංචේන්ද්‍රියයන් මගින් අප ලබා ගන්නා සංජානනයන් මොළය තුළ පරාවර්තනය වේ. එය අනුභූතිය ලෙස හැඳින්වේ. එහෙත් දැනුම සම්පූර්ණ වීමට පංචේන්ද්‍රියයන් මගින් ලැබෙන තොරතුරු පමණක් ප්‍රමාණවත් නොවේ. එයට තර්කනය අවශයයි. වඩාත් වැඩි දැනුමක් සඳහා විද්‍යාත්මක හා තාක්ෂණික උපකරණ අවශ්‍යය. ඒ අනුව දැනුම ගොඩනැගෙන්නේ ඉන්ද්‍රියගෝචර දැනුම හා තාර්කික දැනුම එකට ක්‍රියාකාරී වීමෙනි. දැනුමේ දයලෙක්තිකය වන්නේ එයයි. එනම් ඉන්ද්‍රියගෙ ්චර දැනුම හා තාර්කික දැනුමය.

ඉන්ද්‍රියගෝචර දැනුම මගින් අප වෙත ලැබෙන්නේ ප්‍රකෘතියේ අදාළ වස්තූන්ගේ සියලු ගුණයන්ගේ ලක්ෂණ නොව ඉන් කිහිපයක් පමණි. ඒ නිසා ඉන්ද්‍රියන් මගින් ලැබෙන තොරතුරු ප්‍රමාණවත් නැත. තාර්කික දැනුම අවශ්‍ය වන්නේ, විද්‍යාත්මක දැනුම අවශ්‍ය වන්නේත්, විද්‍යාත්මක උපකරණ අවශ්‍ය වන්නේත් පංචේන්ද්‍රයයන්ගේ මෙම සීමාසහිත බව අභිබවා යාමටය. අපගේ පංචේන්ද්‍රියයන්ගේ හැකියාව සීමිතය. අපට ශබ්ද ඇසිය හැක. එහෙත් අපේ ශ්‍රවණ ඉන්ද්‍රිය වන කණට හසු කරගත හැක්කේ සීමිත පරාසයක ශබ්ද සංඛ්‍යාත පමණි. අපේ ඇසට ඉතාම දුර තිබෙන වස්තු මෙන්ම ඉතා කුඩා වස්තු දැකිය නොහැක. උපකරණ අවශ්‍ය වන්නේ, එම සීමාකම් මඟ හරවා ගැනීම සඳහාය. ශබ්ද තරංග හසුකර ගන්නා උපකරණ මගින්, දුරදක්න හා කුඩා දේ ලොකු කර පෙන්වන අන්වීක්ෂ උපකරණ මගින් අප කරන්නේ, අපේ පංචේන්ද්‍රියයන්ගේ සීමාකම් අභිබවා යාමය. එම උපකරණ මිනිසා විසින් නිපදවා ගත් ඒවා වන අතර, එය කළ හැකිවූයේ මිනිස් මොළයේ ඇති තර්කනයේ හා නිර්මාණශීලීභාවයේ ගුණය හෙවත් හැකියාව නිසාය. මිනිසාගේ ආඝ්‍රාණ ඉන්ද්‍රිය හෙවත් නාසය පවා දුර්වලය. මිනිසාට ආඝ්‍රාණය කළ නොහැකිදේ ආඝ්‍රාණය කිරීමේ හැකියාව සතුන්ට තිබේ. එය ඉව ලෙස හඳුන්වමු. සොරුන් ඇල්ලීමට, මත් ද්‍රව්‍ය සෙවීමට සුනඛයින් වැනි සතුන් යොදා ගනී. මේ සඳහා උපකරණද සෑදිය හැක. පොදුවේ ගත්කළ අප තේරුම් ගත යුත්තේ, අපේ මනස තුළ දැනුම ආරම්භ වන්නේ ඉන්ද්‍රියගෝචර දැනුමෙන් වුවත්, එම දැනුම සම්පූර්ණ වන්නේ, තාර්කික දැනුමද සමගම යන්නය. තාර්කික දැනුම යනු මුළුමණින්ම මිනිස් මොළයේ හපන්කමකි.

දැනුම සම්බන්ධ ප්‍රශ්නයේදී සමහරවිට දැනුමේ මෙම පැති දෙක එක්ව වටහා නොගෙන එක්පැත්තක් පමණක් පිළිගත් අය හමුවී තිබේ. ඉන්ද්‍රිය ගෝචර දැනුම පමණක් පිළිගන්නා තර්කනය නොපිළිගන්නා අය අනුභූතිවාදීන් ලෙසද, ඉන්ද්‍රියගෝචර දැනුම පිළි නොගන්නා තර්කනය පමණක් පිළිගන්නා අය බුද්ධිවාදීන් ලෙසද හඳුන්වා තිබේ. අනුභූතිවාදීන්ට අනුව යමක් විශ්වාස කළ හැක්කේ, ඒවා සිය පංචේන්ද්‍රියයන්ට ග්‍රහණය වන්නේ නම් පමණි. තර්ක වැඩක් නැත. ඒවා බොරුය. බුද්ධිවාදීන්ට අනුව පිළිගත හැක්කේ තර්කය, පමණි. "ඉන්ද්‍රියගෝචර දැනුම වැරදිය. වතුර වීදුරුවක දැමූ පැන්සල අපට පෙනෙන්නේ, නැමී ඇති ලෙසය. එය සත්‍යය නොවේ. එබැවින් 'ඇස' අප රවටා ඇත. ඉන්ද්‍රියයන් මත විශ්වාසය තැබිය නොහැක." ඒ බුද්ධිවාදීන්ගේ තර්කයයි.

එහෙත් මෙම අන්ත දෙකම වැරදිය. දැනුම යනු ඉන්ද්‍රිය ගෝචර දැනුමේත්, තාර්කික දැනුමේත් එකතුවකි. එකක් නැතිව අනෙක නොපවතී.


## තර්කයේ ගුණ අගුණ

දැනුම පිළිබඳ ක්‍රියාවලියේදී විද්‍යාත්මක නොවන වියුක්ත තර්කනය සැම විටම සත්‍යය මතුකරන්නේ නැත. වියුක්ත තර්කනයට ඇත්ත, නැත්ත කිරීමටද, නැත්ත ඇත්ත කිරීමටද, පුළුවන. දොරක් අඩක් වසා තැබීම සමානයි අඩක් විවෘතව තැබීම නම්, දොර මුළුමනින්ම වසා තැබීම සමානයි, එය මුළුමණින්ම විවෘතව තැබීම යනුවෙන් තර්ක කළ හැකිය. ඒවා කුතර්කයන්ය. සත්‍යයෙන් තොරය. ජීවමාන තර්ක නොවේ. අධිකරණයේදී නීතිවේදීන් එවැනි තර්ක මගින් අපරාධකරුවන් නිදහස් කර තිබුණ අවස්ථා අපේ ඉතිහාසයේ ඇත. එබැවින් තර්කය හැම විටම සත්‍යය නොවේ. එහෙත් තර්කය දැනුමේදී ඉතාම වැදගත්ය. නිවැරදි විද්‍යාත්මක තර්කනයක් මිනිසාට අවශ්‍ය වේ. එසේ නොවූ විට තර්කනයෙන් තොරව ඕනෑම අසත්‍යයක් පිළිගන්නා පිරිසක් නිර්මාණය වේ.

ධනවාදය තුළ බොහෝ විට මිනිසුගෙන් තර්කනය ඉවත් කෙරේ. කියන දේ පිළිගන්නා මිනිස් ප්‍රජාවක්ද, පොත කටපාඩම් කරන සිසු පරපුරක්ද, ධනවාදය නිර්මාණය කර ඇත. සිංහල ජනයාගේ ලේ 'සිංහ'ලේ යයි සමහරුන් තුළ වන පිළිගැනීම, එවැනි තර්කනයකින් තොරව පිළිගැනීම ගැන එක් උදාහරණයක් පමණක් වේ. එවැනි අය නිදහස් මනසක් ඇති අය නොව වහලුන් වැනි අයය. පාසල් අධ්‍යාපනයේදී විද්‍යා විෂයන් උගෙන ගනිද්දී පරිණාමවාදය ගැන, ජීවයේ සම්භවය ගැන ඉගෙන ගන්නා සිසුවා එහිදීම ආගම පාඩමේදී ලෝකය දෙවියන්ගේ මැවීමක් බව ඉගෙන ගන්නා අතර, එම දැනුමෙහි ඇති ප්‍රතිවිරෝධය ගැන තර්ක නොකර දෙකම පාඩම් කරනු දැකිය හැක. ඒ, විභාගය සමත් වීම සඳහාය. අතාර්කික අධ්‍යාපනයේ ස්වභාවය එයයි. සමාජය දුප්පත් හා පොහොසත් ලෙස ගොඩවල් දෙකකට බෙදී තිබෙන්නේ සූරාකෑම හෝ සමාජ සම්පත් සාධාරණව බෙදී නොයාම නිසා යයි සිතනවා වෙනුවට, එය පෙර කළ පිං පව්වල, ග්‍රහ තාරකාවල බලපෑමේ ප්‍රතිඵලයක් ලෙස සිතන අය වැඩිපුර සිටීම විසින් ධනවාදයේ අතාර්කික අධ්‍යාපනයේ තරම මැනගත හැක. දැනුම සැබෑ දැනුමක් වීමට නම්, එය ඉන්ද්‍රියගෝචර දැනුමට සීමා නොවී තර්කය තුළින්ද වටහා ගත යුතුය. අත්දැකීමෙන් ඉගෙන ගත යුතුය. දැනුම යනු පොත්පත්වල සඳහන් හෝ කිසියම් පිරිසකගේ පැවැත්මට අදාළ අසත්‍යයන් තොගයක් අතාර්කිකව පිළිගැනීම නොවේ. එබැවින් දැනුම ලබා දීමේ හා දැනුම ලබා ගැනීමේ විධිමත් ක්‍රමය වන අධ්‍යාපනය, තාර්කික අධ්‍යාපනයක් බවට පත්කළ යුතුව තිබේ.

මෙයින් පෙනෙන්නේ මිනිසා සතුව පවතින දැනුම හැමවිටම සත්‍යය විය නොහැකි බවය. එසේනම් මිනිසාගේ දැනුම සත්‍යය බවට පත් විය යුතුය. සත්‍යය යනු කුමක්ද යන්න කථා කිරීමට මීළඟ කලාපයෙන් හමුවෙමු.

ධනවාදය තුළ බොහෝ විට මිනිසුගෙන් තර්කනය ඉවත් කෙරේ. කියන දේ පිළිගන්නා මිනිස් ප්‍රජාවක්ද, පොත කටපාඩම් කරන සිසු පරපුරක්ද, ධනවාදය නිර්මාණය කර ඇත. සිංහල ජනයාගේ ලේ 'සිංහ'ලේ යයි සමහරුන් තුළ වන පිළිගැනීම, එවැනි තර්කනයකින් තොරව පිළිගැනීම ගැන එක් උදාහරණයක් පමණක් වේ.



"සකසා නිම කළ නිගමනයන් තමන්ට දැනගත හැකි වූ පමණින්, යම් කොමියුනිස්ට්වාදියෙක් මහත් වුවමනාවෙන් හා වෙහෙස විඳ කළයුතු වැඩ රාශියක් නොකරම, විචාරාත්මක ලෙස පරීක්ෂාකර බැලිය යුතු කරුණු වටහා නොගෙනම, ඔහු තමන්ගේ කොමියුනිස්ට්වාදය ගැන පුරසාරම් දොඩන්නට සිතතොත්, ඔහු නම්, ඇත්තෙන්ම ඛේදජනක කොමියුනිස්ට්වාදියෙකි."

**ලෙනින්**
**තෝරාගත් කෘති**
**වෙළුම 11 පිටු 62-63**

# පොහොර සහනාධාර කප්පාදුව හා
# ආණ්ඩුවේ දුෂ්ට වුවමනාව



ගෙවී ගිය මාස කිහිපය ගොවිබිම් උණුසුම් කළ මාස කිහිපයක් බවට පත් විය. ඒ, ගෝලීය උණුසුම ඉහළ යාම නිසා නොව මෛත්‍රී - රනිල් හවුල් ආණ්ඩුව ගොවි ජන ජීවිතයට අහිතකරව බලපාන තීන්දු රැසක් ගැනීම හේතුවෙනි. "වස - විස නැති ආහාර", "වකුගඩු මාරයාගෙන් ගොවි ජනතාව බේරා ගැනීම", කාබනික වගාවට යොමු වීම වැනි විවිධ සටන් පාඨ කසකරුවන් ලෙස ඉදිරියෙන් ගමන් කළ අතර පෙරහැරේ පැමිණියේ පොහොර සහනාධාරය කපා හැරීමයි. ජනප්‍රිය ඉතා යහපත් සංකල්පයක්, එනම්, 'වස විසවලින් තොර ආහාර' යන්නට මුවා වී ආණ්ඩුව ගත් මෙම ක්‍රියාමාර්ගය සැබෑ ලෙසම යහපත් අරමුණින් ගන්නා ලද්දක්දැයි තේරුම් ගැනීම වැදගත්ය. කෙසේ වුවද කරුණු විමර්ශනයේදී හෙළි වන්නේ යහපත් සංකල්පයන් දුෂ්ට වුවමනාවන් වෙනුවෙන් උපයෝගී කර ගන්නා ලද ආකාරයයි.

2016 අයවැය ඉදිරිපත් කළ ආණ්ඩුව එතෙක් ක්‍රියාත්මක වූ සහනාධාර පොහොර ලබාදීම වෙනුවට මුදල් ලබා දීමට යෝජනා කළේය. ඒ අනුව හෙක්ටයාර් 01ක් සඳහා රු.12,500/=ක් කන්නයක් සඳහාත් වසරක් සඳහා රු.25,000/=ක් ලෙසත් ලබා දීමට යෝජනා විය. ඒ අනුව වී වගාවට අක්කරයක් සඳහා රු.5000/=ක මුදලක් ආණ්ඩුවෙන් ලබා දීමට යෝජනා විය. වී කිලෝවක සහතික මිල පහළ දැම්ම, ගොවි විශ්‍රාම වැටුපෙන් රු.50/=ක් කපා දැම්ම, සියලු කෘෂි ආම්පන්න හා යන්ත්‍ර සූත්‍රවල මිල ඉහළ යාම ආදී ගොවි ජනතාවට සෘජුවම බලපාන යෝජනා රැසක් අයවැය තුළ විය. එහෙත් ගොවි ජනතාව සටනට බට ප්‍රධානම හේතුව වූයේ පොහොර සහනාධාරය ඉවත් කිරීමට ආණ්ඩුව ගන්නා ලද තීරණයයි.

ගොවි ජනතාව මෙම තීරණයට එරෙහි වූයේ ඇයි? සංඛ්‍යා ලේඛන හරඹයක සඳහා ආණ්ඩුව අක්කරයකට ලබා දෙන රු.5000/=න් අවශ්‍ය පොහොර නිර්දේශය ලබා ගත හැකි බවට විවිධ තර්ක මවමින් සිටියි. රු.2500/=කින් පවුලකට ජීවත් විය හැකි බවට මුග්ධ තර්ක ඉදිරිපත් කළ ඇමතිවරුන් සිටින රටක ගොවි ජනතාවට ඒවා අපූර්ව නොවේ.

2004 දී අක්කරයක් සඳහා නිර්දේශිත පොහොර ප්‍රතිශතය වූයේ, යූරියා 135kg, MOP 42kg, TSP 45kgක්ද වශයෙනි. එහෙත් 2010 වසර වන විට පැවති රාජපක්ෂ ආණ්ඩුව තම පැවැත්ම වෙනුවෙන් බොහෝ නිර්නායකයන්, නිර්දේශයන් වෙනස් කිරීමට කටයුතු කළා සේ නිර්දේශිත පොහොර ප්‍රමාණයද විටින් විට කප්පාදු කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස අක්කරයක් සඳහා යූරියා 86kgක්ද, MOP 20kg, TSP 22kgක්ද දක්වා අඩු කරන ලදී. වත්මන් ආණ්ඩුව ඉලක්කම් විජ්ජාවක නිරත වනුයේ, රාජපක්ෂ ආණ්ඩුව ප්‍රමාණාත්මකව කප්පාදු කරන ලද පොහොර නිර්දේශය මත පදනම්ව වන අතර එයට මූලාශ්‍ර කරගත් විද්‍යාත්මක පර්යේෂණ කිසිවක් නොවීමද ආණ්ඩුවල සැබෑ වුවමනාව හෙළිදරව් කරන කාරණයක් බවට පත් වී හමාරය.

2016 අයවැය යෝජනා අනුව 2016.01.04 දිනට පොහොර ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛනයට අනුව,

| | | |
|---|---|---|
| යූරියා | 50kg | රු 3000.00 |
| TSP | 50kg | රු 3400.00 |
| MOP | 50kg | රු 3350.00 |

වන පරිදි මිල ඉහළ දමන ලදී. මෙතෙක් ක්‍රියාත්මක වූ සෑම වර්ගයකම (මූලික පොහොර) 50kg ක් රු.500ක් වූ ලෙස පොහොර සහනාධාරය අහෝසි කරන ලද අතර විවෘත වෙළඳපොළේ රු.1200ක් වූ පොහොර මිලද මේ අනුව ඉහත සංශෝධනයන් සමඟ අහෝසි කරන ලදී.

පොහොර සහනාධාරය යටතේ ගොවියාට ලබාදෙන ලද්දේ නයිට්‍රජන් (යූරියා), පොටෑසියම්( MBP) පොස්පරස් (TSP) යන මූල ද්‍රව්‍ය අඩංගු මූලික පොහොරයි. මෙම මූල ද්‍රව්‍ය මිශ්‍ර කළ පොහොර වෙළඳපොළේ අලෙවි වන්නේ ඉහළ මිල ගණන් අනුව වන අතර පොහොර සහනාධාරය කපා දැම්මත් සමඟ ගොවියාට මෙතෙක් තිබූ අමිශ්‍ර පොහොර ලබා ගැනීමේ අවස්ථාවද අහිමි කොට ඇත. ගොවි ජනතාවගේ අරගලය හමුවේ ආණ්ඩුව සිය මිල ගණන් නැවත සංශෝධනය කොට ඇත. ඒ අනුව මූලික පොහොර වර්ග සියල්ලම 50kg ක් රු.2500/=කට ලබාදීමට තීන්දු කොට තිබෙන අතර එය ආණ්ඩුව ලබා දුන් දෙයක් නොව ගොවි ජනතාව උදුරා ගත් දෙයක් බව තේරුම් ගත යුතුය.

මෙතෙක් විවෘත වෙළඳපොලේ පොහොර මිල උච්චාවචනය වුවද ගොවියාට රු.500.00 ට පොහොර ලැබුණි. (බොරු රක්ෂණ ගාස්තුව රු.150ක් සමඟ) එහෙත් ආණ්ඩුවේ නව ක්‍රියාමාර්ගය හමුවේ පොහොර මිල ඉහළ ගියද ගොවියාට හිමිවන මුදල ස්ථාවර වේ. ඒ අනුව ගොවියාට ලැබෙන මුදලෙන් නිර්දේශ කළ පොහොර නිර්දේශයද ලබා ගැනීමට නොහැකි අවදානමක් නිර්මාණය වී හමාරය.

"මුදල් එපා, කපා දැමූ පොහොර සහනාධාරය ලබා දෙනු!" යන ගොවි ජන අරගලයට එරෙහිව කරුණු දක්වන ලද ආණ්ඩුවද, ආණ්ඩුවේ සංකල්ප වෙළෙන්දෝද එය සමාගම් වෙනුවෙන් කරන සටනක් බවත්, කාබනික පොහොරවලට එරෙහි සටනක් බවත් පුනරුච්චාරණය කරති; වසර 03කදී වස විස නැති ආහාර නිපදවන බවට පාරම් බාති. එයට කිසිවෙක් විරුද්ධ නැත. සැබැන්ම පොහොර කාබනිකද නැතහොත් රසායනිකද යන්න පිළිබඳව ගොවියාට ගැටලුවක් නැත. ඔවුනට අවශ්‍ය වන්නේ තම වගාවට පොහොරය. අද වන විට ඇත්තේ වැඩි දියුණු කරන ලද බීජය, එසේ නොවන දේශීය පැරණි වී බීජ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අදත් හඳුන්වන්නේ 'වල් වී' ලෙසය.

> ඉඩම් ප්‍රතිපත්තියෙහි බාධා ඉවත් කොට ආයෝජකයන්ට ගැලපෙන සේ සකස් කිරීම අරඹා ඇත. එහෙත් ඒ සඳහා ඉඩම් අවශ්‍යය. ගොවියාගේ වත්කම ඉඩමයි. එම ඉඩම අත්පත් කර ගැනීමට නම් ගොවියාට ගොවිතැන එපා කර විය යුතුය. විකිණිය හැකි ඔප්පුවක් ලබා දීම, සහනාධාර කප්පාදුව, නිෂ්පාදන පිරිවැය ඉහළ දැමීම, ආදායම පහළ දැම්ම, ඒ තුළින් ගොවියාට ගොවිතැන එපා කරවීම, ගොවිතැන එපා වූ ගොවියාගේ ඉඩම සමාගම් වෙත විකිණීම,

අතීත මිනිසා සොබා දහමින් ආහාර සොයා ගත් අතර කාලයක් ගත වෙද්දී විෂ නොවන ආහාර සහිත ගස් වැල් තෝරා ගෙන තමන් වෙනුවෙන් හීලෑ කර ගැනීම එනම්, වගා කිරීම ඇරඹුවේය. අඩු පිරිසක් සිටින අවධියේ ඒවා ප්‍රමාණවත් විය. සිය වර්ගයා බෝ කිරීමට සොබා දහම තුළ ශාකයක ඵල හටගත් අතර එය මිනිසාගේ ආහාර උදෙසා නොවීය. එහෙත් ආහාර උදෙසා වගාව පටන් ගත් විට වැඩි වන ජනගහනයට සාපේක්ෂව වැඩි අස්වැන්නක් ලබා ගැනීමට මිනිසා විසින් විවිධ අත්හදා බැලීම් සිදු කරන ලදී. ශාකයක ප්‍රරෝහණ කාලය හෝ ප්‍රජනන කාලය අඩු කිරීමට නොහැකි විය. එහෙත් වර්ධක කාලය කෙටි කිරීමට විද්‍යාවේ ජයග්‍රහණ උපයෝගි කර ගැනිණි. එහි ප්‍රතිඵලය වූයේ අඩු කාලයකින් ප්‍රතිඵල ගැනීමට වර්ධන වේගය වැඩි කළ යුතු වීමය. ප්‍රතිඵලය වූයේ මූලික මූලද්‍රව්‍ය එනම්, නයිට්‍රජන්, පොස්පරස්, පොටෑසියම් ඇතුළු මූලද්‍රව්‍ය බාහිරින් ලබා දීමට සිදුවීමයි. නැවත නැවත වගා කරන භූමියක එය සිදු කිරීම අනිවාර්ය වේ. පොහොර පිළිබඳ කතාන්තරයේ ආරම්භය එයයි. එහෙත් බොහෝ සංකල්ප වෙළෙන්දෝ එය අමතක කරති.

ආණ්ඩුවේ 'කාබනික පොහොර සංකල්පය' යහපත් අරමුණක් සිය 'දුෂ්ට වුවමනාව' වෙනුවෙන් භාවිතා කිරීමකි. එනම් ගොවියාට කාබනික පොහොර ලබා ගැනීමට, ලබා දීමට ආණ්ඩුවට කිසිදු වැඩපිළිවෙළක් නොමැත. ඒය 2016 අයවැය ලේඛනය තුළින් පැහැදිලිය, එපමණක්ද නොවේ. මෛත්‍රී - රනිල් ආණ්ඩුව පාරම්බාන තුන් අවුරුදු කෘෂිකාර්මික ජාතික වැඩපිළිවෙළ තුළද ඒ පිළිබඳව කිසිදු සඳහනක් නොමැත. එයින් පැහැදිලි වන්නේ, ගොවියා කාබනික වගාවට යොමු කිරීම වෙනුවට අවශ්‍යව ඇත්තේ, එය පෙන්වා ගොවියා මෙතෙක් භුක්ති විඳි සහනාධාර කපා දැම්මය. සැබැවින්ම පවතින සහනාධාර කපා දැමීම වෙනුවට ආණ්ඩුව කළ යුතුව යුත්තේ, කාබනික පොහොර නිෂ්පාදනයට ජාතික වැඩපිළිවෙළක් ආරම්භ කිරීමය; පියවරෙන් පියවර ගොවියා යොමු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමය. එහෙත් එවැන්නක සේයාවක් හෝ නොමැති වීමෙන් ආණ්ඩුවේ සැබෑ වුවමනාව කුමක්දැයි පැහැදිලිය.

අනෙක් අතට වකුගඩු රෝගය පෙන්වා පොහොර සහනාධාරය 15වැනි පිටුවට



# 1905: විප්ලවයේ පෙරවදන

19වැනි සියවස අගභාගය පමණ වන විට රුසියාවේ ප්‍රධාන නගර ආශ්‍රිතව කර්මාන්ත ශාලා ඇති වෙමින් ක්‍රමයෙන් ධනවාදය ස්ථාපිත වීම ආරම්භ කළ බව අප ඉහත කලාපයෙන් සාකච්ඡා කෙළෙමු. මෙසේ ධනපති පංතිය බිහි වීම හා සමගාමීව එම නගර ආශ්‍රිතව කම්කරු පංතියක්ද බිහි වීමට පටන් ගැනුණි.

මෙසේ ආරම්භ වූ කර්මාන්තශාලා තුළ වැඩ කළ කම්කරු ස්ත්‍රීහු සහ පුරුෂයෝ ඉතා දරුණු ශ්‍රම කොල්ලයකට ලක් වූහ. ඔවුනට දිනකට පැය 12කට අධික කාලයක් ශ්‍රමය වැගිරිය යුතු විය. ඔවුන් ජීවත්වූයේද කර්මාන්ත ශාලා අසල ඉදිකර තිබූ මුඩුක්කු වැනි කාමර තුළය. අද මෙන් පැය 08කට වඩා වැඩකළ විට අතිකාල ගෙවීමක් එකල සිදුනොවුණි. කෙටියෙන්ම පවසවානම් එම කම්කරුවා යනු එම කර්මාන්තශාලා තුළ ඇති තවත් යන්ත්‍රයක්ම විය. මේ තත්වය තුළ නිරන්තරයෙන්ම කම්කරුවන්ගේ ප්‍රතිවිරෝධය තම හාම්පුතුන් වෙත එල්ල වෙමින් තිබුණි.

## පක්ෂය බිහි වේ

යුරෝපය හරහා සිදුවූ ප්‍රාග්ධන ආගමනයත් සමග කර්මාන්තශාලා ආදිය රුසියාව තුළ ස්ථාපිත වූ අතරම එහි අතුරු ඵලයක් ලෙස යුරෝපය පුරා පැතිරෙමින් පැවති නිදහස් අදහස්ද (රාජාණ්ඩු පාලනයන්ට එරෙහි) මාක්ස්වාදී අදහස්ද රුසියාවට කාන්දු විය. මාක්ස්වාදයේ ආගමනය බුද්ධිමත් ස්ථරය තුළට මෙන්ම විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ටද මහත් ආශ්වාදයක් ගෙන දුන්නේය. රුසියානු විප්ලවයේ නියමුවා වශයෙන් සලකණු ලබන වි.අයි. ලෙනින් සහෝදරයාද මාක්ස්වාදයේ හෝඩිය කියවනු ලැබුවේද මේ ආගමනයත් සමග ව්‍යුත්පන්න වූ මාක්ස්වාදී අධ්‍යයන කව හරහාය.

සාර් පාලනයේ ඒකාධිපති ස්වභාවයත් නාගරික කම්කරුවාගේ පීඩනයත් පුද්ගල ත්‍රස්තවාදය ප්‍රතික්ෂේප වීමත් මාක්ස්වාදී අදහස්වල ව්‍යාප්තියත් ආදි කාරණා ගණනාවක් පදනම් කරමින් වර්ෂ 1898 දී නව දේශපාල ව්‍යාපාරයකට අත්තිවාරම් වැටුණි. එය රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂය විය. මේ හා සමගාමීව තවත් විප්ලවීය රහස් සංවිධාන ගණනාවක් රුසියාව තුළ බිහි වී තිබුණි.

## හරි මඟට වැටීම

වර්ෂ 1898 දී බිහිවුණු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂය එහි දෙවන සමුළුවේදී කොටස් දෙකකට වෙන්විය. පක්ෂයේ සංවිධාන ප්‍රතිපත්ති පිළිබඳව ඇති වූ මතවාදී අරගලයේදී දියාරු සංවිධාන ආකෘතීන් පිළිගත් කණ්ඩායමෙන් වෙන්වූ ලෙනින් සහෝදරයා ප්‍රජාත්ත්‍රවාදී මධ්‍යගතභාවය මත ගොඩනැගුණු දැඩි විනයක් සහිත සංවිධාන ස්වරූපයක් වෙනුවෙන් පෙනී සිටියේය. මෙසේ වෙන්වූ කොටස් දෙක බෝල්ෂවික් සහ මෙන්ෂවික් යනුවෙන් හඳුන්වන ලදී. (රුසියානු භාෂාවේ සරල අර්ථයෙන් ගත් විට බොල්ෂවික් යනු බහුතරයද මෙන්ෂවික් යනු සුළුතරයද වේ.) සැබැවින්ම ආරම්භයේදී ලෙනින් ප්‍රමුඛ බොල්ෂවිකයෝ මෙන්ෂවිකයන්ට සාපේක්ෂව ඉතා කුඩා පිරිසක් වූ අතර ජයග්‍රහණය තීරණය කරනු ලබන්නේ ප්‍රමාණය මත නොව නිවැරදි න්‍යායය හා භාවිතයට ගන්නාවූ ශක්තිමත් පක්ෂ සංවිධානයකින් බව බොල්ෂවිකයන් පසු කලෙකදී ඔප්පු කළහ.

**"ලෙනින් ඔහු සමඟ තව කොපමණ ජනකායක් ඇත්දැයි සැලකිලිමත් නොවීය. කලකදී ඔහු තනියෙන් නැගී සිටීමට පවා තර්ජනය කළේය. එහෙත් තමා වෙතට ගන්නේ, කරනට යන කාර්යය වෙනුවෙන් ජීවිතය වුවත් කැප කොට බහුතර ජනකායකගේ ප්‍රීති ඝෝෂා නොතකා ක්‍රියා කරන්නන් බව තරයේම පැවසුවේය. විප්ලවය පිළිබඳ ව්‍යාපාරය නියම වශයෙන්ම දියුණු කළ හැකි විශේෂඥයන් ගෙන් යුත් මණ්ඩලයක් තැනිමට ඔහුට ඕනෑ විය. හුදු දයාවක් දක්වන්නවුන්ගෙන් හා ජයෙහි දී පමණක් එක්තැන් වන හිතවතුන්ගෙන් ඔහුට පළක් නොවිය. "-** (ශ්‍රී ජවහර් ලාල් නේරුගේ ලෝක ඉතිහාස සිහිවටන, පිට- 661)

## ජාතීන්ගේ සිරගෙය අභියෝගයට

කුඩා රාජ්‍යයන් තමන් වෙත ඇදා ගනිමින් අධිරාජ්‍යයක් ගොඩ නැගූ සාර් පාලනයේ හොට බිම ඇනෙනුයේ ජපානයත් සමග ඇති කරගත් ගැටුමත් සමගය. ආතර් නම් නැව් තොට අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් ජපානය සමග පැටළුනු සාර් පාලනය යුද්ධයක් දක්වා දිගහැරෙනු ලබන්නේ රුසියානුවන් විසින් තම හමුදා මැංචූරියා සහ කොරියා දෙසට විහිද වීමත් සමගය. රුසියාවේ අති බල සම්පන්නම නාවික හමුදාවද ජපානයට පහරදීමට ගොස් සමූලඝාතනයට ලක් විය. මෙම වටපිටාව හමුවේ ජපානය ඉදිරියේ දණ ගැසීමට මහා බල සම්පන්න රුසියන් අධිරාජ්‍යයට සිදු වීම හේතුවෙන් සාර් පාලනයේ අභිමානය බින්දුවටම වැටුණි.

## ඇතුළත් ගිනි

විදේශයන්හි දී ලැබූ යුධමය පරාජයන්ගේ බර පැන දැරීමට සිදුවූයේ රුසියන් ජනතාවටය. තමන් විඳිමින් සිටින පීඩනයට අමතරව විඳින්නට සිදුවන පීඩනය හේතුවෙන් සාර්ට එරෙහිව කම්කරුවන්, ගොවීන්, ශිෂ්‍යයන් සහ බුද්ධිමතුන්ගේ විරෝධය උත්සන්න විය. නාගරික කම්කරු ජනයා තම විරෝධය වැඩවර්ජන, කර්මාන්ත ශාලා තුළ සිදුකරන අරගල තුළින්ද ගොවි ජනයා ඉඩම් හිමියන්ට එරෙහිව කැරලි ගසමින්ද ප්‍රකාශයට පත් කරන ලදී.

මේ අතර 1905 ජනවාරි 22 දා 'ගැපොන්' නම් පූජකයෙකුගේ නායකත්වය යටතේ කම්කරුවෝ දහස් ගණනක් පෙළපාලියකින් තමන්ගේ දුක් ගැනවිලි සඳහා පිහිටක් ලබා ගැනීමට සාර් රාජ මාළිගාවට ගියහ. සාර් ඒ සැමොටම උණ්ඩවලින් පිහිට විය. දෙසීයකට අධික පිරිසක් ඝාතනයට ලක් වූ අතර මුළු පිටර්ස්බර්ග් නගරයම ලෙයින් තෙත් විණි. මෙය සිද්ධිය රට පුරාම පැතිරෙන්නට පටන් ගැනීමත් සමග සාර්ට එරෙහි කම්කරුන්ගේ වැඩ වර්ජන, ගොවීන්ගේ සහ අනෙකුත් කාණ්ඩායම්වල කැරලි ගැසීම් උත්සන්න වුයේය. මෙම සිද්ධියට අදාළ දිනය පසුව ලෝහිත ඉරිදා නැතහොත් 'ලේ වැකි ඉරිදාව' (Bloody Sunday) වශයෙන් ප්‍රකට විය.

**"එදින සුර ලෝකයේ මා - පියාණන් වහන්සේ ගේ පුත් සුළු පියාණන් වහන්සේ ගෙන් පාන් කැබෙල්ලක් ඉල්ලා ගනු පිණිස පූජකයෙකුගේ පුරෝග ාමීත්වයෙන් රජ මාළිගාවට ගිය සාමකාමී පෙරහැරක් සාර්ගේ රකුස් බල ඇණි විසින් දරුණු - අති දරුණු - මරණ බන්ධනයට පත් කරනු ලැබීය. මෙම භයංකර අනුවේදනීය - පුවත රට පුරා ලැව් ගින්නක් ලෙසින් පැතිර ගිය අතර දේශපාලන වැඩ වර්ජන රාශියක් ඇති විය. අවසානයේදි රුසියාව පුරාම සමස්ත මහා වැඩ වර්ජනයක් ඇරඹිණ."-** ශ්‍රී ජවහර් ලාල් නේරුගේ ලෝක ඉතිහාස සිහිවටන, පිටුව 662

## දේශපාලන පෙරළියක්

විදේශයන්හිදි සිදුවූ යුධමය පරාජයන් හමුවේ සාර් පාලනයේ අභිමානය බිඳ වැටීමත් එම පරාජයන් හේතුවෙන් ජනතාව මත හෙළන ලද පීඩනය වැඩි වීමත් එම පීඩනයට එරෙහිව ජනතාව අරගල කිරීමත් ගොඩනැගෙ මින් පවතින ධනවාදයට ඉඩ දී වැඩවසම් පාලනය අභාවයට යෑමේ සමාජමය වුවමනාවත් ආදී කාරණා පෙළ ගැසීම හේතුවෙන් රුසියාව තුළ දේශපාලන පෙරළියක් සිදුවීමට තරම් වාස්තවික තත්වයක් නිර්මාණය විය.

රුසියාව තුළ ගොඩනැගුණු මෙම තත්වය කළමනාකරණය කර ගනිමින් නිර්ධන පංතිය අතට රාජ්‍ය බලය ලබා ගැනීමට සමාජ ප්‍රජාතන්ත්‍රවාදි කම්කරු පක්ෂය විසින් සැලසුම් සකස් කරන ලදී. විශේෂයෙන්ම ලෙනින් සහෝදරයා ඒ මොහොතේ විය හැකිව තිබූ ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය නිර්ධන පංතියේ වුවමනාවට සම්බන්ධ කර ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය සමාජවාදී විප්ලවය දක්වා පරිවර්තනය කිරීම අරමුණු කර ගනිමින් නව වැඩපිළිවෙළක්ද පක්ෂයට යෝජනා කරමින් අනුමත කරගන්නා ලදී.

**"සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් වන අප, ධනපති ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවවාදීන්ගෙන් ස්වාධීනව කටයුතු කිරීමෙහි සමත් වෙමු. එසේ කටයුතු කළ යුත්තෙමු. අපි ඔවුන්ගෙන් නිර්ධන පංතියේ පංති ස්වාධීනත්වය ආරක්ෂා කළ යුත්තෙමු. එහෙත් කැරලි ගසමින් නැගී සිටින අවස්ථාවේදී, සාර්වාදයට විරුද්ධව එක එල්ලේම පහර ගසන අවස්ථාවේදී, යුද්ධ හමුදාවන්ට ප්‍රතිවිරෝධය දැක්වීමේදී, සමස්ත රුසියානු ජනතාවගේම සතුරන්ගේ බැස්ටීල් බලකොටුව බිඳ හෙළද්දී අපි ඔවුන් සමග අතිනත ගෙන යා යුත්තෙමු."** ලෙනින් - තෝරාගත් කෘති, 03 වෙළුම, 12 පිටුව

එසේම රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂය නාගරික කම්කරුවන් ගැවසෙන ප්‍රදේශයන්හි සංවිධාන ඇති කරමින් සාර් පාලනය පෙරළා දැම්මේ කටයුතුවලට අවතීර්ණ විය. විශේෂයෙන්ම පීටර්ස්බර්ග් සහ මොස්කව් යන ප්‍රධාන නගරයන්හි වඩා ශක්තිමත් සංවිධාන ගොඩ නගමින් කටයුතු කිරීමට ප්‍රජාත්ත්‍රවාදී පක්ෂයට හැකි විය. මෙම කම්කරු විරෝධතාවල ප්‍රබලත්වය හේතුවෙන් සාර් පාලනය අඩියක් පිටුපසට ගෙන කිසියම් ප්‍රතිසංස්කරණ කිහිපයක් කිරීමට එකඟතාවය පළ කළේය. එහෙත් එම සහන තාවකාලික ඒවා විය. පසුව විප්ලවකාරී සංවිධානයන්ගේ දුර්වල

> පීටර්ස්බර්ග් සහ මොස්කව් යන ප්‍රධාන නගරයන්හි වඩා ශක්තිමත් සංවිධාන ගොඩ නගමින් කටයුතු කිරීමට ප්‍රජාත්ත්‍රවාදී පක්ෂයට හැකි විය. මෙම කම්කරු විරෝධතාවල ප්‍රබලත්වය හේතුවෙන් සාර් පාලනය අඩියක් පිටුපසට ගෙන කිසියම් ප්‍රතිසංස්කරණ කිහිපයක් කිරීමට එකඟතාවය පළ කළේය.

15වැනි පිටුවට



''කොමියුනිස්ට් පක්ෂ තමන්ගේම රටවල පමණක් නොව, යටත් විජිත රටවලද, විශේෂයෙන්ම, යටත් විජිත ජනතාව යටපත් කර තැබීම සඳහා සූරාකන ජාතිය යොදා තිබෙන හමුදා අතරද විප්ලවවාදී වැඩ කිරීමේ වැදගත්කම ගැන මම අවධාරනය කරනු කැමැත්තෙමි.''

**ලෙනින්**
**තෝරාගත් කෘති**
**වෙළුම 11 පිටුව 55**

## කවුළුව හැර තබමි

# රාජ්‍ය ඉස්කාගාරය




අද ලංකාවේ පාර්ලිමේන්තුව කියා එකක් නැත. ඒ වෙනුවට දියවන්නාව මැද තිබෙන්නේ ඉස්කාගාරයකි. අප මෙසේ කියන්නේ ඇයි? පසුගිය දිනවල පුවත්පත් වාර්තාවල පළවූයේ පාර්ලිමේන්තු මැති ඇමතිවරුන්ගෙන් සියයක වැඩි ප්‍රමාණයක් බාර් අයිතිකරුවන් කියාය. ඔවුන්ගෙන් සමහරුන්ට බාර් දහය, පහළොව තිබේ. ඒ අනුව රටේ පාර්ලිමේන්තුවට සුදුසුම නම රාජ්‍ය ඉස්කාගාරය යන්න යෝජනා කිරීම ප්‍රායෝගිකය. එක්කෝ මේ රටේ ජනයාට පිස්සුය. නැතිනම් ඔවුන්ගේ හිතන මතන ඉන්ද්‍රියයන් නිෂ්ක්‍රීය වී ඇත. ඒ මත් වී වැඩිකම නිසාදැයි අපි නොදනිමු.

රටේ මාධ්‍යවලින් රට ගැන හිතන උගතුන් බුද්ධිමතුන් ජනතා නියෝජිතයින් ලෙස පාර්ලිමේන්තුවට යැවිය යුත්තේ කෙබඳු අයද යන්න පුන පුනා පෙන්වා දෙද්දීත් රටේ ඡන්දදායකයා පාර්ලිමේන්තුව පුරවන්නේම සල්ලාලයන්, දූෂිතයන්, බේබද්දන්, අපරාධකරුවන් වැනි සමාජ විරෝධීන්ගෙනි. එක්කෝ රටේ ජනයාට හොරුන්, දූෂිතයින්, අපරාධකරුවන්, මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් පෙනෙන්නේ තම අවශ්‍යතා ඉෂ්ට සිද්ධකර දෙන දෙවිදේවිතාවුන් ලෙස විය හැක. නැතිනම් අර පාර්ලිමේන්තුවේ ඉන්න බාර් කාරයන්ගේ බාර්වලින් සූර්වී යන එන මං සොයා ගැනීමට නොහැකි නිසා විය යුතුය. නියම ජනතා නියෝජිතයින් වෙනුවට ලයිසන් බාර්කාරයන් පාර්ලිමේන්තුවට තෝරා යවන්නේ ඒ නිසා විය හැක. මෙහෙම ගියොත් රටේ අන්තිමට ඉතිරි වන්නේ රාජ්‍ය ඉස්කාගාරයත් ඉන් බී මත් වී තැන තැන වැටී ඔල්මාද කෙලින පුරවැසියනුත් ඉන් තරවන බාර් මුදලලිලාත් පමණි.

# අප්‍රේල් විරුවන් සහ ප්ලාස්ටික් විරුවන්

බ්‍රිතාන්‍යයේ ධනේශ්වර විප්ලවය සිදුවූයේ ඔලිවර් ක්‍රොම්වෙල්ගේ නායකත්වයෙනි. එහෙත් එය කිසිම වැදගැම්මකට නැති දෙයක් ලෙස බ්‍රිතාන්‍ය ධනේශ්වර පංතිය සැලකීය. ඔවුන්ට අනුව බ්‍රිතාන්‍යයේ සිදු වූ 'ශ්‍රේෂ්ඨ' විප්ලවය එය නොව චාර්ල්ස් රජුගේ හිස ද ගසා දැමීම හේතුකොටගෙන බලයෙන් චුත වූ රජ පරපුර යළි තහවුරු කළ 1688 නැවත රාජ ප්‍රතිෂ්ඨාපනයයි. ඔවුන්ට අනුව වීරෝදාර විප්ලවය පාර්ලිමේන්තු බලය තහවුරු කළ ක්‍රොම්වෙල්ගේ විප්ලවය නොව එය තව සියවස් දෙකකටත් වඩා කල් දැමුවාවුත් වැඩවසම් රාජ්‍යත්වය නැවත ස්ථාපිත කළ 'විප්ලවය'යි. මෙහි හාස්‍යමජනක කාරණය නම් බ්‍රිතාන්‍ය ධනේශ්වර පංතිය එය 'කීර්තිමත් විප්ලවය' ක් ලෙස හැඳින්වීමයි. (Glorious Revolution) ඊට සහභාගී වුවන් ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ විරුවන් ලෙස හැඳින්වීමයි.

ලෝකයේ බොහෝ විට සිදු වී ඇත්තේ පරණ කුණුගොඩ ආරක්ෂා කරනවුන් වීරයන් කිරීම මිස එය ඉවත් කරන්නට සටන් වදින වුන් වීරයන් සේ සැලකීම නොවේ.

අප රටේද විරුවන් ලෙස නාමකරණය කළ පිරිස් බොහෝ වෙති. රණවිරුවන්, රට විරුවන්, තරු විරුවන්, ආදී ලෙස ඔවුහු විවිධ වර්ගවලට අයත්ය. එහෙත් එතෙක් මෙතෙක් රට පාලනය කළ පාලකයන් ගොඩ ගසා තිබූ දුගඳ හමන පැරණි කුණු කන්ද ඉවත් කිරීමට සටන් වැදුණු ඉතිහාසයේ සැබෑ විරුවන් විරුවන්සේ සලකන්නේ රටේ කීයෙන් කී දෙනාද? 71 දීත් 89 දීත් ඔවුන් කියාදුන් ඓතිහාසික පාඩම තේරුම්ගෙන



ඇත්තේ කීයෙන් කී දෙනාද? එහෙත් පවතින කුණුවුණු ලෝකය වෙනුවට සුවඳ හමන අලුත් ලොවක් බිහි කිරීමට සටන් වැදුණු ඉතිහාසයේ සැබෑ මිනිස් විරුවන්ගේ නාමය ලේ ගංගාවක ගිල්වා වුවද මකා දැමිය නොහැක. මෙවර අප්‍රේල් විරුවන් යනු පැරණි කුණුගොඩ ඉවත්කර සමාජයක් වෙනස් කිරීමට, අලුත් කිරීමට සටන් සටන් වැදුණු විරුවන් මිස තිබෙන කුණුගෙ ාඩ බදාගෙන එයින්ම යැපෙන පරපුටු පරපුරකට අයිති වුවන් නොවේ. ඔවුන් උත්තරාරෝපිත ප්ලාස්ටික් විරුවන් නොවේ. පීඩාවේ පතුලෙන්ම උපන් සැබෑ විරුවන්ම වන්නේය.

# බදුම ගහපිය - බදුම කාපිය




මෛත්‍රී - රනිල් ආණ්ඩුව දිනපතා ගසන බදු නිසා රටේ ජනයාගේ ඉහමොළ මේ දිනවල පවතින නියඟය නිසාවටත් වඩා රත් වී තිබේ. ඊයේ පෙරේදා ජනයාගේ හිස මතට පාත් වූ අලුත්ම බදු හෙණ ගෙඩිය පාන් පිටි මිල සහ පාන්ගෙඩියේ මිල ඉහළ දැමීමය. මේ වන විට ලෝක වෙළඳපොළේ තෙල් මිල මෙන්ම තිරිඟු මිලද සීග්‍රයෙන් පහත වැටෙමින් තිබෙන බව වාර්තා වේ. ලෝක වෙළඳපොළේ මිල වැඩිවන විට මිල ඉහළ දැමීමට වලංගු තර්කයක් හැදිය හැකි වුවද මිල ගණන් සීඝ්‍රයෙන් පහත යන විටද මිල ඉහළ දැමීමට තර්ක හදා ගැනීමට තරම් සූර පාලකයන් පිරිසක් අප රටේ සිටිති. මෛත්‍රී - රනිල් ආණ්ඩුවේ මුදල් ඇමතිවරයා පවසන්නේ ලෝක වෙළඳපොළේ කොතරම් මිල ගණන් පහළ ගියත් එහි වාසිය රටේ ජනයාට ලබාදීමට නොහැකි වී ඇත්තේ කලින් සිටි මහින්දගේ ආණ්ඩුව ගත් ණය සහ කළ නාස්තිය කියවා ගැනීමට සිදුවීම නිසා මේ තත්වය උදා වී ඇති බවයි. මහින්ද රටේ මුදල් කාබාසිනියා කළා නම් දඬුවම් දිය යුත්තේ මහින්ද ප්‍රමුඛ නඩයටය. එහෙත් දැන් මෛත්‍රී - රනිල් ආණ්ඩුව ඒ වෙනුවට දඬුවම් දෙන්නේ රටේ ජනයාටය. 'මහින්ද රට කෑව නම් තොපි එහි පරිප්පුව කාපල්ලා' මේ වත්මන් ආණ්ඩුව රටේ ජනයාට දෙන පණිවුඩයයි. චූදිතයා පසෙක සිටියදී පැමිණිලිකරුට දඬුවම් දීමත් අපරාධකරුවා පසෙක සිටියදී ඉන් අගතියට පත් පාර්ශවයට දඬුවම් දීමත් ලංකාවේ සාමාන්‍ය සම්ප්‍රදාය වී තිබේ. සියල්ල මහින්ද ආණ්ඩුව පිට දමා ජනයාගේ ගෙල මිරිකීම මේ ආණ්ඩුවේ අලුත්ම සූදුවයි. අපට තිබෙන ප්‍රශ්නය නම් මෙවැනි පාලනයක්, පාලකයන් තවදුරටත් රටේ ජනයා ඉවසා වදාරන්නේ ඇයිද යන්නය.

# පොලිටිකල් පංතිය

පොලිටික්ක ටික දවසක් ආපු නැති හින්ද ළමයි පීරියඩ් එක පටන් ගන්න බෙල් එකට ඩෙස්ක්වලට ඔළුව තියාගත්ත නිදාගන්න.

"ගුඩ් මෝනිං ළමයිනේ" අඩ නින්දෙ හිටපු මංජුවට හීනෙන් වගේ ඇහුණ.

"ගුඩ් මෝනිං සර්" පුරුදු හඬකට මංජුව හීනෙන්ම උත්තර බැන්ද.

"මොකද ඔය ළමයි හර්තාල්ද කඩේ වහල ඉන්නෙ?" පොලිටික්ක සද්දෙට ඇහුවෙ හම් මල්ල මේසෙ උඩට දාන ගමන්.

"හර්තාල්...කොහෙද සර් කඩ වහල තියෙන්නෙ?" කනිය උඩ විසිවෙලා ඇහැරුණා. "ඒයි සර් ඇවිල්ල නැගිටපල්ලා..." පංතියෙ සෝෂක තනතුරත් කනියට.

"කොහෙවත් හර්තාල් නෑ...මම ඇහුවෙ ඔය ළමයි නිදි මොකද කියල?" පොලිටික්ක ඇහුවෙ ෂේප් එකට.

"අපි හොඳ අවදියෙන් සර්" මංජුව කොණ්ඩෙ බම්ප් එක හදන ගමන් කිවුව.

"ඇයි සර් අද ආවෙ..." තාමත් නිදිමතේ හිටපු කනියට ඇත්තම කියවුණා. "නෑ...නෑ සර්, ඇයි පහුගිය දවස්වල ආවෙ නැත්තෙ?" ළමයින්ට හිනා යන අතරෙ කනිය ප්‍රශ්නෙ සංශෝධනේ කළා.

"ළමයිනේ මං හිටියෙ වැඩ ගොඩ...ක" පොලිටික්ක ඇදල කිවුවෙ වැඩේ ලොකු කරන්න. "ඒකයි එන්න බැරිවුණෙ..." පොලිටික්ක ෂේප් න්‍යායට ගියේ ළමයින්ටත් මල පැනල ඇති කියල හිතාගෙන.

"මොනාද සර් ඔච්චර වැඩ?, මහින්ද මහත්තයටත් මූදෙ පීනන්න වෙලාව තියෙන එකේ." මංජුව දැලි පිහි පාරක් ඇරියා.

"මහින්ද මහත්තයට තියෙන්නෙ කතා කරන්න විතරනෙ. අපි එපායෑ වැඩේ අදින්න." පොලිටික්කට කියවුණේ හිතේ අමාරුවටම. "රැස්වීම් කරනව කියන්නෙ ස්වල්ප වැඩක්ද?"

"අමාරු රැස්වීම් කරන එකද සර්, පොල් ගහන එකද?" මංජුවත් අහන් නෑ කොක්කටම යනවා.

"ළමයෝ කොයි වැඩෙත් සංවිධානය කරන එක අමාරුයි. පොල් ගෙඩිය පොළේ ගහනව වගේ සරල නෑ" පොලිටික්ක උත්තර දෙන්නෙ ඉවසිල්ලෙ.

"පොල් ගහන්න දෙවියෙක් දේවාලයක් තොරගන්න එක තමයි වැඩේ." කනිය ඇහෙන නෑහෙන ගාණට කිවුව.

"පොල් 'කලටි පොල්' වෙන්නත් ඕනැ. කාන්තා දිනේනම් පත්තිනි දෙවියො වෙන්නත් ඕනැ." මංජුව හීනියට කිවුව පොලිටික්කටත් ඇහෙන්න.

"ඒ වුණාට වැඩේනම් ලොම් පොල්" සමනගේ කතාවට පොලිටික්ක කොර වුණා.

"ඇයි සමන් එහෙම කියන්නෙ? මිනිස්සු දෙයියන්ට දුක කියන එක වැරදිද?" පොලිටික්ක ලෝකෙ තියෙන අහිංසකම ප්‍රශ්නයක් ඇහුව.

"දෙවියන්ට පිං දෙන ගාථාවක්නම් පොඩි කාලෙ අහල තියෙනව... දුක කියන ඒවා අහල නෑ." චමියගෙ ප්‍රශ්නෙ ඇත්තටමද කිංඩියටද කියල තෝරගන්න කාටවත් බැරි වුණා.

"වෙනින් රටවල විපක්ෂෙන් රැස්වීම්, උද්ඝෝෂණ තියන්නෙ ආණ්ඩුව ගෙදර යවන්න. ඒත් මෙහෙ, ආණ්ඩුවට බලපෑම් කරල දූෂණ පරීක්ෂණ යටගහන්න. එෆ්සීඅයිඩී එක විසුරුවාගන්න. සමහරු දූෂණ පරීක්ෂණ නවත්ත ගන්න දේවාලවල මිරිසුත් අඹරනව... ලැජ්ජ නැතිකම 'මහ ඇමතිකමටත්' වැඩියි. දෙවියො ඇත්තටම ඒ දේවාලවල ඉන්නවනම් මේවට අපහාස නඩු දානව. මේ ඔක්කොම නාඩගම් වෙන මොනවටවත් නෙමෙයි, කවදහරි ඡන්දයක් එනකම් මිනිස්සු ටික තියාගන්න පුළුවන්ද බලන්න." සමනගෙ කතාවට පොලිටික්කගෙ කන් රතු වුණේ බලාඉන්නැද්දි.

## සමාජවාදය මේ බිමේ යථාර්ථයක්...

03 පිටුවෙන්



එම ජාතිවාදී මරුගුල්වල ගොදුරු බවට පත් වුණේ නැහැ. ඒ සඳහා ෆේස්බුක් වැනි සමාජ මාධ්‍යය හරහා ඔවුන් විශාල දායකත්වයක් දැක්වූවා.

නමුත් ඒ ක්‍රියාකාරීත්වයේ නිවැරදි කෙළවර සොයාගන්න ඔවුන්ගෙන් සමහරෙකුට හැකියාවක් තිබුණෙ නැහැ. උදාහරණයක් විදියට ගත්තොත් මහින්ද රාජපක්ෂ ගෙදර යවන සටනේ පුරෝගාමී කොටස්කරුවන් වූ ඔවුන් ඉන්පසු ගත යුතු දේශපාලන තීන්දු තීරණ පිළිබඳව හොඳම අවබෝධයකින් ක්‍රියා කළේ නැහැ කියලයි අපි හිතන්නේ. ඒ මොහොතේදී අපි පැහැදිලිවම කිව්වා රාජපක්ෂ අනිවාර්යයෙන්ම ගෙදර යැවිය යුතුයි කියල. එසේම අනතුරුව එළැඹුණු පාර්ලිමේන්තු මැතිවරණයේදී ජනතා විමුක්ති පෙරමුණට වැඩි බලයක් දියයුතුයි යන්නත් අවධාරණය කළා. නමුත් අද ඒ ඉල්ලීම සම්පූර්ණ නොකිරීමේ ප්‍රතිඵල රටක් විදියට අපි හැමදෙනාටම භුක්ති විඳින්න වෙලා තිබෙනවා. අපි විශ්වාස කරනවා දැන් ඔවුන්ද මේ තත්වය ඉතා වේගයෙන් තේරුම් ගනිමින් සිටින බව. ඒ වගේම අපි බලාපොරොත්තු වෙනවා ඔවුන්ද මේ ගමනට ඉදිරියේදී අපත් සමඟ එක් වෙයි කියලා.

***නියමුවා:- ධනපති පාලකයින් ආර්ථික අර්බුදයෙන් අත්මිදීම සඳහා ජනතාවගේ සහයෝගය ඉල්ලා සිටින කාලයක සමාජවාදී තරුණ සංගමය තරුණ පරම්පරාව සමාජවාදය වෙනුවෙන් පෙළගැස්වීමේ අභියෝගයට සූදානම්ද?***

***එරංග සහෝදරයා:-*** 67 අවුරුද්දක් තිස්සේම රජේ රට ගමන් කළේ අර්බුදයේ දිශානතියටයි. ඒ ධනවාදය තුළ වන කටුක බව පිළිබඳව වන අමිහිරිතම සත්‍යයන්ද ඒත්තු ගන්වමිනුයි. අපි දන්නවා ධනවාදය බිහිවන්නේම දේපළ හිමි පන්තිය සහ අහිමි පන්තිය යනුවෙන් බෙදීමක් සහිතවයි. එයයි ධනවාදයේ මූලික හරය. ඒ තුළ එක් පන්තියක් පීඩාවට පත් වීම අනිවාර්යයක්. මෙවන් තත්වයක් යටතේ තවදුරටත් ඔවුන් සහ ඔවුන්ගේ මේ ධනපති ක්‍රමය විසින් ජනතාව වෙනුවෙන් කටයුතු කිරීම පිළිබඳව බලාපොරොත්තු වීම විහිළුවක් පමණයි. එසේනම් අපේ ජීවිත විහිළුවට ගැනීමට ඉඩ තබනවාද යන්න තාරුණ්‍යය හමුවේ පවතින ප්‍රශ්නයක් බවයි අප සිතන්නේ.

ඉතිහාසයේ පටන්ම එකිනෙකාට වරද පටවා ගනිමින් නිල් කොළ ආණ්ඩු හැම එකක්ම පාහේ කළේ තාරුණ්‍යය මුළා කළ එකයි. අද වර්තමාන මෛත්‍රී - රනිල් හවුල් ආණ්ඩුව විසින් කරන්නේද එයමයි. පෙර පාලනයන් පරිද්දෙන්ම අද ඔවුන්ද ජනතාවගේ අයිතීන් උල්ලංඝනය කරමින් සිටිනවා. ජනතාවට පටි තද කරගන්න යැයි කියමින් ඩීල් දේශපාලනයක නියැලෙනවා.

ඒ නිසා සමාජවාදී තරුණ සංගමය ලෙස අපේ රටේ තාරුණ්‍යයට අපි කියන්නේ එකම දෙයයි. අවුරුදු 67 ක් පුරා ඔබේ දෙමව්පියන් විසින් මේ ධනපති දේශපාලන පක්ෂ සියල්ලම වෙන වෙනමත් අද එක්වත් පාලන බලයට ගෙනවිත් ඔවුන්ගේ අසාර්ථකත්වය අත්විඳිමින් සිටිනවා. එවන් පසුබිමක් යටතේ අප කවුරුත් තේරුම් ගත යුතු වන්නේ, එදා සිට අද දක්වාමත් අනාගතයේදීත් ධනවාදය තුළ මේ ආර්ථික අර්බුදයට හෝ ජනතාව පෙළෙන ජීවන ගැටලුවට පිළිතුරු නොමැති බවයි. ඒ නිසා පාලකයින්ගේ පුහු පොරොන්දු හා ප්‍රෝඩාවන්ට හසු නොවිය යුතු බවයි.

අපි විශ්වාස කරනවා අපේ රටේ තාරුණ්‍යයට සටන් දෙකක් තිබෙන බව. එක් අතකින් තාරුණ්‍යයේ අයිතිවාසිකම් දිනා ගැනීම වෙනුවෙන් අද කළ යුතු සටනක් තිබෙනවා. ඒ වගේම අපේ රටේ තාරුණ්‍යයට තමන්ගේ ජීවිතය සහ අනාගතය වෙනුවෙන් සමාජවාදය මේ බිමේ යථාර්ථයක් බවට පත් කිරීම වෙනුවෙනුත් සටනක් තිබෙනවා. ඒ වෙනුවෙන් ඔබ එක්විය යුතුයි. ඒ සඳහා ඔබට ශක්තිය සහ නායකත්වය සැපයීමට සමාජවාදී තරුණ සංගමය ලෙස අප ඉතා වුවමනාවෙන් කැප වීමට සූදානම්. රටේ අනාගතය වන තාරුණ්‍යය නියෝජනය කරන ඔබ ඔබේත් රටේත් අනාගතය වෙනුවෙන් වන එම යුතුකම ඉටුකිරීම සඳහා අප හා දැඩිව අත්වැල් බැඳගනු ඇතැයි අපි හැමවිටම විශ්වාස කරනවා.

## පොහොර සහනාධාර..

12 පිටුවෙන්

කපන ආණ්ඩුවට ඒ පිළිබඳව මෙතෙක් විද්‍යාත්මකව තහවුරු කළ මතයක් නොමැත. විටෙක වෙල් මාළුද විටෙක නෙළුම් අලද විටෙක ග්ලයිපොසෙට්ද තවත් විටෙක රසායනික පොහොරද පෙන්වන ආණ්ඩුව සිය සහනාධාර කප්පාදු ආර්ථික උපාය මාර්ගය වෙනුවෙන් මේ සියල්ල උපයෝගී කර ගනී. කැඩ්මියම් ඇතුළු බැර ලෝහ මේ සඳහා බලපාන බවට පවසන මොවුහු රසායනික පොහොරවලට විරුද්ධ වුවද නොරෙච්චෝලේ සහ සාම්පූර් ගල් අඟුරු බලාගාර පිළිබඳව අංශුමාත්‍රයක් හෝ කතා නොකරති; එයින් පිටවන අළු තුළ ඇති බැර ලෝහ මුළු පරිසරයම විනාශ කිරීම පිළිබඳව මුනිවත රකිති.

පොහොර සහනාධාරය කපා දැමීම සැබෑ ලෙසම ගැට ගැසී ඇත්තේ, රනිල් වික්‍රමසිංහගේ මධ්‍යකාලීන ආර්ථික ප්‍රතිපත්තිය සමඟය. එනම් නිෂ්පාදනය වෙනුවට විදේශ ආයෝජකයන් මත රට ගොඩ නැගීම ඔවුන්ගේ ප්‍රතිපත්තියයි. එලෙස පැමිණෙන විදේශ ආයෝජකයන්ට ආයෝජන සඳහා ඉඩම් අවශ්‍ය වේ. ජනතාව අමතක කොට ආයෝජකයන් වෙනුවෙන් මූලික ප්‍රතිපත්ති වෙනස් කරන ආණ්ඩුව රටේ ප්‍රාග්ධන ගිණුම විවෘත කොට හමාරය. ඉඩම් ප්‍රතිපත්තියෙහි බාධා ඉවත් කොට ආයෝජකයන්ට ගැලපෙන සේ සකස් කිරීම අරඹා ඇත. එහෙත් ඒ සඳහා ඉඩම් අවශ්‍යය. ගොවියාගේ වත්කම ඉඩමයි. එම ඉඩම අත්පත් කර ගැනීමට නම් ගොවියාට ගොවිතැන එපා කර විය යුතුය. විකිණිය හැකි ඔප්පුවක් ලබා දීම, සහනාධාර කප්පාදුව, නිෂ්පාදන පිරිවැය ඉහළ දැමීම, ආදායම පහළ දැමීම, ඒ තුළින් ගොවියාට ගොවිතැන එපා කරවීම, ගොවිතැන එපා වූ ගොවියාගේ ඉඩම සමාගම් වෙත විකිණීම, ගොවියා තම ඉඩමේම කම්කරුවෙකු ලෙස සමාගමට ශ්‍රමය විකිණීම රනිල් - මෛත්‍රී ආණ්ඩුවේ ආර්ථික ප්‍රතිපත්තියේ කෙළවරය. එය සෙවණගල, පැල්වත්ත, හිඟුරාන, උක් ගොවියාට සිදුව ඇති ඉරණමට වඩා බේදවාචකයක් වනු ඇත.

එය පරාජය කළ යුතුය. එසේම එය පරාජය කළ හැකිය. එය ගොවි ජනතාව නැවත වතාවක් ඔප්පු කරමින් සිටිති. 3500කට ඉහල දැමූ පොහොර මිල රු.2500 දක්වා අඩු කර ගැනීම, පොහොර සහනාධාරය හෙක්ටයාර 01 සිට 02 දක්වා ඉහළ නැංවීම, එළවළු, අතිරේක බෝග, තේ, රබර්, ඇතුළු අනෙකුත් වගාවන් සඳහාද සහනාධාරය දිනා ගැනීම, ඕනෑම බැංකු ගිණුමකට මුදල් බැර කර ගැනීමට හැකි වීම, ගොවියාගේ බැංකු ගිණුවේ 25% ක් රඳවා තබා ගැනීම අත්හිටුවීම, වැනි ජයග්‍රහණ රැසක් හිමිකර ගැනීමට හැකි වූයේ, ගොවි ජනතාවගේ අරගලය නිසාය. එසේ අරගල නොකළා නම් ආණ්ඩුව ගොවි ජනතාවට ලබා දීමට සූදානම් වූයේ මීට වඩා භයානක ඉරණමක් අත්කර දීමටය.

එහෙත් මෙම අතරමැද ජයග්‍රහණ ගොවියාට ප්‍රමාණවත් නොමැත. ගොවියාට සැබෑ ජයග්‍රහණයක් ලබා ගැනීමට නම් ආණ්ඩුවේ ආර්ථික උපාය මාර්ගය පරාජය කිරීම සඳහා වූ අරගලය සමඟ ඒකාබද්ධ විය යුතුය. ඒ, සඳහා ආණ්ඩුවේ 'සටන් පාඨ' පිටුපස ඇති 'දුෂ්ට වුවමනාවන්' හඳුනා ගෙන පරාජය කළ යුතුව ඇත.

## 1905: විප්ලවයේ..

13 පිටුවෙන්

අවස්ථා සොයමින්ද, රුසියන් දිළිඳු ගැමි ජනතාවගේ පසුගාමී බවද ප්‍රයෝජනයට ගනිමින් එම විප්ලවාදී කණ්ඩායම් හා පොදු ජනයා අතර නොයෙක් ගැටුම්කාරී තත්වයන් ඇති කිරීමටද, ජාතිවාදය අවුළුවමින් එක් එක් ජාතීන් අතර අසමගිය වැපිරීමටද සාර් පාලනය කටයුතු කළේය. ඒ ආකාරයට විප්ලවයට හිතකර අවස්ථා අහිමි කරමින් වඩාත් සක්‍රීය ලෙස ක්‍රියාත්මක වෙමින් තිබූ පීටර්ස්බර්ග් සහ මොස්කව් යන නගරවල මර්දනකාරීත්වය දියත් කිරීමට සාර් පාලනය විසින් කටයුතු කරන ලදී.

වාර්තා වන ආකාරයට මොස්කව්හි 1000ක් පමණ පුරවැසියන් කිසිදු වගවිභාගයකින් තොරව මරණයට පත් කර තිබේ. පුරවැසියන් 70,000ක් පමණ සිරභාරයට ගෙන ඇති අතර මේ කාලය තුළ මුළු රටේම 14,000ක් පමණ දෙනා ඝාතනයට ලක් වන්නට ඇතැයි පැවසේ.

ඒ අනුව 1905 දී සාර් පාලනයට එරෙහිව සිදුවූ ජනතා නැගිටීම අවසන් වූයේ පරාජයෙනි. අරගලය පරාජයට පත් වුවත් ඒ වෙනුවෙන් ජනතා දැක්වූ සක්‍රීය දායකත්වය සුළු කොට තැකිය නොහැකිය. මන්ද එම පරාජයේ අත්දැකීම් 1917 සිදුවූ සාර්ථක විප්ලවය සඳහා ඉමහත් පිටුබලයක් වූ බැවිනි. ලබන කලාපයෙන් අප ඒ පිළිබඳ සංවාදයකට යොමු වෙමු.

## හිල් අමුඩෙන්...

05 පිටුවෙන්



කර නොගෙන ඡන්ද කරන හැටි ජ.වි.පෙ. උගන්වා ඇති නිසාය. ආණ්ඩුවේ උත්සාහය ඡන්ද සටන සදාචාර සම්පන්න කිරීම නොව තමන්ට වාසි ඡන්ද ක්‍රමයක් හදා ගැනීමය. එය සාධාරණීකරණය කර ගැනීම අවශ්‍ය වන අතර ඒ සඳහා යොදා ගන්නේ "මනාප ක්‍රමයේ වැරැද්ද"ය. දේශපාලනයේ ගැඹුර නොදන්නා, පාලක පංතියේ කපටිකම් නොදන්නා, දේශපාලනයේ හොඳ සංස්කෘතියක් අපේක්ෂා කරන අපරිණත අයද ආණ්ඩුවේ මේ ගැටයට හසුවී මත පළකරනු පෙනේ. එහෙත් ආණ්ඩුව අලුත් ඡන්ද ක්‍රමයක් හදන්නේ ප්‍රජාතන්ත්‍රවාදය පුළුල් කිරීමේ අරමුණින් නොව එය හකුළා දැමීමේ තක්කඩි අරමුණෙන් බව පැහැදිලිය.

මේ සියලු කරුණුවලින් පෙනී යන්නේ, ආණ්ඩුව රාජ්‍ය පාලනයේ තම නොහැකියාවත් තම අර්බුදයත් වසා ගැනීමට සහ තමන් ගන්නා ජනතා විරෝධී ක්‍රියාමාර්ග සාධාරණීකරණය කර ගැනීමට කුමක් හෝ 'හේතුවක්' සොයා ඒ තුළ සැඟවීමට උත්සාහ දරන බවය. එහෙත් ආණ්ඩුව තම දුබලකමත් ජනතා ද්‍රෝහීකමත් වසාගැනීමට සොයා ගන්නා හේතු ශක්තිමත් ඒවා නොවේ. ආණ්ඩුව තම නොහැකියාවේ විළි වසා ගැනීමට සොයාගෙන ඇති ආවරණ ඊට ගැලපෙන ඒවා නොවේ. එය හිල් අමුඩෙන් විළි වසා ගැනීමට දරන අසාර්ථක උත්සාහයක් වන්නේ ඒ නිසාය. ව්‍යාජ හේතු තුළ සැඟවී තම සැබෑ නිරුවත වසා තවදුරටත් ජනතාව රැවටීමට ආණ්ඩුව දරන උත්සාහය වහාම පරාජය කළ යුතුය. මේ මොහොතේ කාගේත් වගකීම එයයි.

## රනිල්ගේ අර්බුදය...

09 පිටුවෙන්

කටින් පිටවන ප්‍රතිශතයේ අනුපාතය සාධාරණීකරණය කිරීමට දත්ත සකස් කරති. පසුගිය කාලය පුරා ලංකාවේ ආර්ථික වර්ධනයේ වේගය ගණනය කිරීමේදී පදනම් වර්ෂය ලෙස සැලකුවේ 2002 වසරයි. ජාත්‍යන්තර පිළිගැනීම අනුව 2008 ලෙස වසර 5කින් එම පදනම වෙනස් විය යුතු වුවද 2010 වනතුරුම එවැනි වෙනසක් සිදු නොකළ නිසා උද්ධමනයේ බලපෑම සහිත ඉලක්කම පදනම කරගෙන 8%ක් - 7.5%ක ආර්ථික වර්ධනයක් පෙන්වීමට ආණ්ඩුවලට පුළුවන් විය. නමුත් 2010 පදනම ලෙස සැලකූ විට සත්‍ය තත්වයට ආසන්න වර්ධන ප්‍රතිශතය දැන් හෙළිවී තිබේ. ඒ අනුව පිළිවෙළින් 2013 - 3.4%, 2014 - 4.46%, 2015 - 4.8%ක ආර්ථික වර්ධන වේගයක් ලැබී තිබේ. රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා 2016 වසර අභියෝගාත්මක අර්බුද සහිත වසරක් විය හැකියැයි පවසන්නේ 4.8%ක වර්ධනයේ සිටය. නමුත් රවි කරුණානායක මුදල් ඇමතිවරයාට අනුව 2016දී 5.3ක වර්ධනයක් අපේක්ෂා කෙරේ. පවතින යථාර්ථයට අනුව නම් එම 5.3%ක ඉලක්කය විස්මයක්ම විය යුතුය.

ආර්ථිකයේ අපනයන බිඳ වැටීමද එලෙසමය. වසර 2015දී දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස 27%ක් පැවැති අපනයන පිළිවෙළින් 2010 - 17%, 2012 - 16%, 2013 - 15% හා 2014 - 14% ක් දක්වා පහත වැටිණි. ලංකාවේ අපනයන ආදායම ගතවූ දශකය තුළදී දෙගුණයකින් කඩා වැටී ඇති බව මෙයින් පැහැදිලිය.

ආර්ථිකයේ දායකත්ව වර්ධනයද ඇත්තේ ඉතා පහළ මට්ටමකය. ආර්ථිකයට කෘෂිකර්මාන්තයේ දායකත්වයද 8.1%ක මට්ටමට පහළ වැටෙද්දී එම ක්ෂේත්‍රය 2015 වසරේදී වර්ධනය වී ඇත්තේද 8.1%කින් පමණි. සේවා පංගුව ආර්ථිකයේ 56.3% කින් නොවෙනස්ව පැවතියද එය පසුගිය වසරට සාපේක්ෂව වර්ධනය වී ඇත්තේ 6.3%කින් පමණි.

### ආර්ථිකය පහත දැමීම හා රට වැටීම

ඉහත සියලු කරුණු රටට වසන් කර ඉලක්කම් මැජික් වේදිකාවට කියා පෑමට ආණ්ඩුවේ දේශපාලකයින්ට පුළුවන් වුවද ලෝකයට සත්‍යය වසන් කළ නොහැකිය. ලංකාවට විදේශ රටවල් සහ ජාත්‍යන්තර මූල්‍ය ආයතන ණය දෙන්නේ රටකට ආදරයක් නිසා නොව ණය ගෙවීමට ඇති හැකියාවක් තිබේ නම් පමණි. ලංකාව ණය ගෙවීමේ හැකියාව නොමැති රටක් ලෙස මේ වනවිට පහත දමා ඇත. (Down Grading) (Fitch and S&P). ලංකාවේ දැන් තත්වය + B මට්ටමට ඇද දමා ඇත්තේ, ඉහත දත්ත ලංකාවේ ඡන්දදායකයාට වසන් කළද මූල්‍ය අරමුදල ඇතුළු ණය දෙන රටවලට වසන් කළ නොහැකි නිසාය.

### මහ බැංකු අර්බුදය

අගමැතිවරයා රටේ මූල්‍ය තත්වය පාර්ලිමේන්තුවට ප්‍රකාශ කරමින් කියන්නේ, රටේ අවදානම් මට්ටමක් ඇති නිසා ජනතාව පටි තදකර ගත යුතු බවය. එසේ නොවන්නේ නම්, තිත්ත බෙහෙත් දීමට සිදුවන බවයි. නමුත් ආර්ථිකය වැරදි ප්‍රතිපත්ති මත මෙහෙයවූ පාලකයින්ට හා නිලධාරින්ට තිත්ත බෙහෙත් දී හෝ ඔවුන් කළ කී දේ නැවත අයකර ගැනීමට ආණ්ඩුව අසමත්ය. 2014 වසරට පමණක් ලංකාවේ මහ බැංකුව සිදුකළ පොලී ගෙවීම්වල වියදම පමණක් රුපියල් බිලියන 17කි. (රුපියල් මිලියන 17,748) 2014 වසරේදී මහ බැංකුවේ පාඩුව රුපියල් බිලියන 32කි. (රුපියල් මිලියන 32,309) මහ බැංකුවක් ලාභ ලබන ව්‍යාපාරයක් නොවන බව පැහැදිලිය. නමුත් මෙතරම් විශාල මුදලක් පොලිය ගෙවමින් පාඩු ලබන්නේ මන්දැයි අපැහැදිලිය. ලංකාවේ ආර්ථිකය යනු පහසුවෙන් ජනතාවට බදු ගසා අයකර ගැනීම පමණක් නොව මේ සියල්ල මනා සැලසුමකට පාලනය කිරීම බව ආණ්ඩුව තේරුම්ගත යුතුය. එසේ කිරීමට අසමත්කමින් මුළු රටේම ජනතාව ණයකාරයින් කර ඇත්නම් එයින් පැහැදිලි වන්නේ, වත්මන් පාලකයිනුත් අතීත පාලකයිනුත් අනුගමනය කළ හා කරන ආර්ථික ප්‍රතිපත්ති තවදුරටත් ලංකාව දියුණු කිරීමට අදාළ නොවන බවයි. පාලකයින්ට ජනතාවගේ ප්‍රශ්න විසඳීමට තවදුරටත් උපායමාර්ග නැති බවය. තිබේ නම් ඒවා ජනතාවට අදාළ නොවන බව දැන් පැහැදිලිය. දැන් අවස්ථාව ඇත්තේ, ජනතාවටය. කිහිප වරක් බොරු පොරොන්දු දෙමින් ජනතාව රවටා බලයට පත් ධනපති පාලක පංතියට ඒ සුපුරුදු කාරියම කරගෙන යාමට ඉඩ දෙන්නේද නැද්ද තීරණය කළ යුත්තේ ජනතාවමය.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com




එට්කා පැරදවීමට ජනතාව දැනුවත් කරමින්





කම්බන් විලා සාහිත්‍ය උත්සවයේ ආරාධිතයෙකු ලෙස සහභාගි වෙමින්



වීවලට සහ සහල්වලට සහතික මිලක් ඉල්ලා අධිකරණයට පෙත්සමක් භාරදී...



ජනතා ගැටලු සොයා බලමින්...

## පාලකයින්ගේ වැරදි ආර්ථික ප්‍රතිපත්තිවල ප්‍රතිවිපාක ජනතාව භුක්ති විඳිය යුතු නැහැ!

### අනුර දිසානායක සහෝදරයා



රට රු. බිලියන 10,500ක් ණය කිරීමේ වගකීම ජනතාව භාරගත යුතු නැති බව අවධාරණය කරන ජනතා විමුක්ති පෙරමුණ එයට වගකිව යුතු වන්නේ රටේ පාලකයින් බැවින් එම පාලකයින්ට එරෙහිව ජනතාව ඉදිරියට ආ යුතු බව කියා සිටී.

පසුගිය 10වැනිදා ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවැත්වූ මාධ්‍ය සාකච්ඡාවකදී ජ.වි.පෙ. වෙනුවෙන් මෙම අදහස් පළ කළේ ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයාය.

මෙතරම් ආර්ථික අර්බුදයක් ඇති කළ බංකොලොත් ධනපති ආර්ථික ක්‍රමයට තවදුරටත් රටේ ආර්ථිකය ඉදිරියට ගෙනයාමට හැකියාවක් නොමැති යැයි පෙන්වා දුන් ඔහු, තමන් කිසිසේත්ම සම්මාදම් නොවූ ව්‍යසනයකට ජනතාව මුහුණ දිය යුතු නැති බව පැවසීය.

මේ තත්වය තුළ රටේ ජනතාව පළමුවෙන්ම රනිල් - මෛත්‍රී ආණ්ඩුවෙන් තමන් මත පටවා තිබෙන ආර්ථික පීඩනයට එරෙහිව සටන් කළ යුතුව ඇති බවත් දෙවනුව තවත් ඉදිරි පරම්පරාවක් ධනේශ්වර ආර්ථික ක්‍රමයේ ව්‍යසනයට ලක්වීමට ඉඩදෙන්නේද යන්න තීරණය කළ යුතුව ඇති බවත් ඔහු අවධාරණය කළේය.

"පසුගිය අවුරුදු 68ක්ම ක්‍රියාත්මක වුණේ එකම ආර්ථික ප්‍රතිපත්තිය. විකල්ප ආර්ථික ක්‍රමයක අවශ්‍යතාව තවදුරටත් ජනතාවගේ ඔළුවට, බඩට ඇණලා පෙන්වන්න ඕනෙ නැහැ. මේ ආර්ථික ක්‍රමයේ නොහැකියාව එදිනෙදා පෙන්වමින් තිබෙනවා. ආර්ථිකයේ මහ ලොකු ඔස්තාද්ලා කියපු, එජාප ආණ්ඩුවක් ආවාම සාක්කු පිරෙනවා කියපු, ආර්ථිකයේ පිම් පනිනවා කියපු මිත්‍යා මතය දැන් බිඳවැටී තබෙනවා. මහ ලොකුවට පම්පෝරි ගහපු මේ ආර්ථික විශේෂඥයින්ට මාස 03කට කලින් ආර්ථිකය පුරෝකථනය කරන්න බැරිවෙලා තිබෙනවා. දෙසැම්බර් මාසයේ ඉදිරිපත් කළ අයවැය මාස 03කින් වෙනස් කරනවා. ඒකෙන්ම පේනවා මේ ආණ්ඩුවේ ආර්ථික දැක්ම මොකක්ද කියලා. අනෙක් පැත්තෙන් මේ ආණ්ඩුව බදු හරහා ජනතාව විශාල 02 වැනි පිටුවට

## චෝදනා ඔප්පු වී අවසන් මහ ඇමති ඉල්ලා අස්විය යුතුයි

### ජ.වි.පෙ. ඌව පළාත් සභා කණ්ඩායම් නායක සමන්ත විද්‍යාරත්න සහෝදරයා



ඌව පළාත් මහ ඇමතිවරයා විසින් හිතාමතා පළාත් සභාවට මූල්‍ය පාඩුවක් සිදුකොට තිබෙන බවටත් සභාවේ ඒකමතික තීරණයක් නොතකා කටයුතු කර තිබෙන බවටත් බැංකුවලින් ලබාදුන් ආධාර මුදල් තමන්ගේ ගිණුම්වල තැන්පත්කොට තිබෙන බවටත් චෝදනා කළ ජ.වි.පෙ. ඌව පළාත් සභා කණ්ඩායම් නායක සමන්ත විද්‍යාරත්න සහෝදරයා අදාළ චෝදනා තුනම ඔප්පු වී අවසන් බැවින් මේ වන විට මහ ඇමතිවරයාට ඉතිරි වී ඇත්තේ මහ ඇමති ධුරයෙන් ඉල්ලා අස්වීම පමණක් බව කියා සිටියේය.

ඔහු මෙසේ කියාසිටියේ පසුගිය 25වැනි දින බත්තරමුල්ල, පැලවත්ත ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය සාකච්ඡාවකට එක්වෙමිනි.

"ඌව පළාත් සභාවේ මෙවැනි වංචාවන් දිගින් දිගටම සිදුවෙනවා. මෙම චෝදනාවල්වලට මහ ඇමතිවරයා උත්තර දෙන්නේ නැහැ. අධ්‍යාපන, මුදල්, නීති සහ ආරක්ෂාව බාර ඇමතිවරයා වන්නේ මහ ඇමතිවරයායි. මෙම විෂයය අයිති මහ ඇමතිවරයාට. චෝදනාවලට පිළිතුරු ලබා දෙනවා වෙනුවට ඔහු ගල් යුගයේ වැඩ කරනවා. දේවාලවලට ගිහිල්ලා මිරිස් අඹරනවා. අධ්‍යාපනය බාර ඇමතිවරයාගේ අධ්‍යාපන මට්ටම මොකක්ද කියලා මේවායෙන් තේරුම් ගන්න පුළුවන්. අපිට මිරිස් අඹරන්න, පොල් ගහන්න දේවාල ගානේ යන්න වෙලාවක් නැහැ. එනිසා මෙම වංචා-දූෂණවලට එරෙහිව නීතිමය පියවර ගන්න අපි බලාපොරොත්තු වෙනවා. අධිකරණ ක්‍රියාමාර්ගවලටත් යන්න බලාපොරොත්තු වෙනවා. ඒ වගේම මහා පරිමාණ මූල්‍ය විමර්ශන කොට්ඨාසයට පැමිණිලි කරන්න බලාපොරොත්තු වෙනවා.

දැන් ඔක්කොම හොරුටික දේවාල ගානේ යන්න පටන් අරගෙන. මේ හොරු ඔක්කොම දේවාලවලට යන නිසා දැන් දේවාලවල දෙවියනුත් නැහැ. පහුගිය කාලයේ අපේ රටේ ජනතාවට වගේම මේ දේවාලවලටත් දෙවියන්ටත් ප්‍රජාත්නත්‍රවාදය තිබුණේ නැහැ. පහුගිය කාලයේ ජනතා විමුක්ති පෙරමුණ අරගල කරලා තමයි ප්‍රජාතන්ත්‍රවාදය දිනා ගත්තේ. රාජපක්ෂ පාලනය කාලයේ දේශපාලන බලය පාවිච්චි කරමින් කතරගම දේවාලයේ බස්නායක නිලමේ ධුරය ශෂීන්ද්‍ර රාජපක්ෂ අයිතිකරගෙන තිබුණා. එනිසා කතරගම දේවාලය රාජපක්ෂලාගෙන් බේරා ගත්තේ අපි. ඒ නිසා දැන් දේශපාලනඥයින්ගෙන් දේවාල බේරගන්න වෙලා තිබෙන්නේ අපිටයි. දේවාලවල තිබෙන පිං කැට බේරගන්න සී.සී.ටී.වී. කැමරා හයි කරන්න වෙලා." සමන්ත විද්‍යාරත්න සහෝදරයා වැඩිදුරටත් පැවසීය.

## ආණ්ඩුව චූදිතයන් සමඟ දේශපාලන ඩීල් දමමින් ඉන්නවා

### ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා



පහුගිය කාලයේ සිදුවූ මූල්‍ය වංචාවන්ට, ඝාතන සිදුවීම්වලට චෝදනා ලැබූවන් ආරක්ෂා කරන ක්‍රමවේදයක් තිබෙන බවට සැකයක් ඇති බවටත් මේ සම්බන්ධයෙන් කඩිනම් පියවර ගන්නා ලෙස ආණ්ඩුවට දිගින් දිගටම බලපෑම් කරන බවත් පැවසූ ජ.වි.පෙ. ප්‍රචාරක ලේක්ම් විජිත හේරත් සහෝදරයා, ආණ්ඩුව චූදිතයන් සමග දේශපාලන ඩීල් දමමින් සිටින බවට චෝදනා කළේය. සජින් වාස් ගුණවර්ධනට එරෙහිව චෝදනා විශාල ප්‍රමාණයක් එල්ල වූ නමුත් ඔහු ආණ්ඩුවේ ඩීල් එකකට අනුව ඇප ලබාගනිමින් පොලිස් ආරක්ෂාවත් ඇතිව නිදහසේ සිටින්නේ ඒ නිසා යැයිද ඔහු කීය.

ඔහු මේ අදහස් පළ කළේ, පසුගිය 25වැනි දින පැවති මාධ්‍ය හමුවේදී මාධ්‍යවේදියෙකු නැගූ ප්‍රශ්නයකට පිළිතුරු දෙමිනි. "පසුගිය කාලයේ ඉදිරිපත්වුණු චෝදනාවලට අදාලව කරුණු අල්ලස් කොමිසමටත් එෆ්.සී.අයි.ඩී.යටත් අපි භාරදී තිබෙනවා. නමුත් විමර්ශන සිදු නොවීම සහ ප්‍රමාද වීම තමයි ගැටලු සහගත වෙලා තිබෙන්නේ.

පළාත් සභාවේ මෙම මූල්‍ය වංචාවට එරෙහිව මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මහ ඇමතිවරයාටත් වැඩ බලන ලේකම්වරයාටත් එරෙහිව මෙම නඩුව ගොනු කිරීමේ බලාපොරෙත්තුව පළාත් සභාවට අහිමි වූ මුදල් ඔවුන්ගෙන් අයකර ගැනීමයි. ඒ වගේම අල්ලස් පනතට අනුව 70වන වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් ඔවුන්ට එරෙහිව අල්ලස් හෝ දූෂණ කොමිසමට පැමිණිලි කිරීමටද අපි බලාපොරොත්තු වෙනවා." විජිත හේරත් සහෝදරයා වැඩිදුරටත් කීය.

මේ අවස්ථාව සඳහා ඌව පළාත් සභා මන්ත්‍රී ආර්.එම්. ජයවර්ධන සහෝදරයාද සහභාගි විය.

## පොහොර සහනාධාරය නොදුන්නොත් ගොවි බිම් සටන් බිම් බවට පත්වේවි

### ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා



ගොවීන්ට ගොවිතැන් කිරීම සඳහාත් අස්වැන්න අලෙවි කරගැනීම සඳහාත් පාරට බැසීමට සිදුවී තිබෙන බවට චෝදනා කළ ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා, මෛත්‍රී - රනිල් ආණ්ඩුව ගොවි ජනතාවගේ හඬට සවන් නොදෙන්නේනම් නිසැක ලෙසම ගොවි බිම් සටන් බිම් බවට පත්වනු ඇති බවට අනතුරු ඇඟවීය.

ඔහු මේ බව ප්‍රකාශ කළේ පසුගිය 03වැනිදා ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවේදීය. ආණ්ඩුවේ පොහොර සහනාධාර කප්පාදුව පිළිබඳව කරුණු දැක්වීම සඳහා පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවේදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා, පසුගිය කාලයේ සිට වර්තමානය දක්වාම ආණ්ඩු විසින් කෘෂිකර්මාන්තයට ලබාදෙන ප්‍රතිපාදන, සහනාධාර කප්පාදු කරමින් සිටින බවත් මේ තත්වය තුළ ගොවියා සතුටින් සිටිය යුතු අස්වැන්න නෙළන 02 වැනි පිටුවට





බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.